මිහින්තලය
නාගරික සංවර්ධන සැලැස්ම
2019 - 2030

පළමුවන වෙළුම



නාගරික සංවර්ධන අධිකාරිය
උතුරු මැද පළාත් කාර්යාලය
අනුරාධපුර - 2019

මිහින්තලය නාගරික සංවර්ධන සැලැස්ම

පළමුවන වෙළුම

නාගරික සංවර්ධන අධිකාරිය
උතුරු මැද පළාත් කාර්යාලය
අනුරාධපුර
2019



ලේඛන තොරතුරු

සැලැස්මේ මාතෘකාව : මිහින්තලය නාගරික සංවර්ධන සැලැස්ම

සැලසුම් කලාප මායිම් : මිහින්තලය නාගරික බල ප්‍රදේශය

ගැසට් අංකය :

පාර්ශවකරුවන් : මිහින්තලය නාගරික බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතා, මිහින්තලය නගරය වෙත පැමිණෙන ජනතාව හා අදාල ආයතන

ඉදිරිපත් කරන ලද දිනය :

ලේඛනයේ තත්ත්වය : අවසාන වාර්තාව

ලේඛන ඉදිරිපත් කිරීමේ තොරතුරු

පිටපත් අංකය	විස්තර	ඉදිරිපත් කළ දිනය	නිකුත් කිරීම සඳහා අනුමැතිය
1	කෙටුම්පත		
2	කෙටුම්පත		

මෙම වාර්තාව, බලයලත් පාර්ශවයන් විසින් නිකුත් කරනු ලබන අතර, වාර්තාවේ සඳහන් අරමුණු සඳහා පමණක් භාවිතා කල යුතුය. වාර්තාවේ සඳහන් දත්ත හෝ තොරතුරු වෙනත් පාර්ශවයක් වෙත ලබා ගැනීම හෝ වෙනත් අරමුණක් සඳහා යොදා ගැනීම, අර්ථකථනය කිරීම මඟින් ඇති වන බලපෑම් සම්බන්ධයෙන්ද අධිකාරිය වගකියනු නොලැබේ. මෙම වාර්තාව තුළ බුද්ධිමය දේපළ පනත යටතේ ආවරණය වන තොරතුරු ඇතුළත් වන අතර එම තොරතුරු බලයලත් පාර්ශවයක අනුමැතියක් නොමැතිව වෙනත් පාර්ශවයක් වෙත ලබා දීම, ලබා ගැනීම සපුරා තහනම් වේ.

ගරු ඇමති තුමාගේ පණිවිඩය



1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටවනු ලැබූ අතර පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් සංවර්ධන සැලසුම් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීම සඳහා කටයුතු කොට ඇත.

මෙම සංවර්ධන සැලසුම තුලින් අපේක්ෂා කරනු ලබන්නේ මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීමටයි. මෙම සංවර්ධන සැලස්ම මගින් මිහින්තලය නගරය හා ඒ අවට ප්‍රදේශය සතු පුරා විද්‍යාත්මක වටිනාකම් හා ප්‍රදේශයට ආවේනික වූ සංවර්ධන විභවතාවයන් ප්‍රදේශයේ සංවර්ධනයට සක්‍රීය ලෙස දායක කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාධනය කරනු ලබයි.

මාගේ අවබෝධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනයන් හා නවීන ක්‍රමෝපායන් යොදා ගෙන ඇති අතර, විශිෂ්ට තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන්ද ලබා ගෙන ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයෙන් මෙම කාර්ය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුලින් මිහින්තලය සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

ගරු අමාත්‍යය. පාඨලී චම්පික රණවක
මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යය.

ගරු සභාපතිතුමාගේ පෙරවදන



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමණාකරනය කිරීමේ වගකීමද පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ (I)) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් කොටසක් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි භෞතික, ආර්ථික, සමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදී විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම් හා ක්‍රමෝපායන් තුලින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දෙමින් මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සුව පහසු හා බෞද්ධ උරුමයන් ආරක්ෂාකාරී වූ නාගරික බල ප්‍රදේශයක් බවට පත් කිරීමට අධිශ්ඨානය කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගයක් ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ
සභාපති - නාගරික සංවර්ධන අධිකාරිය

ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය

ඉපැරණි රජ දවස ශ්‍රී විභූතිය විදහාපාන ඓතිහාසික මිහින්තලා පුරවරයේ මිහින්තලා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මිහින්තලා නගර සැලසුම් සකසන මොහොතේ සංවර්ධන සැලසුම් වෙනුවෙන් පණිවිඩයක් ලබාදීමට ලැබීම ගැන මම අතිශය සතුටු වෙමි.

දෙවන පෑතිස් රජ දවස ලක්දිවට වැඩම කළ අනුබුදු හිමියන්ගේ ආගමනය සමඟ ඇරඹෙන ලාංකීය ගෘහ නිර්මාණ ශිල්පයට පෞඩ ඉතිහාසයක් ඇත. රජ දවස සැලසුම් සහගත නගර නිර්මාණය කදිම නිදසුන, අපේ අනුරාධපුර පූජා නගරයයි.

වත්මනේ සැලසුම් සහගත නගරයක් නිර්මාණය කිරීමේ කාර්යයේදී නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂතුමා ප්‍රමුඛ කාර්යය මණ්ඩලය දරණ උත්සහාය හා කැපකිරීම මේ මෙහොතේ වෙසෙසින් අගයමි.

මාගේ පුරවරයේ පූජනීය නගරය මනරම්, අලංකාර, දුටුවන් නෙතු පිනවන නගරයක් බවට පත් කරන්නට ශක්තිය හා ධෛර්යය ලැබේවායි පතමි.

ඩී.ආර්.ලාල් සෙනෙවිරත්න.
සභාපති,
ප්‍රාදේශීය සභාව මිහින්තලේ.



පෙරවදන

මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ඉදිරි වසර 11 ක කාල පරාසයක් සඳහා භෞතික, සමාජයිය, පාරිසරික හා ආර්ථික සංවර්ධන සැලසුම් පිළියෙල කර ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආගමික මධ්‍යස්ථානයක් ලෙස සැලකෙන මිහින්තලය නගරයෙහි ලොව ප්‍රථම අභය භූමිය පිහිටා ඇත. පාරිසරික වටිනාකමකින් යුක්තව සංවර්ධනය වී ඇති මෙම නගරයෙහි පෞරාණික බව සංරක්ෂණය වන පරිදි හා නව සංවර්ධන ප්‍රවනතා ප්‍රදේශය තුළ ඇති කරලීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම පිළියෙල කරනු ලැබීය. ඒ යටතේ හඳුනාගත් අරමුණු පරමාර්ථ හා උපාය මාර්ගික ව්‍යාපෘති මෙම සැලසුම තුල අන්තර්ගත වේ. 2019 වර්ෂයේ සිට 2030.12.31 වෙනි දින දක්වා කාල පරාසය සඳහා මෙම සංවර්ධන සැලැස්ම වලංගු වේ.



ස්තූතිය

මිහින්තලය නාගරික බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලසුම් සකස් කරන ලද්දේ නාගරික සංවර්ධන අධිකාරියේ උතුරු මැද පළාත් කාර්යාලයේ සැලසුම් කණ්ඩායම විසිනි. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක නොමද සහාය මෙම සැලැස්ම සාර්ථක ලෙස නිම කර ගැනීම ලබා දුන් අතර, දත්ත හා තොරතුරු ලබාගැනීමේදී ආයතන වලින් ලද සහාය ස්තුති පූර්වකව සිහිපත් කල යුතු වේ. මෙම සංවර්ධන සැලසුම් සකස් කිරමේදී සෘජුව සහ වක්‍රව අප වෙත සහයෝගය ලබාදුන් සම්පත් දායකයන් වෙත අපගේ ස්තුතිය පුද කරමු. නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමන්ට, අධ්‍යක්ෂ ජනරාල්තුමන්ට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), පරිසර හා භූ දර්ශන අංශයට, සංවර්ධන සැලසුම් අංශයට, භූගෝලිය තොරතුරු පද්ධති අංශයට, පර්යේෂණ හා සංවර්ධන අංශයට මෙම සංවර්ධන සැලසුම් සාර්ථකව නිම කිරීම සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් හෘදයාංගම ස්තුතිය පුද කරමු. මූළික දත්ත රැස් කිරීමේ අදියරෙහි සිට ගැසට් පත්‍රයෙහි පල කිරීම අදියර දක්වා සියළු අදියරයන් වලදී සහයෝගය ලබාදුන් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා පුද්ගලයින් වෙත අපගේ ස්තිතුය පුද කරමු.



පටුන

ලේඛන තොරතුරු 3
ගරු ඇමති තුමාගේ පණිවිඩය 4
ගරු සභාපතිතුමාගේ පෙරවදන 5
ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය 6
පෙරවදන 7
ස්තූතිය 8
පටුන 9
පළමු කොටස 13
1 හැඳින්වීම 13
1.1 සංවර්ධන සැලැස්මේ පසුබිම 13
1.2 සැලසුම් කණ්ඩායම 14
1.2.1 ප්‍රධාන සම්බන්ධිත ආයතන 14
1.2.2 ප්‍රධාන උපදේශන ආයතන 14
1.2.3 අනෙකුත් පාර්ශවකරුවන් 15
1.2.4 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම 15
1.2.5 ප්‍රධාන කාර්යාලයේ සැලසුම් කණ්ඩායම 15
1.3 විෂය පථය 16
1.4 සැලසුම් ක්‍රියාවලිය 17
2 මූළික අධ්‍යනයන් 21
2.1 අධ්‍යයනය කල ප්‍රදේශය 21
2.2 සැලසුම් හා තත්ත්ව සංදර්භය 23
2.2.1 සැලසුම් සංදර්භය 23
2.2.2 තත්ත්ව සංදර්භය 24
2.3 සැලසුම් ප්‍රදේශ සීමා නිර්ණය කිරීම 28
3 නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය 34
දෙවන කොටස 39
අමාත්‍ය අනුමැතිය 39
ගැසට් නිවේදනය – (1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ සංශෝධිත පනත අනුව) 40
4 සංවර්ධන සැලසුම් රාමුව 41
4.1 දැක්ම 41
4.2 දැක්මේ ප්‍රකාශනය 41
4.3 අරමුණ 42
4.4 පරමාර්ථ 43
5. ශක්‍යතා, දුබලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ විශ්ලේෂණය 44
6. සැලැස්ම 66
6.1 සංකල්පිත සැලැස්ම 66
6.2 යෝජිත ඉඩම් පරිහරණ උපාය මාර්ග 70
6.3 භෞතික හා සාමාජීයීය අපරව්‍යුහ සංවර්ධන උපාය මාර්ග 74
6.3.1 යෝජිත සේවා සැපයුම් සැලසුම 74
6.3.1.1 සෞඛ්‍යය ක්ෂේත්‍රය 74
6.3.1.2 අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය 76

6.3.2	යෝජිත ප්‍රවාහන සැලසුම	80
6.3.3	යෝජිත ජල සැපයුම් සැලසුම	83
6.3.4	යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම	85
6.4	ආර්ථික සංවර්ධන උපාය මාර්ග	89
6.5	තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග.	93
6.5.1	යෝජිත පාරිසරික සංරක්ෂණ සැලැස්ම.	93
6.5.2	භූ දර්ශන කළමනාකරණ සැලැස්ම	97
6.5.3	යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම	101
6.6	සංස්කෘතික හා උරුමයන් කලමනාකරණය කිරීමේ උපාය මාර්ග	111
6.7	ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග	114
6.7.1	ව්‍යාපෘති ප්‍රමුඛතාවය	114
6.7.2	උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති	116
6.7.3	මිහින්තලේ ප්‍රාදේශීය සභාව මගින් භාණ්ඩාගත් සංවර්ධන යෝජනා	161
6.7.4	ආයතනික සැකැස්ම	162

සිතියම් ලැයිස්තුව

සිතියම 1: අධ්‍යන ප්‍රදේශය 22
සිතියම 2: මිහින්තලය නගරයට සම්බන්ධ වන ක්‍රියාකාරී ප්‍රදේශ 29
සිතියම 3: අනුරාධපුර නගරය සම්බන්ධ ක්‍රියාකාරී ප්‍රදේශ 30
සිතියම 4: සංවර්ධන සැලසුම් බල ප්‍රදේශය 33
සිතියම 5: මිහින්තලය රෝහල් පෝෂක ප්‍රදේශය 58
සිතියම 6: අවකාශීය සම්බන්ධතාවය 62
සිතියම 7: සංකල්පිත සැලැස්ම 2030 67
සිතියම 8: භූමි පරිභෝජනය 71
සිතියම 9: සෞඛ්‍ය සේවා උපාය මාර්ග 75
සිතියම 10: පාසැල් පෝෂක ප්‍රදේශය 77
සිතියම 11: රජරට විශ්ව විද්‍යාලය සංවර්ධන ප්‍රදේශය 79
සිතියම 12: යෝජිත මාර්ග පද්ධතිය 82
සිතියම 13: ජල සැපයුම් ප්‍රමුඛතා ප්‍රදේශ 84
සිතියම 14: ආර්ථික සංවර්ධන උපාය මාර්ග 90
සිතියම 15: යෝජිත පාපැදි මංතීරුව 92
සිතියම 16: පාරිසරික සංරක්ෂණ ප්‍රදේශ 94
සිතියම 17: යෝජිත තෙත් බිම් සැලැස්ම 96
සිතියම 18: භූ දර්ශණ ප්‍රදේශ 98
සිතියම 19: නගර මධ්‍යය අලංකරණ උපක්‍රම 100
සිතියම 20: පොදු එළිමහන් විවෘත භූමි හා විනෝදාස්වාද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 110
සිතියම 21: පුරා විද්‍යා ප්‍රදේශ සංවර්ධනය 113
සිතියම 22 : සංවර්ධන පිඩන දර්ශකය 166
සිතියම 23: සංවේදී ස්ථාන පිළිබඳ සිතියම 167
සිතියම 24: NDVI දර්ශකය - 2017 168
සිතියම 25: භූමි පාරිභෝජනය - මිහින්තලය ප්‍රාදේශීය සභා ප්‍රදේශය 2016 169
සිතියම 26: ජන ජනගහනය 2012 - මිහින්තලය ප්‍රාදේශීය සභා ප්‍රදේශය 170
සිතියම 27: ජන ඝනත්වය 2012 - මිහින්තලය ප්‍රාදේශීය සභා ප්‍රදේශය 171
සිතියම 28: නලමාර්ග -ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය - මිහින්තලය ප්‍රාදේශීය සභා ප්‍රදේශය 173

සිතියම 29: නිවාස ඝනත්වය 2001 මිහින්තලය ප්‍රාදේශීය සභා ප්‍රදේශය 174
සිතියම 30: නිවාස ඝනත්වය 2012- මිහින්තලය ප්‍රාදේශීය සභා ප්‍රදේශය.....175
සිතියම 31: ජලමූලාශ්‍ර - මිහින්තලය ප්‍රාදේශීය සභා ප්‍රදේශය 177
සිතියම 32: දැනට පවතින නේවාසික ප්‍රදේශ 178
සිතියම 33: නේවාසික භාවිතයන් සඳහා ඉඩම් කට්ටි වීමේ ප්‍රවනතාවය 179
සිතියම 34: ජනගහනය අනුරාධපුර මහ නගර සභා ප්‍රදේශය 2001.....180
සිතියම 35: ජනගහනය අනුරාධපුර මහ නගර සභා ප්‍රදේශය 2012 181
සිතියම 36: භූමි වටිනාකම් අනුරාධපුර මහ නගර සභා ප්‍රදේශය 2001 182
සිතියම 37: භූමි වටිනාකම්, අනුරාධපුර මහ නගර සභා ප්‍රදේශය 2016 183
සිතියම 38: හරිත ප්‍රදේශ ව්‍යාප්තිය 185
සිතියම 39: නේවාසික කටයුතු වලට සුදුසු ප්‍රදේශ 186
සිතියම 40: මාර්ගස්ථ සම්බන්ධතාවය 188
සිතියම 41: සිසු ගුරු අනුපාතය හා පාසල් පිළිබඳ විස්තර..... 190
සිතියම 42: ස්ථානීය උස පිළිබඳ සිතියම..... 192
සිතියම 43: නේවාසික ප්‍රදේශ හා ජල සම්පාදිත ප්‍රදේශ 193
සිතියම 44: මිහින්තලය නාගරික ප්‍රදේශයේ රෝහල් 194
සිතියම 45: නේවාසික කටයුතු සඳහා සුදුසු ප්‍රදේශ හා මාර්ග බිඳී යාම් සහිත ප්‍රදේශ 195
සිතියම 46: මාර්ග සම්බන්ධතාවය ඉහළ ලෙස බිඳී ගිය ප්‍රදේශ..... 196
සිතියම 46 i: - මාර්ග සම්බන්ධතාවය ඉහළ ලෙස බිඳී ගිය ප්‍රදේශ 01.....198
සිතියම 46 ii: - මාර්ග සම්බන්ධතාවය බිඳී ගිය ප්‍රදේශ 02..... 199
සිතියම 46iii: - මාර්ග සම්බන්ධතාවය බිඳී ගිය ප්‍රදේශ 03..... 200
සිතියම 46 IV: - මාර්ග සම්බන්ධතාවය බිඳී ගිය ප්‍රදේශ 04..... 201
සිතියම 47: වර්තමානයේ අපද්‍රව්‍ය බැහැරලන ස්ථානය සහ යෝජිත ඉඩම 204
සිතියම 48: ඉඩම් මිල 207

වගු ලැයිස්තුව

වගුව 1: මාර්ග ඝනත්වය 25
වගුව 2: මිහින්තලය නාගරික ප්‍රදේශය තුළ පවතින අධ්‍යාපන ආයතන.....46
වගුව 3: මිහින්තලය සංචාරක ප්‍රවර්ධනයන් සඳහා ඇති අවස්ථා 48
වගුව 4: ඉඩම් මිළ 54
වගුව 5: රජයේ රෝහල් පහසුකම්.....57
වගුව 6: පවතින පොදු එළිමහන් හා විවෘත භූමි ප්‍රමාණය 101
වගුව 7: යෝජිත පොදු එළිමහන් හා විවෘත භූමි ප්‍රමාණය 102
වගුව 8: හදුනාගත් පවතින එළිමහන් ස්ථාන 107
වගුව 9: හදුනාගත් යෝජිත එළිමහන් ස්ථාන.....108
වගුව 10: යෝජිත එළිමහන් ස්ථාන සඳහා හදුනාගත් භාවිතයන්..... 109

රූපසටහන් ලැයිස්තුව

රූපසටහන 1: සැලසුම් ක්‍රියාවලිය.....17
රූපසටහන 2: අරමුණු සහ පරමාර්ථ.....43
රූපසටහන 3: ශ.දු.අ.ත විශ්ලේෂණය 44
රූපසටහන 4: වන ව්‍යාප්තිය හා බිම් ආවරණයේ වෙනස 2008 2017 53
රූපසටහන 5: රජරට විශ්ව විද්‍යාලයේ භූමි ප්‍රදේශය 56
රූපසටහන 6: පුරාවිද්‍යා ප්‍රදේශය තුළ මිහින්තලය රෝහල පිහිටා ඇති අකාරය 59
රූපසටහන 7: පුරා විද්‍යා ප්‍රදේශය.....60
රූපසටහන 8: නගර මධ්‍යය සංකල්පය..... 69
රූපසටහන 9: මිහින්තලය ප්‍රදේශයේ වසර 2030 දී අපේක්ෂිත දර්ශනය.....69
රූපසටහන 10: මාතලේ හංදිය සංවර්ධන ප්‍රදේශයේ හරස්කඩක්..... 72

රූපසටහන 11: මිහින්තලය නගර ප්‍රදේශයේ හරස්කඩක්.....73
රූපසටහන 12: මහකනදරාව සංවර්ධන ප්‍රදේශයේ හරස්කඩක්..... 74
රූපසටහන 13: මාර්ග සංවර්ධන හරස්කඩ 99

ප්‍රස්ථාර ලැයිස්තුව

ප්‍රස්ථාරය 1: 2010 - 2016 මිහින්තලය සැලසුම් ප්‍රදේශයේ ප්‍රධාන භූමි පරිභෝජන රටාවන්.....52
ප්‍රස්ථාරය 2: අනුරාධපුර අටමස්ථානයට සාපේක්ෂව මිහින්තලයට පැමිණෙන විදේශ සංචාරකයන් ප්‍රමාණය.....203
ප්‍රස්ථාරය 3: අටමස්ථානයට සාපේක්ෂව මිහින්තලයට පැමිණෙන දේශීය වන්දනාකරුවන් ප්‍රමාණය.....203
ප්‍රස්ථාරය 4: මිහින්තලය ප්‍රදේශයේ උෂ්ණත්වය 2009 - 2018..... 205
ප්‍රස්ථාරය 5: තලාව ප්‍රදේශයේ උෂ්ණත්වය 2009 – 2018.....205
ප්‍රස්ථාරය 6: මිහින්තලය ප්‍රදේශයේ වර්ෂාපතනය 2009 - 2018 206

ඡායාරූප ලැයිස්තුව

ඡායාරූපය 1: මිහින්තලය චෛත්‍ය දර්ශනය 49
ඡායාරූපය 2: දොරමඩලාව ප්‍රදේශයේ සංචාරක කුටියක් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ 50-51

1 හැඳින්වීම

1.1 සංවර්ධන සැලැස්මේ පසුබිම

ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනයේ ප්‍රමුඛ ආයතනය ලෙස නාගරික සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක වන අතර, 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත මගින් පනවන ලද බලය තුළ නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයක් ප්‍රකාශ කිරීම, සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ බලය අධිකාරියට හිමි වේ. 1982 අංක 4 දරණ පනත මගින් සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 අ වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව එම පනතේ 3 (1) වගන්තියට අනුව 2001/04/10 දින අංක 1179/11 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මිහින්තලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ඒකාබද්ධව සැලසුම් කිරීම සහ භෞතික වශයෙන් සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම සඳහා ඉහත පනතේ 8 (අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රජාව වෙත සලසා දෙනු ලබන පහසුකම් සහ සේවා සැලකිල්ලට ගෙන මිහින්තලේ බල ප්‍රදේශය සඳහා මෙම සංවර්ධන සැලැස්ම පිළියෙල කරනු ලැබේ.

නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රදේශයේ සංවර්ධන අවශ්‍යතාවයන් හඳුනාගනිමින් 2011 වසරේ දී මිහින්තලය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 06 ක් සඳහා දළ නගර සංවර්ධන සැලැස්මක් විස්තරාත්මක ලෙස සකස් කරන ලදි. එය වසර 2030 දක්වා සකසන ලද අතර කෙටි කාලයක් තුල ප්‍රදේශයේ සිදු වූ වෙනස්කම් හා සංවර්ධනයන් නියාමනය නව ප්‍රවේශයක් තුලින් සකස් කිරීම වඩාත් උචිත වන හෙයින් ප්‍රදේශයේ භෞතික , සාමාජයීය ,ආර්ථික හා පරිසර සම්බන්ධතාවයන් කළමනාකරණය කිරීමට 2019 සිට 2030 දක්වා කාල පරාසයකට නව සැලසුමක් සකස් කිරීම ආරම්භ කරන ලදි.

නාගරික සංවර්ධන ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කරන ලද ග්‍රාම සේවා වසම් 25 කින් සමන්විත හෙක්ටයාර් 23570 ක වපසරියකින් යුත් ප්‍රදේශයෙන් සැලසුම් ප්‍රදේශය ලෙස ග්‍රාම සේවා වසම් 15කින් යුතු හෙක්ටයාර් 8369 ක ප්‍රදේශය සඳහා විස්තරාත්මක සැලසුම් සකස් කර ඇති අතර, ඉහත සඳහන් වූ මුළු ප්‍රදේශයටම කලාපීකරණ රෙගුලාසි සකස් කර ඇත.



1.2 සැලසුම් කණ්ඩායම

මිහින්තලය නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී පහත සඳහන් සැලසුම් කණ්ඩායමේ දායකත්වය මත සිදු කරන ලදී.

1.2.1 ප්‍රධාන සම්බන්ධිත ආයතන

මිහින්තලය ප්‍රාදේශීය සභාව

නාගරික සංවර්ධන අධිකාරිය

1.2.2 ප්‍රධාන උපදේශන ආයතන

රජරට විශ්ව විද්‍යාලය

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

පුරා විද්‍යා දෙපාර්තමේන්තුව

මධ්‍යම සංස්කෘතික අරමුදල

මාර්ග සංවර්ධන අධිකාරිය

උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ලංකා විදුලි බල මණ්ඩලය

ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය - අනුරාධපුර

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ගමනා ගමන මණ්ඩලය

උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වාරි මාර්ග දෙපාර්තමේන්තුව



1.2.3 අනෙකුත් පාර්ශවකරුවන්

මිහින්තලය රජමහ විහාරස්ථානය

දොරමඩලාව රජමහ විහාරස්ථානය

වෙළඳ සංගමය - මිහින්තලය

හෝටල් සංගමය අනුරාධපුර

වාණිජ මණ්ඩලය අනුරාධපුර

1.2.4 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම

01	අධ්‍යක්ෂ (උතුරු මැද පළාත)	-	නගර නිර්මාණ ශිල්පි ජගත් ලියනගේ මහතා
02	නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)	-	නගර නිර්මාණ ශිල්පි රෝහිණි ගුණතිලක මිය
03	සැලසුම් නිලධාරි	-	එම්.පි.මයුරවංශ මහතා
04	සැලසුම් නිලධාරි	-	ශ්‍රීයානි දහනායක මිය
05	සැලසුම් නිලධාරි	-	පුෂ්පිනි ඉන්දිකා මිය
06	සැලසුම් නිලධාරි	-	කුමාරි තලගුනේ මිය
07	සැලසුම් නිලධාරි	-	රේණුකා ධනපාල මිය
08	සහකාර සැලසුම් නිලධාරි	-	සුරේෂ් මධුරංග මහතා
09	සහකාර සැලසුම් නිලධාරි	-	හසිත ප්‍රභාත් මහතා

1.2.5 ප්‍රධාන කාර්යාලයේ සැලසුම් කණ්ඩායම

1 නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)

2 සංවර්ධන සැලසුම් අංශය

3 පරිසර හා භූ දර්ශන අංශය

4 පර්යේෂණ හා සංවර්ධන අංශය

5 භූගෝලිය තොරතුරු පද්ධති අංශය

6 බලාත්මක අංශය

1.3 විෂය පථය

මිහින්තලය ප්‍රදේශය සාමාජයීය ලෙස බෞද්ධයන්ට හා ශ්‍රී ලාංකික පැරණි රාජ්‍ය ක්‍රමයේ වැදගත් ස්ථානයක් උසුලනු ලබයි. එමෙන්ම පාරිසරික ලෙස වැදගත් වන අභය භූමි, අලංකරකාර දර්ශන පථ රාශියක්ද මෙම සංවර්ධන සැලැස්ම සඳහා අදාල කරගැනිමට සිදු විය. එමෙන්ම නගරයට අදාල වන ජාතික තලයේ, ප්‍රාදේශීය තලයේ රෙගුලාසි අන්තර්ග්‍රහණය කරගනිමින් වසර 2030 වන විට මිහින්තලය නාගරික ප්‍රදේශයට අවශ්‍යය භෞතික ,ආර්ථික , සමාජයීය, පාරිසරික අංශයන්හි සංවර්ධනය ඉලක්ක කර ගනිමින් නගරයේ හඳුනාගත් ගැටලු නිශෝධනය කිරිමට, අවම කිරිමට හා විසඳීමට මෙන්ම සංවර්ධන විභවතා උපරිම ලෙස යෙදවීම ඉලක්ක ගත කරවීම විෂය කර ගනිමින් මෙම සංවර්ධන සැලැස්ම පිළියෙල කිරිම සිදු විය.

විශේෂයෙන්ම පොසොන් උත්සව සමයේ උද්ගත වන භෞතික, ආර්ථික, සමාජයීය, පාරිසරික ක්‍රියාකාරකම් මෙන්ම මිහින්තලය ප්‍රදේශයේ පුරා විද්‍යා වටිනාකම් ඉලක්ක කර ගනිමින්, වන්දනා කරුවන්ට හා විදේශිකයන්ට සේවා සැපයිම විෂය පථය කර ගනිමින් සැලැස්ම සැකසිම අරමුණු කරගෙන ඇත. එමෙන්ම මිහින්තලය ප්‍රදේශය තුල වර්තමානය වන විට වෙසෙන ජනතාවගේ භෞතික හා ආර්ථික දියුණුව මෙන්ම සාමාජයීය සුරක්ෂිතතාවය වර්ධනය කර ගනිමින් ප්‍රදේශය තුළ සංවර්ධනයේ ඉලක්ක ගත අරමුණු සපුරා ගැනීම ද මෙමඟින් ආපේක්ෂා කෙරේ. විශේෂයෙන් ම යටිතල පහසුකම් සංවර්ධනය ද පොසොන් උත්සවය හැරුණු කොට ගෙන ප්‍රදේශයේ සංවර්ධනයට දායක කර ගත හැකි අනෙකුත් විකල්ප අවස්ථා ප්‍රයෝජනයට ගැනිමට ද මෙම සංවර්ධන සැලැස්ම තුලින් අපේක්ෂා කරයි.

භෞතික හා නාගරික සංවර්ධනය සඳහා යෝග්‍යතාවය පිරික්සීමේ විශ්ලේෂණයන්ට අනුව මෙම සංවර්ධන සැලැස්මේ විස්තරාත්මක සැලසුම් ප්‍රදේශය තෝරා ගත් අතර, එය මිහින්තලය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් කොටසකට සිමා වේ.



1.4 සැලසුම් ක්‍රියාවලිය

රූපසටහන 1: සැලසුම් ක්‍රියාවලිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

1.4.1 පසුබිම් අධ්‍යයනය

පසුබිම් අධ්‍යයනය යටතේ ක්ෂේත්‍ර පරීක්ෂාවන් මඟින් මිහින්තලය ප්‍රදේශය පිළිබඳ අධ්‍යයනය කිරීම සිදු කෙරුණි. එමෙන්ම අවශ්‍යය මූළික දත්ත සපයා ගැනිමද අදාල ආයතන වලට ගොස් ලබා ගන්නා ලදි. ඒ අතරම මුලික සිතියම් සැකසිම සිදු කල අතර, තවදුරටත් හිග දත්ත ලබාගැනිමට නොහැකි වූ විට එම දත්ත මුල් අදියරේ සිටම භූගෝලිය තොරතුරු පද්ධති මඟින් සකස් කර පිළියෙල කර ගැනිම සිදු කරනු ලැබිය. මෙමගින් ජනගහන , නිවාස, සමෝච්ඡ රේඛා හා තැන් උස, පුරා විද්‍යා ස්ථාන හා සංවේදී ප්‍රදේශ පිළිබඳ සිතියම්ද, පිළිබඳ යටිතල පහසුකම් පිළිබඳ දත්ත විවිධ ආර්ථික හා සමාජ දත්ත ලබාගැනිම, භූමි පරිහරණ රටා දත්ත සැකසිම හා සිතියම් යාවත්කාලින කරගැනිම සිදු කරනු ලැබිණ.

1.4.2 සැලසුම් අවකාශය

මේ යටතේ මූලික වශයෙන් නාගරික ප්‍රදේශය හා ඉන් පරිබාහිර ප්‍රදේශ අතර, පවතින සම්බන්ධතාවය, එමෙන්ම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මෙම ප්‍රදේශයට ඇති සබඳතා අධ්‍යයනය කිරීම, නාගරික ප්‍රදේශය තුළ සිදුවන රථවාහන ගමනාගමනය, පදික ගමනාගමනය, හා නගරයේ ඒදිනෙදා සිදුවන ක්‍රියාවලින් අධ්‍යයනය කිරීම මගින් සංවර්ධන සැලැස්ම සඳහා මූලික අඩිතාලම සකස් කරන ලදි.

1.4.3 සංවර්ධන සැලැස්මට අන්තර්ගත විය යුතු ගැටලු හා සංවර්ධන විභවතා හඳුනාගැනිම.

මෙම පියවර යටතේ සියලු පාර්ශවකරුවන්ට මූලික කරුණ ඔස්සේ ලබාගත් දත්ත ඉදිරිපත් කරමින් සංවර්ධන සැලැස්ම සඳහා ඔවුන්ගේ අදහස් හා ගැටළු ඒකරාශි කිරීම සිදු කරන ලදී. එමෙන්ම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදි සැලකිය යුතු මූලික ලක්ෂණ පිළිබඳ අදහස් ලබාගැනිම ද සිදු කෙරිනි. විවිධ ආයතන හා ප්‍රදේශයේ සිවිල් සමාජයේ නියෝජිතයන්ගේ අදහස් හා ඔවුන්ගේ අනාගත සැලසුම් පිළිබඳ අධ්‍යයනයක් ද මෙමගින් සිදු කරන ලදි. පසුව මෙම සියලු ගැටලු හා යෝජනා සංවර්ධන සැලසුමට ඇතුලත් කිරීම සඳහා ඇති ශක්‍යතාවය එනම්, එම ගැටලු හා විභවතාවයන් විශ්ලේෂණය කර තහවුරු කර ගැනිමෙන් පසුව සංවර්ධන සැලසුම් සකස් කර ගැනිමට පාදක කර ගන්නා ලදී.

1.4.4 නගර සංවර්ධන සැලැස්මේ දැක්ම හා පරමාර්ථ සැකසිම

ඉහත ලබාගත් දත්ත අදහස් හා විශ්ලේෂණයන්ගෙන් පසුව මිහින්තලය නගරය වසර 2030 වන විට සංවර්ධනය කල යුත්තේ කුමන දැක්මක් පෙරදැරි කරගෙන ද යන අදහස මත "නේවාසික නගරයක්" යන්න තහවුරු විය. ඒ අනුව, එම දැක්ම උපක්‍රමික දැක්මක් ලෙස සකසා ගෙන ඊට අවශ්‍යය පරමාර්ථ ද සකසා ගැනුනි. මෙම නගර සංවර්ධන සැලැස්මේ දැක්ම ළඟා කර ගැනිම සඳහා අරමුණු එකකින් යුක්තව සංවර්ධන සැලැස්ම කරා පිවිසෙනු ලැබේ.

1.4.5 විස්තරාත්මක විශ්ලේෂණය

වසර 2030 වන විට සකසාගත් දැක්ම හා පරමාර්ථයන් සාධනය කර ගැනීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති ආශ්‍රයෙන් විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කල අතර, සැලසුම් කමිටුවේ සාමූහික සාකච්ඡා මඟින්ද වඩා හොඳ විශ්ලේෂණය කරා ලඟා වීමට අවශ්‍ය පදනම සකස් කර ගන්නා ලදි. එමගින් සංවර්ධන බලපෑම් දර්ශකය හා සංවේදී ප්‍රදේශ පිළිබඳ සිතියම ද නගරය ව්‍යාප්ත විය යුතු ආකාරය හා දැනට පවතින ගැටලු සඳහා ගනු ලබන පියවර ආදිය ද විශ්ලේෂණය කිරීම සිදු විය.

1.4.6 නගර සංවර්ධන සැලැස්මේ අරමුණු උපක්‍රම සම්පාදනය කිරීම

ඉහත සඳහන් කල දැක්මට අනුව නගර සංවර්ධන සැලැස්මට අරමුණු දෙකක් පවති. එම අරමුණු ව්‍යුහාත්මක වී ඇත්තේ දැක්ම ළඟා වීමට අදාල පරමාර්ථයන්ට වලට අනුකූලවය. මෙම පියවර යටතේ හඳුනාගත් දැක්මට අනුව ගොඩනැගිලි සංවර්ධන උපදේශන සැලැස්ම, යටිතල හා අපර ව්‍යුහ සංවර්ධනය පිළිබඳ උපදේශන සැලැස්ම, පරිසර හා භූගෝලිය සංවර්ධනය පිළිබඳ උපදේශන සැලැස්ම ආදි අංශ ඒකාබද්ධ සංවර්ධනයන් හා උපක්‍රම මගින් සංවර්ධනය කිරීමට හඳුනා ගන්නා ලදී.

1.4.7 හඳුනාගැනිමේ, ස්ථාපිත කිරිමේ සංකල්ප යොදා ගැනිම

මෙම පියවර යටතේ සංවර්ධන සැලැස්ම සඳහා විවිධ ව්‍යාපෘති හඳුනා ගනු ලැබිය. විශේෂයෙන්ම සංවර්ධන සැලැස්මේ අරමුණු වලට අනුගාමී වන ලෙස මෙම ව්‍යාපෘති හඳුනා ගන්නා ලදි. එමගින් වසර 2030 වන විට බලාපොරොත්තු වන දැක්ම කරා යාමට මෙම ව්‍යාපෘති මගින් මග පාදනු ලැබේ. එමෙන්ම සංවර්ධන ප්‍රතිපත්ති ලෙස ප්‍රදේශය තුළ සංවර්ධන රෙගුලාසි හා ගොඩනැගිලි රෙගුලාසි ස්ථාපිත කරනු ලබන අතර, නගර සංවර්ධනය දැක්මට අනුකූල කිරිම සඳහා නව සංවර්ධන කලාපියකරණයක් ද හඳුනාගනු ලැබිය.

1.4.8 ලේඛනගත කිරිම, වගුගත කිරිම විධිමත් කිරිම හා ඉදිරිපත් කිරිම් සැකසිම

ලේඛනගත කිරිම හා වගුගත කිරිම් මෙන්ම ඉදිරිපත් කිරිම් සැකසිම, සංවර්ධන සැලැස්ම මුල් අදියරේ සිටම සිදු කෙරිනි. එදිනෙදා ඉදිරිපත් කිරිම් හා තොරතුරු යාවත් කාලින කිරිම තුලින් එම ලේඛණගත කිරිම සිදු විය.

1.4.9 පාර්ශවකරුවන් සඳහා කෙටුම්පත් සංවර්ධන සැලැස්මට ඉදිරිපත් කිරිම, අදහස් හා යෝජනාමය වෙනස්කම් සිදු කිරිම

පාර්ශවකරුවන්ගේ මූලික රැස්වීමේදි හඳුනාගත් යෝජනා හා ගැටළු පාදක කර ගනිමින් හා නාගරික සංවර්ධන අධිකාරිය මගින් හඳුනාගත් සංවර්ධන අරමුණු ඒකාබද්ධ කර ගනිමින් ප්‍රදේශයේ භෞතික, ආර්ථික, පාරිසරික සහ සාමාජයීය අංශ සංවර්ධනය සඳහා ඉදිරි වසර 10 ක කාලය සඳහා මිහින්තලය ප්‍රදේශයේ සංවර්ධන සැලැස්ම සම්පූර්ණ කෙටුම්පතක් ලෙස පාර්ශවකරුවන්ට ඉදිරිපත් කිරිම මෙමගින්

සිදු කරන අතර, තවදුරටත් හේතු සහගත යෝජනා වෙනස්කම් සංවර්ධන සැලැස්මට ඇතුලත් කිරීමද සිදු කරන ලදි.

1.4.10 සංවර්ධන සැලැස්ම ප්‍රකාශ කිරීම ව්‍යාපෘති සම්පාදනය හා සංවර්ධන සැලැස්ම බලාත්මක කරවීම.

සංවර්ධන සැලැස්ම සම්පූර්ණ ලෙස ප්‍රකාශයට පත් කිරීම මෙමගින් සිදු කරන ලදි. එහිදි ප්‍රධාන සැලසුම් කමිටුව මගින් අනුමත වූ පසුව හා අදාල බල ප්‍රදේශයේ මහජන ප්‍රදර්ශනයෙන් පසුව විෂයභාර අමාත්‍යවරයා වෙත ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා සංවර්ධන සැලසුම් අංශය මගින් අවශ්‍ය කටයුතු සිදුකරන ලදි.



2 මූලික අධ්‍යනයන්

2.1 අධ්‍යයනය කල ප්‍රදේශය

මිහින්තලය නාගරික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදි ප්‍රධාන වශයෙන්ම එම ප්‍රදේශයේ පවතින භෞතික, ආර්ථික, සමාජයිය හා පාරිසරික අංගයන් වෙත අවධානය යොමු කරන ලදී. එහිදි සමස්ථයක් ලෙස මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙම සියළු අධ්‍යයන්ට භාජනය කරන ලදි. එය ග්‍රාම නිලධාරි කොට්ඨාශ 25 කින් සමන්විත වන අතර, අධ්‍යයන කල ප්‍රදේශය ආසන්න ලෙස හෙක්ටයාර 23,750 ක් ලෙස දැක්විය හැකි වේ.

මෙම සැලැස්ම සැකසිම සඳහා සම්පූර්ණ ලෙසම මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තෝරාගත් අතර, එය විශාල ලෙස කෘෂි බිම්, වගා බිම්, වන වගා හා ස්වභාවික කැලෑ, ප්‍රදේශයන්ගෙන් වටවී තිබේ. එමෙන්ම මෙම ප්‍රදේශය ගළෙන්බිඳුනුවැව, හොරොව්පතාන, රඹෑව වැනි කෘෂිකාර්මික ප්‍රදේශයන්ගෙන් වටවී ඇති භූමි ප්‍රදේශයකි. (සිතියම 5 , සිතියම 40) බටහිර දිශාවෙන් අනුරාධපුර පූජා නගරය පිහිටා තිබේ. මිහින්තලය නගර මධ්‍යය ප්‍රදේශය තුල, මිහින්තලය පුරා විද්‍යා රක්ෂිතය හා මිහින්තලය කන්ද ද රජරට විශ්ව විද්‍යාලය, රජයේ ආයතන හා වාණිජ කටයුතු සඳහා යොදාගත් භූමි ප්‍රදේශද හඳුනාගත හැකිය.

අනෙකුත් ප්‍රදේශ නේවාසික භාවිතයන් සඳහා වෙන්වී ඇත. මිහින්තලය නගරය හා ඉන් පිටත ප්‍රදේශ ග්‍රාමීය ප්‍රදේශයන් ලෙස ප්‍රධාන කොටස් දෙකක් හඳුනාගත හැකි අතර ප්‍රධාන වශයෙන්ම ජනාවාස විසිරිමක් දක්නට ඇත්තේ මාර්ගය ඔස්සේ වීම නිසා මාර්ගයට ආසන්නයේ ජනාවාස එක්වීමක්ද ඉන් පිටතට යාමේදි ජනාවාස අඩුවීමක්ද දැකිය හැකි වේ. ජනාවාස සම්බන්ධ වී ඇත්තේ ග්‍රාමීය මාර්ගයන් ඔස්සේ වන අතර මෙහි ඇති එක් ප්‍රධාන ලක්ෂණයක් වනනේ ජනාවාසයක් කේන්ද්‍ර කර ගනිමින් ඒ වටා කෘෂිකාර්මික ප්‍රදේශයකුත්, එය වටා වනාන්තර හෝ ලදු කැලෑ ප්‍රදේශයකුත් පිහිටා තිබිමයි. මෙවැනි ජනාවාස කිහිපයක එකතුවකින් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් නිර්මාණය වී ඇත. මෙම සියළුම ජනාවාස විශාල කෘෂිකාර්මික ප්‍රදේශ හෝ වනාන්තර වලින් වෙන්වී ඇති නිසා නගරය හා මෙම ප්‍රදේශ වල අන්තර්සම්බන්ධතාවය වැඩිදියුණු කිරිම මූලික අවශ්‍යතාවයකි. විශාල ලෙස ඇති වී පවතින නිදහස් හා කෘෂිකාර්මික භූමි ප්‍රදේශ මිහින්තලය ප්‍රදේශයේ සංවර්ධනය සඳහා දායකත්වයක් සැපයන අංග වේ. අධ්‍යයන ප්‍රදේශය තුළ වැඩි වශයෙන් පවතින භූමි පරිභෝජන රටාව වන්නේ කුඹුරු හා වෙනත් කෘෂිකාර්මික බිම් ප්‍රදේශයන්ය. සැලසුම් ප්‍රදේශය තුළට අයත් වන කුඹුරු බිම් ප්‍රමාණය අක්කර 1 554 ක් පමණ වන අතර නේවාසික භාවිතය සඳහා හෙක්ටයාර 3 500 කට ආසන්න ප්‍රමාණයක් හඳුනා ගත හැකිය. එමෙන්ම අධ්‍යයන ප්‍රදේශයේ 12 % හා 17 % ක් ලෙස පිළිවෙලින් ඝන වනාන්තර ප්‍රදේශ හා ලදු කැලෑ ප්‍රදේශ පිහිටා ඇත (සිතියම 25, ප්‍රස්ථාරය 1)



සිතියම 1: අධ්‍යන ප්‍රදේශය



අධ්‍යන ප්‍රදේශය 2030
මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

නාගරික සංවර්ධන අධිකාරිය
2019 ජනවාරි

උතුරු මැද පළාත් කාර්යාලය | මිහින්තලය සංවර්ධන සැලැස්ම 2019 - 2030 | සැකසුම : ජේ ඒ එස් මදුරංග

මූලාශ්‍රය : භූගෝලිය තොරතුරු පද්ධති

2.2 සැලසුම් හා තත්ත්ව සංදර්භය

2.2.1 සැලසුම් සංදර්භය

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2050 වර්ෂය සඳහා සම්පාදිත ජාතික භෞතික සැලසුමට අනුව, මිහින්තලා නගරය අනුරාධපුර අධි නාගරික කලාපය තුළ පිහිටි නගරයක් වන අතර, නාගරික ධූරාවලියට අනුව 4 වන මට්ටමේ නගරයක් ලෙස හඳුනා ගෙන ඇත. ප්‍රාදේශීය හා කලාපිය ලෙස මිහින්තලය නගරයේ සම්බන්ධතාවය ගත් විට එය මහනුවර - යාපනය මාර්ගය හා පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය එකිනෙක ඡේදනය වන ස්ථානයේ පිහිටා ඇත. එමෙන්ම එය උතුරින් සෘජු ලෙසම වව්නියාව, යාපනය යන නගර වලට සම්බන්ධ වේ. බටහිර දෙසින් පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය ඔස්සේ සෘජු ලෙස කි.මී.13 පමණ දුරකින් අනුරාධපුර නගරය පිහිටා ඇත. නැගෙනහිර දෙසින් ප්‍රධාන නගරයක් වන ත්‍රිකුණාමලය හා සෘජු ලෙස සම්බන්ධ වේ. එමෙන්ම මහනුවර - යාපනය මාර්ගය ඔස්සේ දකුණු දෙසට දඹුල්ල හා මහනුවර නගර වලට සම්බන්ධ වන අවකාශීය පිහිටීමක් සහිත වැදගත් නගරයකි. එමෙන්ම ප්‍රාදේශීය වශයෙන් ප්‍රධාන මාර්ග ඔස්සේ මැදවච්චිය, රඹෑව, ගල්කුලම, කහටගස්දිගිලිය, ගලෙන්බිදුනුවැව වැනි ප්‍රදේශ වලට සම්බන්ධතාවයක් ඇති නගරයක් ලෙස දැක්විය හැකිය. මිහින්තලය නගරය මාර්ගස්ථ පිහිටීම තුළ පළමු මට්ටමේ නගරයක් ලෙස විශ්ලේෂණය තුලින්ද හඳුනාගෙන ඇත (සිතියම 40) එමෙන්ම ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික සේවා සපයන නගරයක් ලෙස ද හඳුනාගෙන ඇති අතර, නේවාසික හා සංචාරක මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීමේ ප්‍රවණතාවයක් ඇති බැවින්, එය ඉහළ මට්ටමේ නගරයක තිබිය යුතු ලක්ෂණ වලින්ද යුක්ත වේ. නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදි ප්‍රධාන වශයෙන්ම දැනට පවතින සංවර්ධන නැඹුරුතාවයන් හා විභවතාවයන් අධ්‍යයනය කර සංවර්ධන සැලැස්ම සැකසීම සිදු කරන ලදී. එහිදි ජාතික ප්‍රතිපත්ති හා ප්‍රාදේශීය නැඹුරුතාවය පිළිබඳව සැලකිල්ලට භාජනය කරන ලදී. ඒ යටතේ ජාතික භෞතික සැලැස්ම හා ප්‍රාදේශීය වශයෙන් පවතින කෘෂි, නේවාසික හා පුරා විද්‍යාත්මක සංචාරක කටයුතු අධ්‍යයනය කිරීම සිදු කරන ලදී. යෝජිත ව්‍යාපෘතියක් වන උතුරු අධිවේගි මාර්ගයද මෙම ප්‍රදේශයේ ආර්ථික, භෞතික සංවර්ධනයට ප්‍රබල බලපෑමක් ඇති විය හැකි බැවින්, සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදි ඒ පිළිබඳව සලකා බලන ලදි.

දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ දේශපාලන හා ආර්ථික දැක්ම මත ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීමේ උපක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කරන ලද ගම් උදාව සංකල්පය යටතේ මිහින්තලය නගරය සංවර්ධන ප්‍රදේශයක් ලෙස 1982 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරනු ලැබිණි. ඒ අනුව, මිහින්තලය නගරය, පූජා භූමි ප්‍රදේශය හා නව නගරය ලෙස කොටස් දෙකක් යටතේ සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදි. එම සංකල්පය අනුව නව නගරය සඳහා කර්මාන්ත පුරයක් ඇතුළත් කර ඇති අතර අනුරාධපුර හා තදාසන්න ප්‍රදේශ තුළ කර්මාන්ත ආශ්‍රිත රැකියා බිහි කරන ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම අරමුණු විය. කෙසේ වුවද පුරා විද්‍යා රක්ෂිතයක් වැනි සංවේදි ප්‍රදේශයක් ආසන්නයේ පිහිටීම සහ කර්මාන්ත සඳහා අවශ්‍ය වන කම්කරු හා තාක්ෂණික යෙදවීම් වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය පිළිබඳ විශ්ලේෂණයක් සිදු නොවූ බැවින්, මෙම කර්මාන්ත පුරය වර්තමානය වන විට අකර්මණ්‍යය තත්ත්වයට පත්ව ඇත. එමෙන්ම 1993 වර්ෂයේදී මිහින්තලය මංසන්ධියේ මාර්ග රථාව ද වෙනස්වීම් වලට භාජනය විය. එය මිහින්තලය පුරා විද්‍යා රක්ෂිතය මධ්‍යයෙන් හා පුරා විද්‍යා ප්‍රදේශයට ඇතුළුවීමේ ස්ථානය

ආරම්භයෙන් ගමන් කරන ආකාරයට සංවර්ධනය විය. එමෙන්ම, 1996 වර්ෂයේදී යෝජිත කර්මාන්ත පුරය වෙනුවට එහි රජරට විශ්ව විද්‍යාලය ස්ථාපිත කරන ලදී. එමඟින් බලාපොරොත්තු වූයේ ද ප්‍රදේශයේ පවත්නා යටිතල පහසුකම් ග්‍රාමීය ප්‍රදේශ වලට රැගෙන යාමත්, එමඟින් එම ප්‍රදේශය සංවර්ධනය කරා යොමු කිරීමත් ය. එමෙන්ම, කර්මාන්ත පුරය සඳහා ඉදිකරන ලද දුම්රිය මාර්ගය භාවිතා නොවීම ද පසු කාලිනව පොසොන් උත්සවය සඳහා අනුරාධපුරයේ සිට මිහින්තලය දක්වා වන්දනාකරුවන් රැගෙන යාමේ මාධ්‍යයක් ලෙස භාවිතා කිරීමට යොදාගෙන ඇත. මෙවැනි සැලසුම් ක්‍රමවේදයක් තුල මිහින්තලය නගරයේ වර්තමාන සැකැස්ම ගොඩ නැඟී ඇත. නගරයේ හදුනාගත් ගැටළු අවම කිරීමට හා විසඳීමට මෙන්ම විභවතා උපරිම ලෙස යෙදවීම ඉලක්ක ගත කරවීම විෂය කර ගනිමින් මෙම සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම සිදු කරන ලදි.

2.2.2 තත්ත්ව සංදර්භය

2015 වර්ෂයේ දී සම්පූර්ණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහනය 38000 ක් පමණ වන අතර, නිවාස ඒකක සංඛ්‍යාව 9700 ක් බව වාර්තා වී ඇත. (සිතියම 29 30) මෙම ප්‍රදේශය තුළ වාර්ෂික ජනගහන වර්ධන වේගය 1.1 ක් ලෙස වාර්තා වී ඇත. අධ්‍යයන ප්‍රදේශය තුළ ජන වාර්ගික පදනම අනුව 98% ක පමණ ප්‍රමාණයක් සිංහල වන අතර, මුස්ලිම් ජාතිකයින් දෙවන මට්ටමේ ජන වර්ගය ලෙස හදුනාගත හැකිය. අනෙකුත් ජන වර්ග අධ්‍යයන ප්‍රදේශය තුළ සැලකිය යුතු මට්ටමකින් හඳුනාගත නොහැක. එමෙන්ම ආගම් අනුව බෞද්ධ ජනගහනය 97 %ක් පමණ වන අතර, දෙවනුව හා තෙවනුව පිළිවෙලින් ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගම් අධ්‍යයන ප්‍රදේශයෙන් වාර්තා වේ. වයස් කාණ්ඩ අනුව ජනගහනය සැලකූ විට 25.66 % ක ප්‍රමාණයක් වයස අවුරුදු 18 - 35 ත් අතර, වයස් කාණ්ඩයට අයත් වේ. එමෙන්ම, 18.58% ක ප්‍රතිශතයක් වයස අවුරුදු 36 - 45 අතර කාණ්ඩයටද, වයස අවුරුදු 46 - 60 අතර කාණ්ඩයට 16.94% ක ප්‍රමාණයක් ද අයත් වේ. මේ අනුව වැඩිම ජනගහන කාණ්ඩය වන වයස අවුරුදු 18 - 35 අතර කාණ්ඩයේ ප්‍රතිශතය 25 % කට වඩා වැඩිය. (ඇමුණුම 02) මෙම ප්‍රදේශය තුළ ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු ශ්‍රම බලකායක් ඇති බව එමඟින් තහවුරු වේ. සංවර්ධන ක්‍රියාමාර්ග යෝජනා කිරීමේදී මෙන්ම, මෙම ජනගහනය ඉලක්ක කරමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඉතා වැදගත් වේ. (ඇමුණුම 02 03)

ජනාවාස රටාව පිළිබඳව විමසා බැලීමේදී මාතලේ හංදිය මිහින්තලය නගර මධ්‍යය ප්‍රදේශය, මහකනදරාව යාය 01, මහකනදරාව යාය 02, මහකනදරාව යාය 03, වැනි ප්‍රදේශ වැඩි ඝනත්වයකින් යුතු ප්‍රදේශ ලෙස හදුනාගත හැකිය. එමෙන්ම ගොඩනැගිලි ව්‍යාප්තිය සලකා බැලූ විටද මෙම ප්‍රදේශ වල ඇති තිව්‍රතාවය ඉස්මතු වී පෙනෙයි. ඉහත ප්‍රදේශ තුළ, ඉඩම් මිල වැඩි වීමේ තිව්‍රතාවයක්ද පවතින බව හදුනාගත හැකිය. කෙසේ වෙතත් මිහින්තලය ප්‍රදේශයේ විශාල ප්‍රමාණයේ ඉඩම් පැවතීම නිසා ගොඩනැගිලි ඝනත්වය මෙන්ම ඉඩම් මිල වැඩි වීමේ තිව්‍රතාවය එක සමාන ලෙස මුලු අධ්‍යයන ප්‍රදේශය පුරාම විසිරි නොමැත. (සිතියම 48) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නැගෙනහිර ප්‍රදේශ වල පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුළ ඉතා තුනී ගොඩනැගිලි ඝනත්වයක් හා අවම ඉඩම් මිලක් වාර්තා කරයි. මිහින්තලය නාගරික ප්‍රදේශයේ පවතින ඉඩම් මිල ආසන්න ලෙස රු.75 000 සිට 200 000 දක්වා පරාසයක විහිදී යන අතර, ගොඩනැගිලි

ඝනත්වය අක්කරයකට ගොඩනැගිලි 04 - 05 ත් අතර ප්‍රමාණයක් ලෙස නාගරික ප්‍රදේශයේ පමණක් වාර්තා වේ.

ප්‍රදේශයේ පවතින භෞතික හා ස්වාභාවික පරිසරය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ප්‍රධාන වශයෙන්ම මිහින්තලය පිහිටා පවතින්නේ වියළි කලාපිය දේශගුණික ප්‍රදේශයකය. එම නිසා වසරේ මාස 09 ක් වැනි විශාල කාල පරාසයක් දැඩි හිරු රැස් පතිත වන උණුසුම් දේශගුණික තත්ත්වයක් හඳුනාගත හැකිය. එහිදී සාමාන්‍ය උෂ්ණත්ව අගය ලෙස සෙල්සියස් අංශක 29 (ප්‍රස්ථාරය 6) හඳුනාගත්තද, දෛනිකව හා ස්වාභාවික පරිසර තත්ත්ව යටතේදී එය සෙල්සියස් අංශක 35 ක් ලෙස දැනෙන බව හඳුනාගත හැකිය. එමෙන්ම වසරේ මාස 03 කට ආසන්න කාලයක් ඊසාන දිග මෝසම් වර්ෂාවෙන් පෝෂණය වන අතර, එය මිලිමීටර් 1000 ක් 1500 ක් අතර, වාර්තා වේ. වර්තමානය වන විට වර්ෂාව අඩුවීම හා නියමිත කාලයට වර්ෂාව නොලැබීම යන හේතු සාදක මත ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික පසුබිම වන කෘෂි ආර්ථිකයටද බලපෑම් එල්ල වී ඇත. (ප්‍රස්ථාරය 08) එමෙන්ම ප්‍රදේශය තුළ පවතින පාංශු තත්ත්වය පිළිබඳව විමසා බැලීමේදී රතු, දුඹුරු පාංශු ස්ථරයට අයත් ප්‍රදේශයක පිහිටා තිබේ. මේ තුළින් එම ප්‍රදේශයට සුදුසු ආර්ථික රාටාව ලෙස ධාන්‍ය වර්ග සහ වී ගොවිතැන ආශ්‍රිත කෘෂිකාර්මික ආර්ථික රටාවක් ගොඩ නැගී ඇත. මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාප්තව පවතින මාර්ග පිළිබඳ පහත පරිදි හඳුනාගත හැකිය.

වගුව 1: මාර්ග ඝනත්වය

මාර්ග ඝනත්වය	ප්‍රමාණය (කි.මී)
ප්‍රධාන මාර්ග (AB)	41.94
පළාත් සභා මාර්ග (C)	28.30
ප්‍රාදේශීය මාර්ග (D)	19.55

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අනුරාධපර සිට මිහින්තලය දක්වා දිවෙන සැතපුම් 07 කින් යුක්ත දුම්රිය මාර්ගයකින්ද පවතින අතර, මෙය අශෝකපුර, සමඟිපුර හා මිහින්තලය යන උප දුම්රිය නැවතුම් ස්ථාන 03 කින් යුක්ත වුව ද, වර්තමානය වන විට පොසොන් උත්සව සමයේ පමණක් භාවිතයට ගනු ලබයි.

ප්‍රදේශයේ පවතින අනෙකුත් භෞතික යටිතල පහසුකම් පිළිබඳ අධ්‍යයනය කිරීමේදී ප්‍රධාන වශයෙන්ම නාගරික ප්‍රදේශයේ පවතින පහසුකම් වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය ඉතා වැදගත් වේ. මිහින්තලය ප්‍රදේශයේ පවතින සෞඛ්‍යය පහසුකම් සැලකූ විට මිහින්තලය ප්‍රාදේශීය රෝහල් ඒකකය හා තම්මැන්නාව ආරෝග්‍යය ශාලාව, ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යය පහසුකම් සාධනය කරනු ලබයි. මිහින්තලය ප්‍රදේශයේ සමාජයීය පැතිකඩයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ජනගහනය, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය ප්‍රධාන ස්ථානයක් ගනී. එහිදී අධ්‍යයන ප්‍රදේශය වන මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දෙස අවධානය යොමු කිරීමේදී ජනගහනයන් 60% ට වැඩි ප්‍රමාණයක් මෙම සැලසුම් සකස් කිරීම සඳහා තෝරාගත් සැලසුම් බල ප්‍රදේශය තුළ වාසය කරයි. එමෙන්ම, වසර 2030 වන විට මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 72 000 ක ජනගහනයක්ද ඉන් 48 000 ජනගහනයක් සවිස්තරාත්මක

සැලසුම් ප්‍රදේශය තුළද වාසය කරනු ඇති බවට පුරෝකථනය කර ඇත. එනම් වසර 2030 වන විට සම්පූර්ණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහනයෙන් 68 % ට වඩා ප්‍රමාණයක් සැලසුම් ප්‍රදේශය තුල ජීවත් වනු ඇත.

ජනගහන ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කිරිමේදි මිහින්තලය ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ 2001 වර්ෂය තුළ ජනගහනය 26 786 ක් වාර්තා වී ඇති අතර, ජනඝනත්වය වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 114 ලෙස අවම අගයක් පෙන්නුම් කරයි. එමෙන්ම වසර 2015 වන විට වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 158 ක් ලෙස වර්ධනය වී ඇත. එමෙන්ම හේනවත්ත. නුවරවැව යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල වැඩි ජන ඝනත්වයක් හා ඒකරාශි වීමක් දැකගත හැකිය. (සිතියම 26, 27)

අධ්‍යයන ප්‍රදේශයේ පවතින අධ්‍යාපන කටයුතු පිළිබඳ විමසා බැලිමේදි 2017 වසරේදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොඳම උසස්පෙළ ප්‍රතඵල සටහන් කිරිමට අධ්‍යයන ප්‍රදේශය සමත් විය. ආසන්නයේ පවතින ජාතික පාසැල් පද්ධතිය මෙන්ම රජරට විශ්ව විද්‍යාලය, අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශය හා පවතින තරගකාරී අධ්‍යාපන රටාව හා සම්පත් දායකත්වය වැනි සාධක රාශියක් මේ සඳහා බලපා ඇත. එමෙන්ම මිහින්තලය ප්‍රදේශය තුළ පවතින අධ්‍යාපන නැඹුරුව වෘත්තිමය අධ්‍යාපනය කෙරෙහිදි ව්‍යාප්තව ඇත. විශේෂයෙන්ම වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, අනුරාධපුර උසස් තාක්ෂණ ආයතනය, කාර්මික විද්‍යාලය, තරුණ සේවා සභාවේ වෘත්තිමය හා තාක්ෂණික වැඩමුළු හා පාඨමාලාව මඟින්, මෙම ප්‍රදේශයේ පාසැල් අධ්‍යාපනය නිම කරන සිසුන් වැඩිදුර අධ්‍යාපනය සඳහා යොමු කරයි. සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය ආදි කර්මාන්ත සඳහා අවශ්‍යය පිරිස් බලය ලබාගැනිමේදි එලෙස අධ්‍යාපනය ලබාගන්නා පිරිස අධ්‍යයන ප්‍රදේශයෙන් බැහැර වීම වර්තමානය වන විට මෙම ප්‍රදේශයට ගැටළුවක් වී පවතී. කෙසේ වෙතත් අධ්‍යයන ප්‍රදේශයේ නැගෙනහිර හා දකුණ ප්‍රදේශ වල පවතින ඉතා අවම අධ්‍යාපන යටිතල පහසුකම් මත එම ප්‍රදේශ වල සිසුන් අධ්‍යාපන කටයුතු වලින් ඉවත් වීම හා ඉහළ අධ්‍යාපනයට යොමු නොවීම ගැටළුවක් ව පවතී.

අධ්‍යයන ප්‍රදේශයේ පවතින ආර්ථික තත්ත්වය සලකා බැලිමේදි ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්මය ජීවනෝපාය කර ගත් ජනතාවක් වාසය කරනු ලබයි. මහකනදරාව ව්‍යාපාරය හරහා වී ගොවිතැන් ද අහස් දිය හා සුළු වාරි මාර්ග ඔස්සේ ගොඩ බෝග හා හේන් ගොවිතැන් සිදු කිරිම මෙම ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික රටාව වී පවති. අධ්‍යයන ප්‍රදේශයේ පවතින ප්‍රධාන ආර්ථික කටයුතු ප්‍රතිශත ලෙස දැක්වූ විට එයින් 46.7% ක් කෘෂිකාර්මික කටයුතු සඳහා ද 28% ක් පෞද්ගලික අංශයේ රැකියා නියුක්තිකයන්ද රාජ්‍ය අංශයේ නියුක්ත වූවන් පිරිස 25.3% ක් ලෙසද දැක්විය හැකිය. ප්‍රදේශයේ පවතින ශ්‍රම බලකාය පිළිබඳව අධ්‍යයනය කිරිමේදි ජනගහනයෙන් 22 057 ක් එනම් 61.19% ශ්‍රම බලකායට අයත් වේ. එය නගරයේ ආර්ථිකය වර්ධනය කිරිමට මනා පිටුවහලක් වනු ඇත. ඒ අනුව යැපෙන්නන්ගේ ප්‍රමාණය 38.81% ක් ලෙස දැක්විය හැකිය.

ඉහත සඳහන් කල කෘෂිකාර්මික ආර්ථික රටාවට අමතරව මිහින්තලය පුරා විද්‍යා ප්‍රදේශය හා ප්‍රධාන මාර්ග ආසන්නයේ සංචාරක සේවා සැපයිම ආශ්‍රිතව ආර්ථික ක්‍රියාකාරකම් හදුනාගත හැකිය. කුඩා පරිමාණයේ අවන්හල් හා හෝටල්, සුඛෝපභෝගී අවන්හල්ද දේශීය ආහාර හා ආයුර්වේද ඖෂධ ආශ්‍රිත විකුණුම් ස්ථාන ලෙසද පවත්වාගෙන යනු ලබයි.

එමෙන්ම ප්‍රදේශයේ ප්‍රධාන කෘෂිකාර්මික රටාව වන වී වගාවට අමතරව බඩඉරිගු, කුරක්කන්, කවුපි, තල, උඳු යන ධාන්‍ය වර්ග වගා කිරීම ද සිදු කරයි. නමුත් 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වී වගාව ප්‍රමුඛ කොට ගත් ආර්ථික සහනාධාර නිසා ධාන්‍ය වගාව ආශ්‍රිත හේන් වගාව 9% ක් පමණ භූමි පරිභෝජනය තුළින් අඩු වී ඇත.

ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් මට්ටම් සලකා බැලූ විට බොහෝ ජනයා රුපියල් 12 000 - රුපියල් 16 000 දක්වා මාසික ආදායමක් ලබන බව තහවුරු විය. එමෙන්ම, සැලකිය යුතු මට්ටමේ පිරිසක් රුපියල් 32 000 ට වැඩි මාසික ආදායමක් ලබන මට්ටමේ පසුවන බව තහවුරු විය. . (ඇමුණුම 03)



2.3 සැලසුම් ප්‍රදේශ සීමා නිර්ණය කිරීම

2.3.1 ක්‍රියාකාරිත්ව සීමාවන්

මිහින්තලය ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය සලකා බැලීමේදී කෘෂිකාර්මික කටයුතු හා බැඳුනු ජීවන රටාවක් දැකිය හැකිය. කෙසේ වෙතත් මිහින්තලය බල ප්‍රදේශය කොටස් දෙකකින් යුක්තව ක්‍රියාකාරි වන බව හඳුනාගනු ලැබුණු අතර, ප්‍රධාන වශයෙන්ම ආර්ථික රටාව පදනම් කරගත් ක්‍රියාවලින් දෙකක් ලෙස තහවුරු විය. බල ප්‍රදේශයේ නැගෙනහිර පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාශ වන උක්කුලංකුලම, දොරමඩලාව, බෝගහයාය, වෙල්ලාරගම, මරදන්කල්ල, කහපත්විලගම, කට්ටඹුවාගම, ඉහළගම, පොතාන, සීප්පුකුලම, තම්මැන්නාව, කසමඩුව, කටුකැලියාව, මහකනදරාව යාය 01, මහකනදරාව යාය 02, මහකනදරාව යාය 03 යන ග්‍රාම නිලධාරි කොට්ඨාශ අයත් වේ. මෙම ග්‍රාම නිලධාරි කොට්ඨාශ ක්‍රියාකාරි ලෙස මිහින්තලය නගරය හා සම්බන්ධ වේ

සිතියම 2: මිහින්තලය නගරයට සම්බන්ධ වන ක්‍රියාකාරී ප්‍රදේශ



මූලාශ්‍රය: භූගෝලීය තොරතුරු පද්ධති , නාගරික සංවර්ධන අධිකාරිය



සිතියම 3: අනුරාධපුර නගරය සම්බන්ධ ක්‍රියාකාරී ප්‍රදේශ

මූලාශ්‍රය :- භූගෝලීය තොරතුරු පද්ධති, නාගරික සංවර්ධන අධිකාරිය

දෙවන කණ්ඩායමට අයත්වන ග්‍රාම නිලධාරී කොට්ඨාශ ප්‍රධාන වශයෙන්ම ආර්ථික වශයෙන් විවිධාංගිකරණය වී පවතී. එනම් මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ජනයා සැලකිය යුතු ලෙස කෘෂිකර්මයට අමතරව සංචාරක සේවා සැපයීම පදනම් කරගත් ආර්ථිකය, පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සේවා සැපයීම මෙන්ම සැහැල්ලු කාර්මික කටයුතු වල නිරත වී සිටි. මේ තුළින් ඔවුන්ගේ ක්‍රියාකාරිත්ව සීමාව අනුරාධපුර මහ නගර සභා සීමාව මෙන් ම අනුරාධපුර නගරයට ද සම්බන්ධ වී පවතී. නුවරවැව, කුරුන්දන්කුලම, කුංචිකුලම, මිහින්තලය, රුවන්ගම, කන්නට්ටිය, නාමල්වැව යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ මෙසේ ක්‍රියාකාරී ලෙස අනුරාධපුර නගරය හා සම්බන්ධ වී පවතී.

2.3.2 භූගෝලීය සීමාවන්

මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ භූගෝලීය සීමාවන් සැලකූ විට බටහිර දිශාවෙන් නුවරවැව දක්වාද, නැගෙනහිර දිශාවෙන් ගලෙන්බිදුනුවැව හා හොරොව්පතාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ දක්වාද විහිදි ඇති විශාල කුඹුරු යායක් ළඳු කැලෑ, වන රක්ෂිත ප්‍රදේශයන්ගෙන් සමන්විතය. බල ප්‍රදේශය තුළ මහකනදරාව ජලාශයද, පිහිටා ඇත. සමස්ථයක් ලෙස මිහින්තලය ප්‍රදේශය හා අනෙකුත් සම්බන්ධිත ප්‍රාදේශීය ප්‍රදේශ අතර, භූගෝලීය වශයෙන් විශාල වෙනස්කම් හඳුනාගැනීම අවම මට්ටමක පවතී.

2.3.3 පරිපාලන සීමාවන්

මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපාලන සීමාවන් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 25 කට සීමා වේ. එහිදි අනුරාධපුර මහ නගර සභාව මගින් 2000 වසරේ සිට මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ට අයත් හේනවත්ත හා නුවරවැව ග්‍රාම නිලධාරී කොට්ඨාශද ඇතුලත් වන පරිදි සීමා ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අතර, පරිපාලන සීමාවන් සුළු වෙනස්කම් වලට භාජනය වී පවතී. එමෙන් ම උතුරින් රඹෑව ප්‍රාදේශීය සභා ප්‍රදේශයෙන්ද දකුණින් තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන්ද නැගෙනහිරින් හොරොව්පතාන හා ගලෙන්බිදුනුවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන්ද බටහිරින් අනුරාධපුර නගර සභා බල ප්‍රදේශයෙන්ද සංවෘත වූ ප්‍රදේශය තුළ මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාවන් විහිදි ඇත. සමස්ථයක් ලෙස මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇත. එම පදනම මත අධ්‍යයන ප්‍රදේශය ලෙස සියළු විශ්ලේෂණ හා අර්ථකථනයන් සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම තෝරාගත් අතර, සවිස්තරාත්මක සැලැස්ම සැකසීම සඳහා සැලසුම් ප්‍රදේශයක් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළින් තෝරා ගනු ලැබිණි.

ඉහත සියළු සාධක ඒකරාශි කර ගනිමින් හා අධ්‍යයන ප්‍රදේශයේ සියලු සමාජ, ආර්ථික , භෞතික හා පාරිසරික දර්ශකයන්ට විද්‍යානුකූල ක්‍රමයන් තුළ අගයක් නියම කිරීමෙන් සංවර්ධන පීඩන දර්ශකය ගණනය කර තිබේ. ඒ අනුව සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම සඳහා සැලසුම් ප්‍රදේශය ලෙස මිහින්තලය නාගරික සංවර්ධන බල ප්‍රදේශයේ ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාශ 25 න් 15 ක් තෝරාගෙන ඇත. ඒ අනුව

මූලික වශයෙන්ම ජනගහන ව්‍යාප්තිය, ජනගහන ඝනත්වය, නිවාස ව්‍යාප්තිය, යටිතල පහසුකම් හා එහි තත්ත්වයන් ව්‍යාප්තිය, මාර්ග සම්බන්ධතාවයන්, අවකාශීය ඒකාබද්ධ වීම, ඉඩම් වටිනාකම්, සංවේදි ප්‍රදේශ යන සියළු කාරණා ඒකාබද්ධ කර සංවර්ධන පිඩන දර්ශකය ගණනය කරමින් (සිතියම 22) ඒ අනුව මිහින්තලය ප්‍රදේශය තුල සංවර්ධනය කිරීම සඳහා වැඩිම නැඹුරුවක් ඇති ප්‍රදේශ හඳුනා ගැනිම සිදු කරන ලදි. මෙමඟින්ද තහවුරු වූයේ මංසන්ධි වලින් සමන්විත වන ප්‍රදේශය සඳහා වැඩි සංවර්ධන නැඹුරුතාවයක් දක්වන බවයි. ඒ අනුව,

හේනවත්ත (මිහින්තලය කොටස), නුවරවැව (මිහින්තලය කොටස), කුංචිකුලම, කුරුන්දන්කුලම, කන්නට්ටිය, රුවන්ගම, මිහින්තලේ, නාමල්වැව, බෝගහයාය, මරදන්කුලම, දොරමඩලාව, මහකනදරාව යාය 1, මහකනදරාව යාය 2, මහකනදරාව යාය 3, උක්කුලංකුලම යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වලින් සමන්විත මිහින්තලය සැලසුම් ප්‍රදේශයට විස්තරාත්මක සංවර්ධන සැලැස්ම පිළියෙල කෙරේ





සිතියම 4: සංවර්ධන සැලසුම් බල ප්‍රදේශය

3 නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

මිහින්තලය නගරය අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර නාගරික ප්‍රදේශයේ ආසන්නයේ පිහිටියා වූ නගරයෙකි. මෙම සංවර්ධන සැලැස්ම සැකසිමට මූළිකත්වය දුන් ප්‍රතිපත්ති හා සංකල්ප අතර, සුවිශේෂතාව (Significant) සන්දර්භය (Context) තිව්‍රතාවය (Magnitude) යන නිර්ණායක තුළ පහත කරුණු මේ සඳහා පාදක කර ගැණිනි.

මිහින්තලය සංවර්ධන සැලැස්ම සැකසිම සඳහා මූලිකත්වයක් දිමට පසුබිම වූයේ අනුරාධපුර ප්‍රධාන නගරයට ඉතා ආසන්නයෙන් පිහිටි කුඩා නගරයක් වන බැවින් ද, ජාතික තලයේ වැදගත් වන සංසිද්ධීන් රැසකට උරුමකම් පාන නගරයක් වන බැවින්, දිස්ත්‍රික්කයේ අනෙකුත් නගර වලට වඩා ප්‍රථමයෙන් සංවර්ධන සැලැස්මක් මඟින් සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍යය විය. සංචාරක ආකර්ශනයත්, දේශීය වන්දනාකරුවන්ගේ පැමිණීමත් මත ඔවුන්ට අවශ්‍ය සේවා පහසුකම් හා අංගයන් නගරය තුළ සංවර්ධනය වීම අත්‍යවශ්‍යය සාධකයක් විය. පුරාවෘත වලට අනුව බුදු දහම මෙරටට රැගෙන ආ මිහිඳු හිමියන් වැඩම කළ ස්ථානය ලෙස මිහින්තලය නගරය ප්‍රසිද්ධ වී ඇති අතර, බුදු දහම හා සම්බන්ධ විශාල ආරාම සංකීර්ණ, භාවනා කිරීමේ ස්ථාන, දාන ශාලා, පුරාණ සෙල්ලිපි, පිළිම ගෙවල් වැනි විවිධ ඓතිහාසික සාධක මඟින් ඒ බව තහවුරු වේ. මිහින්තලය රජ මහා විහාරය කේන්ද්‍ර කර ගත් පුරා විද්‍යා ස්මාරක ද දොරමඩලාව, මහකනදරාව වැනි නගරයෙන් බැහැර පිහිටි පුරා විද්‍යා ප්‍රදේශ ද සැලසුම් ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතී. එමෙන් ම, සැලසුම් ප්‍රදේශය තුළ පැතිරී ඇති ස්වාභාවික වන ලැහැබ හා වනාන්තර ප්‍රදේශ ද විශේෂිත වේ. (සිතියම 38) එම වන ආශ්‍රිත ප්‍රදේශ තුළ භාවනා යෝගි ආශ්‍රම පිහිටුවා ඇති අතර, මිහින්තලය තපෝවනය එවැනි ස්ථානයකි. සංචාරකයන් හට මෙවැනි ස්ථාන පිළිබඳව දැනුවත් භාවය ලබාගැනිමට ද, එම ස්ථාන ආශ්‍රිත පහසුකම් සංවර්ධනය කිරිමට ද පොසොන් උත්සවය වැනි ජාතික තලයේ උත්සවයක් මෙම සැලසුම් ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ගොඩනැගී ඇති බැවින්, පැමිණෙන බැතිමතුන් හට පහසුකම් සංවර්ධනය වීමද අත්‍යාවශ්‍යය සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. එමෙන් ම, බැතිමතුන් හා සංචාරකයන් හට ප්‍රදේශයේ පුරා විද්‍යා උරුමයන්ට අමතරව පාරිසරික ගුණාංග හා ලක්ෂණ අත්විඳිමට ද අවස්ථාවන් වැඩිදියුණු කිරීම ප්‍රධාන අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත. සැලසුම් බල ප්‍රදේශයේ පවතින භූමි පරිහරණ රටාවට අනුව මෙම සියළු සංවර්ධන කටයුතු සඳහා පවතින සංචාරක භූමි භාවිතයන්ගේ ප්‍රතිශතය 0.042 % වැනි ඉතා අවම ප්‍රතිශතයකි. ලෝක උරුම නගරයක් වන අනුරාධපුර පූජා නගරයට ඉතා ආසන්නයේ පිහිටි ස්ථානයක් ලෙස ද, ලොව ප්‍රථම අභය භූමිය ලෙස නම් කර ඇති මිහින්තලය අභය භූමිය වැනි ස්ථාන ද පිහිටා ඇති ප්‍රදේශය ලෙස ද, කල්පිටිය - ත්‍රිකුණාමලය වැනි ප්‍රධාන සංචාරක ප්‍රදේශයක ගමන් මාර්ගයක මධ්‍යයේ පිහිටි නගරය ලෙස ද පවතින සංචාරක විභවතාවයන් සංවර්ධනය කිරිම ප්‍රදේශයේ අත්‍යාවශ්‍යය සංවර්ධන ගුණාංගයක් ලෙස හඳුනාගෙන ඇත.

නගර සංවර්ධනයේ දී මිහින්තලය පූජා භූමිය මූලික කොට ගනිමින් හා එහි වටිනාකම සංරක්ෂණය කර ගැනිම මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ තවත් එක් අවශ්‍යතාවයකි. මිහින්තලය සැලසුම් ප්‍රදේශය

ස්වාභාවික පරිසර ප්‍රදේශ හා සංවේදී පුරා විද්‍යා රක්ෂිත සහිත ප්‍රදේශයකි. (සිතියම 25, 38) මෙයින් හෙක්ටයාර 3 500 කට ආසන්න ප්‍රදේශයක් වනාන්තර හා වන ලැහැබ ප්‍රදේශ, වැව් රක්ෂිත හා පෝෂක ප්‍රදේශ, වන වගා ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. එමෙන්ම, මිහින්තලය නගර මධ්‍යයේ මිහින්තලය අභයභූමිය, වසම්මලේ චිත්‍ර ලෙන් හා ගුහා වැනි ස්ථාන ද, දොරමඩලාව වැනි පුරා විද්‍යා ප්‍රදේශ ද ව්‍යාප්ත වී ඇත. සංවර්ධන පිඩන දර්ශකය සහ සංවේදී ප්‍රදේශ පිළිබඳ දර්ශකයට අනුව, මිහින්තලය පුරා විද්‍යා රක්ෂිතය තුළ ඉහළ සංවර්ධන පිඩනයක් හඳුනාගෙන ඇත. (සිතියම 22) වසර 2014 සිට මෙම ප්‍රදේශය තුළ සෙසු ප්‍රදේශ වලට සාපේක්ෂව උෂ්ණත්වය ඉහළ ගොස් ඇති බවට වාර්තා වන අතර, එහි අගය අනෙකුත් ප්‍රදේශ හා සැසඳීමේදී සෙල්සියස් අංශක 01 කින් පමණ වැඩි වී තිබේ. (ප්‍රස්ථාරය 06) මෙම තත්ත්වය තුළ ඉහතින් සඳහන් කළ පාරිසරික ප්‍රදේශ හා සංවේදී පුරා විද්‍යා රක්ෂිත සංරක්ෂණය කිරීම ද සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය තහවුරු කරයි. එමෙන්ම, සැලසුම් ප්‍රදේශය තුළ පවතින අක්කර 1 554 ක් පමණ වන කුඹුරු පද්ධතිය ප්‍රදේශයේ ග්‍රාමීය පරිසරයේ අංගයක් ලෙස හඳුනාගෙන ඇත. එමගින් උෂ්ණත්වය පාලනය වීමට හා ආර්ථික ක්‍රියාකාරිත්වයට අවශ්‍යය පදනම සකසන නිසා සංවර්ධන සැලැස්ම මගින් මෙම පාරිසරික අංගය සංරක්ෂණය වීම ද අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

මිහින්තලය නගරයේ වාණිජ ප්‍රදේශය ප්‍රධාන ලෙසම ස්ථානගත වී පවතින්නේ මහනුවර - යාපනය ප්‍රධාන මාර්ගය හා පුත්තලම - ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගයව හමුවන මංසන්ධිය කේන්ද්‍ර කර ගනිමින් ය. එහි ව්‍යාප්ත වීම සැලසුම් බල ප්‍රදේශයේ භූමි පරිහරණයෙන් 0.127% වැනි ප්‍රතිශතයකි. ග්‍රාම නිලධාරී කොට්ඨාශ 25 කින් සමන්විත ප්‍රදේශයේ 36 042 ක් පමණ වන ජනගහනයට නිළ පරිපාලන මධ්‍යස්ථානය වන්නේ ද මෙම නගර ප්‍රදේශයයි. එමෙන්ම, වසර 2030 වන විට අපේක්ෂිත ජනගහනය 48 000 ක් පමණ වන බැවින්, වාණිජ ප්‍රදේශ තව දුරටත් ව්‍යාප්ත විය යුතු වුවද ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත්තේ නගර මධ්‍යයේ පුරා විද්‍යා රක්ෂිත ඉඩම් විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වී පැවතීමයි. මිහින්තලය නගර මධ්‍යයෙන් අක්කර 590 ක ප්‍රදේශයක් පුරා විද්‍යා රක්ෂිතය ලෙස වෙන්වී ඇත. එම රක්ෂිතය තුළ දැනට මිහින්තලය රෝහල වැනි සේවා ස්ථාන ද පිහිටා ඇත. මෙම තත්ත්වය තුළ වාණිජ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍යය විවිධ සේවාවන් නගරය තුළ ව්‍යාප්ත වීමට අවකාශය අවම බැවින්, ප්‍රදේශයේ ජනතාව වාණිජ අවශ්‍යතාවයන් සඳහා අනුරාධපුර නගරය වෙත ගමන් කිරීමට සිදු වී ඇත. විශේෂයෙන්ම රජරට විශ්ව විද්‍යාලයේ සිසුන්ගෙන් 70% කට වැඩි පිරිසක් අනුරාධපුර නගරය වෙත ගමන් කරයි. මේ තුළින් මිහින්තලය නගරයේ සංවර්ධනයට මෙන් ම විශ්ව විද්‍යාලය පිහිටුවීම මගින් බලාපොරොත්තු වූ ප්‍රාදේශීය සංවර්ධනයන් සිදුනොවීම හඳුනාගෙන ඇත.

මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නියඟය තුලින් විශාල වශයෙන් පීඩාවට ලක්වන තත්ත්වයක් දැක ගත හැකිය. වියළි කලාපයේ පිහිටි නගරයක් හා ප්‍රදේශයක් ලෙස වර්ෂාපතනය සීමිත කාලයක් තුල ලැබෙන නිසාත්, වැඩි වශයෙන් කෘෂිකාර්මික කටයුතු අහස් දිය මත පදනම් වන නිසාත් මෙම බලපෑම් වඩාත් තීව්‍ර වී ඇත. එමෙන් ම මෙහි ඇති මහකනදරා වැව ඇතුළු සියළුම වැව් අහස් දියෙන් පෝෂණය වන අතර, අවුරුද්දේ එක් කාලයක් තුල අනිවාර්‍යය නියඟ තත්ත්වයකට මුහුණ දීමට සිදු වේ. (ඇමුණුම 04) මෙම තත්ත්වය තුල කෘෂිකාර්මික කටයුතු වලදී වෙනත් ජල සම්පාදන ක්‍රම වලට යොමු

වීමට සිදු වී ඇත. වගා ළිං කැපීම ප්‍රදේශයේ බහුලව දැක ගත හැකිය. බිමට ලබා ගන්නා ජල මූලාශ්‍ර වලට කෘෂිකාර්මික රසායන ද්‍රව්‍යයන් මිශ්‍ර වීම නිසා ප්‍රදේශයේ වකුගඩු රෝගය ව්‍යාප්ත වී ඇති බවට වාර්තා වී ඇත. විශේෂයෙන් ම දොරමඩලාව, මහකනදරාව යාය 01, මහකනදරාව යාය 02, මහකනදරාව යාය 03, උක්කුලංකුලම, බෝගහයාය, නාමල්වැව, මරදන්කුලම යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල සාපේක්ෂ ලෙස මෙම රෝගය ඉහළ මට්ටමකින් ව්‍යාප්ත වී ඇත. රජරට විශ්ව විද්‍යාලය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් කර ඇති පර්යේෂණයන්ට අනුව කෘෂිකර්මය සඳහා භාවිතා කරන රසායනික පොහොර වල ඇති ආසනික් ජලයට මිශ්‍ර වීම නිසා මෙම රෝගි තත්ත්වය ව්‍යාප්ත වන බවට හඳුනාගෙන ඇත. එමෙන් ම දැනට ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් තුරුවිල ජල පොම්පාගාරය හා ජලාශය මඟින් මිහින්තලය නගර ප්‍රදේශයට පානීය ජල පහසුකම් සැපයුවද, අනෙකුත් ප්‍රදේශ වල ග්‍රාමීය ළිං මඟින් පානීය ජල අවශ්‍යතාවය සපුරා ගනු ලබයි. ඉහතින් සඳහන් කරන ලද ග්‍රාම නිළධාරී කොට්ඨාශ වල ප්‍රධාන ජල මූලාශ්‍ර වලට අමතරව භාවිතා කරන ප්‍රජා මූල ජල ව්‍යාපෘති මඟින් ලබා දෙන ජලයේ ගුණාත්මක භාවය අවම වීම නිසා ජලයේ ආම්ලිකතාවයේ ඉහළ යාමක් ද හඳුනාගත හැකිය. දැනට එම ප්‍රදේශ වල භූමි පරිහරණ රටාවේ බහුලව හඳුනාගත හැකි සංවර්ධන කාර්යය වනුයේ නේවාසික සංවර්ධනයන් ය. සැලසුම් ප්‍රදේශයේ හඳුනාගත් නේවාසික ප්‍රදේශ හෙක්ටයාර 3 111 ක ප්‍රදේශයෙන් ප්‍රධාන ජල සැපයුමට සම්බන්ධ වී ඇති ප්‍රදේශය 36% ක් පමණ වේ. එනම් දැනට ගුණාත්මක ජල ප්‍රභවයක් හා සම්බන්ධ නොවන නේවාසික ප්‍රදේශ 64% ක් පමණ සැලසුම් ප්‍රදේශය තුළ පවතී. එමෙන් ම වසර 2030 වන විට හඳුනාගත් නව සංවර්ධන ප්‍රදේශ ද සලකා බැලූ විට සැලසුම් බල ප්‍රදේශයේ පවතින ජල පහසුකම් සංවර්ධනය කිරීම ද මෙම සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය පිළිබිඹු කරයි.

2030 භෞතික සැලසුමට අනුව උතුරු මැද අධි නාගරික ප්‍රදේශයට ඇතුලත් වන මිහින්තලය සැලසුම් ප්‍රදේශය යෝජිත 2050 භෞතික සැලැස්මට අනුව, අනුරාධපුර මහ නගර ප්‍රදේශයට ද අයත් වේ. මෙවැනි නාගරික ප්‍රදේශයක දී සංවර්ධිත මාර්ග ජාලයක් තිබීම අත්‍යවශ්‍යය සාධකයකි. නමුත්, වර්තමානය වන විට සැලසුම් බල ප්‍රදේශය තුළ මාර්ග ඝනත්වය වර්ග කිලෝමීටරයකට කිලෝමීටර් 1.59 කි. එමෙන් ම ප්‍රාදේශීය සහා මාර්ග ඇතුළුව සමස්ථ මාර්ග ජාලයේ දිග කිලෝමීටර් 339 කි. අනුරාධපුර මහ නගර සහා බල ප්‍රදේශයට ආසන්නතම ප්‍රදේශයක් ලෙස මෙය ඉතා දුර්වල තත්ත්වයකි. අනුරාධපුර මහ නගර සහා බල ප්‍රදේශයේ වර්ග කිලෝමීටර් 42 ක් තුළ කිලෝමීටර් 714 ක් පමණ දීර්ඝ වූ මාර්ග ජාලයක් ව්‍යාප්තව පවතී. නමුත්, මිහින්තලය ප්‍රදේශයේ දැනට සංවර්ධන කටයුතු සඳහා යොදා ගත් හේක්ටයාර 3 111 කට (සිතියම 32) පවතින්නේ ඉහත සඳහන් කිලෝමීටර් 339 ක මාර්ග පද්ධතියක් වේ. තවදුරටත් හඳුනාගත් පරිදි මෙම පවතින මාර්ග පද්ධතිය ද නේවාසික ප්‍රදේශ හා නගර මධ්‍ය ප්‍රදේශ සම්බන්ධ වන අයුරින් සංවර්ධනය වී නොමැත. (සිතියම 45) බොහෝ මාර්ග ප්‍රාථමික මට්ටමක පවතින අතර, දුරස්ථ ලෙස පවතින නේවාසික ප්‍රදේශ දක්වා ගමන් කර එම ප්‍රදේශයෙන්ම අවසන් වන බැවින්, තවත් නේවාසික ප්‍රදේශයක් සම්බන්ධ නොකරයි. එබැවින් නේවාසික ප්‍රදේශ හුදෙකලා වී ඇති අතර, මෙය නළ ජල පද්ධති සංවර්ධනය කිරීමේ දී අතිරික්ත පිරිවැයක් දැරීමට සිදු වී ඇති තත්ත්වයකි. දැනට නේවාසික කටයුතු සංවර්ධනය වී ඇති ප්‍රදේශ මෙන්ම 2030 වන විට නේවාසික කටයුතු ව්‍යාප්ත කිරීමට විභවතාවයක් පවතින ප්‍රදේශ ලෙස හඳුනාගත් හෙක්ටයාර 1 500 කට ආසන්න ප්‍රදේශය සඳහා මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පැන නැගි ඇත. (සිතියම 39)

සැලසුම් ප්‍රදේශය තුළ වර්තමානයේදී හඳුනාගත් භූමි පරිභෝජන රටාව වන නේවාසික සංවර්ධනය, 2001 දී නිවාස ඒකක 6 541 කින් සමන්විත වූ අතර, 2012 වර්ෂය වන විට නිවාස ඒකක 9 435 ක් දක්වා වර්ධනය විය. නව සංවර්ධන කටයුතු සඳහා ඉදිරිපත් කරන ගොඩනැගිලි අයදුම්පත් වර්ගිකරණය කිරීමේ දී නේවාසික සංවර්ධනයන් සඳහා වැඩි නැඹුරුතාවයක් ද පවතින බව මිහින්තලය ප්‍රාදේශීය සභාවේ තොරතුරු අනුව පැහැදිලි වේ. එම තොරතුරු අනුව කුරුන්දන්කුලම, හේනවත්ත, නුවර වැව, කුංචිකුලම වැනි ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල වැඩි වශයෙන් ද නව නේවාසික අනුබෙදුම් සඳහා අයදුම්පත් ලැබෙන බව හඳුනාගෙන ඇත. මිහින්තලය නගර මධ්‍යයේ ද සැලකිය යුතු ලෙස නේවාසික සංවර්ධනයන් සඳහා නැඹුරුතාවයක් පවතින බව හඳුනාගෙන ඇත. (සිතියම 29, 30, 33) මේ අනුව එම ප්‍රදේශ වල නේවාසික භාවිතයන් සඳහා අවශ්‍යය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හඳුනාගෙන ඇත.

නගරයේ විවිධ පාර්ශවකරුවන් හා ආයතන මගින් හඳුනාගත් ගැටලු වලට විසඳුමක් ලෙසද නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය හඳුනාගන්නා ලදි. විධිමත් නගර සැලසුමක් නොමැති වීම මත මෙවැනි ගැටලු පැන නගින බව අවධාරණය කිරීමද මෙම නගර සංවර්ධන සැලැස්ම පිළියල කිරීමට පෙලඹවීමක් විය. එමෙන්ම ප්‍රාදේශීය ලෙස අධ්‍යාපන හා නේවාසික පහසුකම් සපයන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇතත්, දැනට පවතින සංවර්ධන කාර්යයන් නිසි නගර සංවර්ධන සැලැස්මකට අනුකූලව සිදු නොවීම නිසා නගරය තුළ සුමට ක්‍රියාකාරිත්වය ගිලිහී ගොස් අපහසු රළු නාගරික පාරිසරික තත්ත්වයක් ගොඩ නැගි ඇත. සංචාරක සේවා සැපයීම හරහා කෘෂිකර්මය තුළින් ලබාගත් ආදායම් මට්ටමට වඩා වැඩි ආදායම් මට්ටමක් ලබා ගත හැකි වීම තුළ එවැනි ප්‍රදේශ ආශ්‍රිතව කෘෂිකාර්මික ප්‍රදේශ වලට සාපේක්ෂව යටිතල පහසුකම් ද සංවර්ධනය වී ඇත. මාර්ග ජාලය ඒ අතරින් ප්‍රධාන වේ. මෙම නිසා එම ප්‍රදේශ ආශ්‍රිතව ජනතාව ඒකරාශි වීම දැකගත හැකිය. මිහින්තලය මංසන්ධියේ සිට අනුරාධපුර දෙසට පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයේ මෙලෙස ව්‍යාප්ත වූ ජනාවාස රටාවක් හඳුනාගත හැකිය. (සිතියම 24) මෙලෙස ආදායම් ලබා ගැනීමේ හැකියාව, යටිතල පහසුකම් කරා පහසුවෙන් ළඟා වීමේ හැකියාව මත මිහින්තලය මංසන්ධිය ආශ්‍රිතව අනවසර ඉදිකිරීම් සම්බන්ධව ගැටළුව ද හඳුනා ගත හැකිය.

එමෙන්ම, අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශයේ සිදුවන ජනගහනය පිටත ප්‍රදේශ කරා ඇදි යාමේ ප්‍රවණතාවය හඳුනාගත් බැවින් එම ජනගහනයට වඩාත් සැලසුම් සහගත තත්ත්වයක් යටතේ නේවාසික පරිසරයක් ගොඩ නැගීමද මිහින්තලය සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේ එක් අවශ්‍යතාවයක් ලෙස හඳුනා ගැනිනි. වසර 2001 දී 56 632 ක ජනගහනයක් අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශයෙන් වාර්තා වූ අතර, වසර 2011 දී 52 007 ජනගහනයක් වාර්තා විය. ශීඝ්‍ර නාගරීකරණයත් සමග නේවාසික ජනගහනය අනුරාධපුර නාගරික ප්‍රදේශයෙන් ඉවත් වී යාබද ප්‍රදේශ වලට ඒකරාශි වීමක් දක්නට ඇති අතර, මෙසේ නේවාසික ජනගහනය වර්ධනය වීමේ ශීඝ්‍රතාවය -0.00848 ක් ලෙස හඳුනාගෙන ඇත. අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශයෙන් ඉවත් වන ජනයා විජයපුර ප්‍රදේශයේ නේවාසික පහසුකම් සපයා ගන්නා අතර, විජයපුර ප්‍රාදේශීය සභාවට අයත් නගර සභා සීමාවට ආසන්නයේම පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ජනගහනය ඉහළ යාම හා භූමි වටිනාකම් ඉහළ යාම තුළින් ඒ බව නිරීක්ෂණය

වේ. විශේෂයෙන්ම 2001 වර්ෂයේදී පර්චසයක් රුපියල් 29 500 ත් රුපියල් 46 500 ත් අතර පැවති නමුත් ජනගහනය වැඩිවීමත් සමග එම ප්‍රාදේශීය සභාවේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ඉඩම් මිළ 2016 වර්ෂය වන විට පර්චසයක් රුපියල් 181 000 ත් රුපියල් 296 000 ත් අතර, දක්වා ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය කල හැකි විය. කෙසේ වෙතත් වර්තමානය වන විට මිහින්තලය සැලසුම් බල ප්‍රදේශයේ උපරිම ඉඩම් මිළ සීමාව ලෙස සටහන් වනුයේ පර්චසයක් රුපියල් 200 000 සීමාව වේ. ඒ අනුව සැලසුම් බල ප්‍රදේශය තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින්, අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශයෙන් පිටතට ඇදී යන ජනතාව මිහින්තලය සැලසුම් බල ප්‍රදේශය තුළ පදිංචි වීම ධෛර්යමත් කිරීමද මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ එක් අවශ්‍යතාවයක් ලෙස හඳුනා ගන්නා ලදි. (සිතියම 48, 36, 37)

දෙවන කොටස

අමාත්‍ය අනුමැතිය



ගැසට් නිවේදනය – (1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ සංශෝධිත පනත අනුව)



4 සංවර්ධන සැලසුම් රාමුව

4.1 දැක්ම

සංස්කෘතික උල්පතේ නේවාසික උද්‍යානය

4.2 දැක්මේ ප්‍රකාශනය

මිහින්තලය සංවර්ධන සැලැස්මේ අනාගත දැක්ම වන්නේ සංස්කෘතික උල්පතේ නේවාසික උද්‍යානය යන්නයි. මෙයින් ගම්‍ය වන සංකල්පය වන්නේ බෞද්ධ සංස්කෘතිය නම් වූ උල්පත මගින් ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරය හැඩගස්වමින් දියුණු සභ්‍යත්වයක් ලඟා කර ගැනීමට අතීතයේදී හැකි වූවාක් මෙන් වර්තමානයේදී ද එම බලපෑම මත සංවර්ධනය කරා ලඟා වන උද්‍යානයක් වැනි නේවාසික නගරයක් යන අදහසයි. මෙහිදී උද්‍යානය යන අදහස යොදා ගනු ලබන්නේ සංස්කෘතික උල්පතින් පෝෂණය වන යන අදහස උද්දීපනය වන ලෙසයි.

නේවාසික උද්‍යානය යන අදහස මගින් තහවුරු කරනු ලබන්නේ අනාගතයේදී මිහින්තලය නගරය නේවාසික පහසුකම් සපයන නගරයක් බවට පත්විය යුතුය යන අදහසයි. මෙම දැක්ම ලඟා කර ගැනීම සඳහා සංවර්ධන සැලැස්ම මගින් සංවර්ධන උපාය මාර්ග ආරම්භ කරනු ලබයි. ඒ අනුව අනාගතයේදී මෙම ප්‍රදේශය නේවාසික භූමි පරිහරණයකට වඩාත් සුදුසු ආර්ථික, භෞතික, සමාජීය, පාරිසරික ලක්ෂණ වලින් සමන්විත වේ. එම ලක්ෂණ අතර, ප්‍රධානත්වයක් ගනු ලබන්නේ එදිනෙදා අවශ්‍යයම භෞතික පහසුකම්, සෞඛ්‍ය, අධ්‍යාපනය, විවෘත ප්‍රදේශ, විනෝදාස්වාද ප්‍රදේශ, ජලය හා විදුලිය යන සියලු අංගයන්ගෙන් සමන්විත ප්‍රදේශයක් වන අතර මෙම ලක්ෂණ වලින් සපිරි ප්‍රදේශය නේවාසික උද්‍යානයක් යන දැක්මට අනුකූල වේ. එනම් මිහින්තලය ප්‍රදේශයේ දැනට පවතින ඉතා පෞරාණික බෞද්ධ උරුමයන් හා ඉතා විශාල වටිනාකමකින් යුක්ත ස්වාභාවික වෘක්ෂලතා කලාප මනා ලෙස සංරක්ෂණය කරමින් නේවාසික පරිසරයක් නිර්මාණය කර ගන්නා නගරයක් බවට පත් කිරීමයි. මෙහිදී සෙවන සහිත බිම් ප්‍රදේශ එනම්, වෘක්ෂලතා ගහණ ප්‍රදේශ නේවාසික ප්‍රදේශයක තිබිය යුතු ලක්ෂණයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව, නේවාසික නගරයක් කරා යාමේදී උරුමයන් හා පාරිසරික සබඳතා සංරක්ෂණය වීම අනිවාර්යය සාධකයකි. මෙය ප්‍රදේශයේ පවතින නියඟය හා දැඩි උණුසුම් සහිත දේශගුණය සමනය කිරීමටද ඉවහල් වන සාධකයක් වන බැවින් උරුමයන් හා පාරිසරික සබධතා සංරක්ෂණය වූ නගරයක් යන දැක්මට ඉලක්ක කර ගත හැකිය. එමෙන්ම ජීවත් වීමට සුදුසු පරිසරය සංරක්ෂණය කිරීම තුළින් ළඟාකර ගත හැකිය. ඒ අනුව යමින් දැක්ම යථාර්යක් බවට පත් කර ගැනීමට පවතින පාරිසරික ගුණාංග එලෙසම පවත්වාගෙන යාම මෙම සැලැස්මේ ප්‍රධාන ගුණාංගයකි. එමෙන්ම, සංවර්ධනය ඉලක්ක කර ගනිමින් ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කර පරිසරාත්මක ප්‍රවේශයක් තුළින් නේවාසික නගර සංවර්ධනයක් ලඟා කර ගැනීම දැක්ම වේ.



4.3 අරමුණ

වසර 2030 වන විට නේවාසික කටයුතු සඳහා අනුරාධපුර අධි නාගරික කලාපයේ ඇති හොඳම ප්‍රදේශය බවට පත් වීම.

ඉහතින් විස්තර කල දැක්මට අනුව මිහින්තලය නේවාසික නගරයක් යන දැක්මට අනුගතව මෙම සංවර්ධන සැලැස්මේ එක් අරමුණක් ලෙස නේවාසික ප්‍රදේශයක් සංවර්ධනය කිරීම දැක්විය හැකිය. මෙම නේවාසික කලාපය නිර්මාණය වීමේදි එය 100% ක් පදිංචි නිවාස සඳහා පමණක් ඉඩ ලබා නොදේ. එනම් මෙම කලාපය තුළ ඕනෑම ස්ථානයක නේවාසික කටයුතු සඳහා සුදුසු පරිසරයක් සහිත සියළු පහසුකම් වලින් සමන්විත ප්‍රදේශයක් සංවර්ධනය වේ. මෙම නේවාසික ප්‍රදේශය මාතලේ හංදිය, මිහින්තලය නගරය හා රඹෑව නගර සීමාව දක්වාම විහිදෙන අතර, ඉහත සඳහන් කල ප්‍රදේශයෙන් මායිම් වන පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය හා මහනුවර - යාපනය මාර්ගය කේන්ද්‍ර කරගනිමින් නේවාසික නගරයේ ව්‍යාප්තියක් අදහස් කෙරේ. මෙම නේවාසික කලාපය තුල ඉහත සඳහන් කල විනෝදාස්වාද ප්‍රදේශ, පුරා විද්‍යා ප්‍රදේශය හා වාණිජ කටයුතු ප්‍රදේශ හඳුනාගත හැකිය. නේවාසික කටයුතු සඳහා මේ වන විට හඳුනාගෙන ඇති නමුත් යටිතල පහසුකම් සංවර්ධනයේදි අනෙකුත් සේවා සැපයිමද මෙහි ප්‍රමුඛ කාර්යයන් වේ. ඒ අනුව මෙම ප්‍රදේශය තුළ නේවාසිකයින්ට අවශ්‍ය සියළුම සේවා සැපයිම ප්‍රධාන කාර්යයකි.

4.4 පරමාර්ථ

රූපසටහන 2: අරමුණු සහ පරමාර්ථ



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය

5. ශක්‍යතා, දුබලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ විශ්ලේෂණය

වසර 2030 වන ට නේවාසික කටයුතු සඳහා අනුරාධපුර අධි නාගරික කලාපයේ ඇති හොඳම ප්‍රදේශය බවට පත් වීම.

රූපසටහන 3: ශ.දු.අ.ත විශ්ලේෂණය

1. ශක්තීන්

1 ප්‍රදේශය පුරා නේවාසික කටයුතු වලට සුදුසු පරිසරයක් සහිත ප්‍රදේශ පැවතීම.

2 අධ්‍යාපන පහසුකම් නේවාසික සංවර්ධනයට අවශ්‍යය පරිදි ප්‍රමාණාත්මක මට්ටමේ පැවතීම.

3 මිහින්තලය ප්‍රදේශය තුළ සංචාරක කටයුතු ඉහළ නැංවීම හරහා නේවාසිකයින්ට ආදායම් ලැබීමට හැකි වීම.

4 වැඩිම වේගයකින් වර්ධනය වී ඇති භූමි පරිභෝග රටාව නේවාසික බිම් ප්‍රදේශ වීම.

5 නේවාසික ප්‍රදේශයකට අවශ්‍ය වන හරිතමය පරිසරයක් පැවතීම

6 මිහින්තලය ප්‍රදේශය සමස්තයක් ලෙස තැනිතලා බිම් ප්‍රදේශයක් වීම.

2.දුර්වලතා

1 රජරට විශ්ව විද්‍යාලය ප්‍රදේශයේ සංවර්ධනය සඳහා සක්‍රිය ලෙස දායක නොවීම.

2 බීමට ගත හැකි මට්ටමේ ජල පහසුකම් සීමිත ප්‍රදේශයට පමණක් ව්‍යාප්ත වී පැවතීම.

3 ප්‍රදේශයේ පවතින සෞඛ්‍ය සේවාවන්හි දුර්වලතා.

4 මිහින්තලය ප්‍රදේශය තුළ සාපේක්ෂව වැඩි උෂ්ණත්වයක් වර්ධනය වීම.

5 නේවාසිකයින්ට අවශ්‍යය පහසුකම් හා සේවා සපයන නාගරික ප්‍රදේශයක් නොමැති වීම.

6 මාර්ග පද්ධතියේ දුර්වල සම්බන්ධතාවයන්.

7 දැනට පවතින නේවාසික ප්‍රදේශ එකිනෙකට ඉතා දුරින් පිහිටීම නිසා යටිතල පහසුකම් සැපයීම දුෂ්කර වීම.

3. අවස්ථාවන්

1. 2050 ජාතික භෞතික සැලැස්මට අනුව අනුරාධපුර මහා නාගරික ප්‍රදේශයක් වීම

2. මහ නගර සභා බල ප්‍රදේශයේ භූමි පරිහරණය අනුව එහි පවතින එකිනෙකට සංයුක්ත වූ නේවාසික අවකාශය

3. අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශයේ දැනට ජීවත් වන ජනගහන ක්‍රමයෙන් අඩු වීම

4.තර්ජන

1 විජයපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහ නගර සභාවට ආසන්නම ග්‍රාම නිලධාරී කොට්ඨාශ වලට, ශීඝ්‍ර ලෙස මහ නගර සභාවේ සිට ඉවතට පැමිණෙන ජනතාව පදිංචි වීම.

2 සංචාරකයින් ප්‍රදේශය නැරඹීම සඳහා පමණක් මිහින්තලයට පැමිණීම.

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය

5.1 ශක්තීන්

5.1.1 ප්‍රදේශය පුරා නේවාසික කටයුතු වලට සුදුසු පරිසරයක් සහිත ප්‍රදේශ පැවතීම.

මිහින්තලය සැලසුම් ප්‍රදේශය තුළ දැනට පවතින ප්‍රධානම භූමි පරිභෝග රටාව වන්නේ නේවාසික භාවිතාවන්ය. සම්පූර්ණ සැලසුම් බල ප්‍රදේශය හෙක්ටයාර 8 337.79 ක් වන අතර, එයින් දැනට හෙක්ටයාර 3 111 ක ප්‍රදේශයක් නේවාසික කටයුතු සඳහා යොදාගෙන ඇත. එමෙන්ම තවත් හෙක්ටයාර 1 327 ක ප්‍රමාණයක් සෘජු ලෙසම නේවාසික කටයුතු සඳහා සංවර්ධනය කල හැකි ඉඩම් ලෙස නේවාසික භාවිතයන් සඳහා සුදුසු ප්‍රදේශ පිළිබඳ විශ්ලේෂණයේ දී හඳුනාගෙන ඇත. එමෙන්ම වසර 2030 වන විට අපේක්ෂිත ජනගහනය හා දැනට සැලසුම් ප්‍රදේශයේ සිටින ජනගහනය සලකා බැලූ විට, වසර 2030 දි මෙම සැලසුම් ප්‍රදේශයට 48 000ක ජනගහනයක් අපේක්ෂා කරන අතර, වර්තමානයේ 24 600 ක ජනගහනයක් වාසය කරති. ඒ අනුව වර්තමානය වන විට හෙක්ටයාර එකක් තුළ ජීවත් වන පුද්ගලයන් ප්‍රමාණය ආසන්න ලෙස 8 ක් වශයෙන් සැලකිය හැකි අතර, වසර 2030 වන විට එය හෙක්ටයාරයකට පුද්ගලයන් ආසන්න වශයෙන් 11 ක් ලෙස පුරෝකථනය කර ඇත. දැනට පවතින නේවාසික බිම් ප්‍රදේශ හෙක්ටයාර 3 111 ට අමතරව, ඉහත සඳහන් කරන ලද හෙක්ටයාර 1 327 සලකා බැලූ විට මෙම තත්ත්වය ප්‍රදේශය තුළ පවතින බව පැහැදිලි වේ. මේ අනුව මිහින්තලය සැලසුම් ප්‍රදේශය තුළ එක් පුද්ගලයෙකුට වර්ග අඩි 9 785.36 පමණ බිම් වපසරියක් නේවාසික කටයුතු සඳහා යොදාගත හැකිය. (සිතියම 39)

5.1.2 අධ්‍යාපන පහසුකම් නේවාසික සංවර්ධනයට අවශ්‍යය පරිදි ප්‍රමාණාත්මක මට්ටමේ පැවතීම.

සැලසුම් බල ප්‍රදේශය තුළ 1 : 13 ගුරු සිසු අනුපාතයක් පවතින අතර, දිස්ත්‍රික්කය තුල එය 1 : 16 ගුරු සිසු අනුපාතයක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය 2030 වසර සඳහා අපේක්ෂිත ජනගහනය හා සසඳන විට ප්‍රමාණාත්මක අධ්‍යාපන සේවාවක් සැපයිමට හැකි මට්ටමකි. වසර 2030 වන විට ශිෂ්‍යය ජනගහනය 4800 ක් ලෙස පුරෝකථනය කර ඇත. (සිතියම 41) එමෙන්ම, ඉතා ආසන්නයේ පවතින ජාතික පාසැල් පද්ධතිය ද මෙම ප්‍රදේශයේ ඉහළ අධ්‍යාපනික රටාවකට ගුණාත්මක දායකත්වයක් දැක්විය හැකි වන අතර, නාගරික බල ප්‍රදේශයේ මිහින්තලේ මහා විද්‍යාලය, පතිරාජ තෙන්නකෝන් ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය හා මිහින්තලේ මුස්ලිම් විද්‍යාලය මිහින්තලය ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුල ද, කුරුන්දන්කුලම විද්‍යාලය සහ කම්මලක්කුලම විද්‍යාලය කුරුන්දන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ ද පිහිටා තිබේ.

මිහින්තලේ නාගරික බල ප්‍රදේශය තුල පවතින අධ්‍යාපන ආයතන

වගුව 2: මිහින්තලය නාගරික ප්‍රදේශය තුළ පවතින අධ්‍යාපන ආයතන

පාසලේ නම	මාධ්‍ය	ශිෂ්‍ය සංඛ්‍යාව	ගුරුවරු සංඛ්‍යාව	ගුරු ශිෂ්‍ය අනුපාතය
(1) කුරුන්දන්කුලම විදුහල	සිංහල	147	22	1: 07
(2) කම්මලක්කුලම විදුහල	සිංහල	178	16	1: 11
(3) මිහින්තලේ මහ විදුහල	සිංහල	1200	65	1: 19
(4) පතිරාජ තෙන්නකෝන් ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය	සිංහල	882	40	1: 22
(5) මිහින්තලේ මුස්ලිම් විදුහල	දෙමළ	49	09	1: 05
එකතුව		**2456**	**152**	**1: 16**

මූලාශ්‍රය - ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - මිහින්තලය

මීට අමතරව අදාල ප්‍රදේශයේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි පුර්ව ළමා විය සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන පෙර පාසැල් ද ස්ථානගත වී තිබෙන අතර, අනුරාධපුර නාගරික ප්‍රදේශයේ පවතින නිවත්තකචේතිය විද්‍යාලය, අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය, සහිරා විද්‍යාලය, ස්වර්ණපාලි බාලිකා විද්‍යාලය, ඩී.එස්.සේනානායක ප්‍රාථමික විද්‍යාලය, ශාන්ත ජෝශප් විද්‍යාලය වැනි ප්‍රධාන ගණයේ පාසැල් වල මිහින්තලය සැලසුම් බල ප්‍රදේශයේ ජීවත් වන 40% කට නොඅඩු ශිෂ්‍යය ප්‍රතිශතයක් ඉගෙනුම ලබයි. මෙය ද අධ්‍යාපනයේ ගුණාත්මක මට්ටම ඉහළ යාමට හා තරඟකාරී අධ්‍යාපන රටාවක් සැලසුම් ප්‍රදේශය තුළ ගොඩනැගීමට හේතු සාධක වී ඇත. මිහින්තලය සැලසුම් බල ප්‍රදේශයේ නුවරවැව, හේනවත්ත, කන්නට්ටිය, කුරුන්දන්කුලම, කුංචිකුලම යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල සිසුන් මෙම ජනප්‍රිය පාසල් වල ඉගෙනුම ලබන අතර, සැලසුම් බල ප්‍රදේශයේ ඇති අනෙකුත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුළ සිසුන් ඉහත වගු අංක 02 හි සඳහන් කරන ලද මිහින්තලය ප්‍රදේශයේ පාසැල් වල අධ්‍යාපනය ලබයි.

5.1.3 මිහින්තලය ප්‍රදේශය තුළ සංචාරක කටයුතු ඉහළ නැංවීම හරහා නේවාසිකයින්ට ආදායම් ලැබීමට හැකි වීම

මිහින්තලය නගරය පිහිටා ඇත්තේ මහනුවර - යාපනය මාර්ගය, පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය, යන ප්‍රධාන මාර්ගයන් කේන්ද්‍ර කර ගනිමින්ය. එමෙන්ම කල්පිටිය - ත්‍රිකුණාමලය සංචාරක ගමන්මග මිහින්තලය නගරය හරහා ගමන් කරන අතර, අනුරාධපුර - රඹෑව ප්‍රධාන මාර්ගයද, මිහින්තලය නගරයේ සිට ඉතා සුළු කාලයකින් ගමන් කල හකි දුරකින් පිහිටා තිබේ. ඒ අනුව, මහනුවර - යාපනය මාර්ගය හා අනුරාධපුර - රඹෑව මාර්ගය මාර්ග ඔස්සේ මන්නාරම සහ යාපනය සංචාරක ගමනාන්ත කර ළඟා වීමට මිහින්තලය නගරය තුළින් ප්‍රවේශ විය හැකිය. වර්තමානය වන විට දඹුල්ල - සීගිරිය - හබරණ සංචාරක කේන්ද්‍ර නගර එහි උපරිම මට්ටමට ළඟා වී ඇති බැවින් තවදුරටත් සංචාරකයන් උද්දීපනය කිරීම එහි පැවැත්මට හානිකර බවට හඳුනාගෙන ඇති නිසාත්, මෙවැනි විකල්ප සංචාරක නැඹුරුවක් ඇති ගමන් මාර්ගයක පිහිටා ඇති නිසාත්, ප්‍රධාන සංචාරක ආකර්ශනීය නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පවතී. (ඇමුණුම 6)

මිහින්තලය නගරය ශ්‍රී ලංකාව තුළ මෙන්ම අනෙකුත් බෞද්ධ රටවල ප්‍රසිද්ධව පවතින්නේ පොසොන් උත්සවය ප්‍රධාන කොටගෙනය. පොසොන් සමය තුළ මිහින්තලය නගරයට 50 0000 ක පමණ බැතිමතුන් ප්‍රමාණයක් පැමිණෙති. එමඟින් නගරයට සැලකිය යුතු ආදායමක් ලැබෙන අතර, එම කාලය තුළ විවිධ සේවාවන් සැපයීම තුළින් ප්‍රාදේශීය සභාවට ඉහළ ආදායමක් ද ලැබීමට හැකි වී ඇත. එමෙන් ම, මිහින්තලය නගරයේ ආර්ථික ක්‍රියාකාරිත්වය සක්‍රීය මට්ටමකට ගෙන ඒමට පොසොන් උත්සව සමත් වේ. එම දිනවල නගරයේ පවතින අධික රථවාහන තදබදය අවම කිරීමට හැකි වන පරිදි ඉල්ලුමට සරිලන වාහන නැවතුම් ස්ථාන සැපයීම හරහා මෙවැනි ආදායම් ලැබීමට හැකි වී ඇත. මිහින්තලය විස්තරාත්මක සැලසුම් ප්‍රදේශය හෙක්ටයාර් 8 280.77 කින් සමන්විත වේ. මෙම ප්‍රදේශය තුළ ශාකමය ආවරණයක් සහිත ප්‍රදේශය ආසන්න ලෙස හෙක්ටයාර් 3 500 ක් පමණ වේ. ඒ අනුව සංචාරක ආකර්ශනයක් ලබාගත හැකි වන මංපෙත් හා ක්‍රියාකාරකම්, වන සත්ත්වයින් මෙහි දී හඳුනාගත හැකිය. ලෝකයේ ප්‍රථම අභය භූමිය වන මිහින්තලය අභය භූමියද පිහිටා ඇති බැවින්, ආවේණික මැඩියන් විශේෂයක් හා මුවන් ද මෙම අභය භූමිය තුළින් හමු වී තිබේ. මෙවැනි පරිසරයක් තුළ ගවේෂණාත්මක අත්දැකීම් සමඟ මෙහි බෞද්ධ වටිනාකම් අත් විඳීමට හැකියාවක් පවතී. එමෙන් ම රජරට විශ්ව විද්‍යාලය මඟින් ප්‍රකාශිත පර්යේෂණාත්මක ග්‍රන්ථයක මිහින්තලය ප්‍රදේශයේ සිදුකල හැකි සංචාරක ක්‍රියාකාරකම් පිළිබඳ හඳුන්වාදීමක් සිදුකර ඇත. ඒ අනුව බෞද්ධ වටිනාකම් අත්විඳීමට අමතරව කල හැකි ක්‍රියාකාරකම් රාශියක් මෙහි අන්තර්ගතව පවතී.

වගුව 3: මිහින්තලය සංචාරක ප්‍රවර්ධනයන් සඳහා ඇති අවස්ථා

කාණ්ඩය	නිර්ණායක
ස්වාභාවික ආකර්ශනීය	කාලගුණික රටාව
	වන ජීවීන් සහ අභය භූමි
	ආකර්ශනීය ස්ථාන (ආරාධනා ගල, මහ කනදරා වැව)
	ගුහා
	වනාන්තර ප්‍රදේශ
මිනිසා විසින් නිර්මාණය කරන ලද ආකර්ශනීය ස්ථාන	පුරාණ පංසල් හා ස්ථූප
	ගල් කැටයම් සහිත පුරාණ රෝහල
	විශාල තාපසාරාම සහිත දාන ශාලා
	පුරාණ භෝජන ශාලා
	වැව් සහ පොකුණු
සංස්කෘතික ආකර්ශනයන්	දේශීය ගැමි ආහාර
	පූජා විධි හා සම්ප්‍රදායන්
	දේශීය ගැමි භාෂාව
	විවිධ සංස්කෘතික උත්සව (දේවාල උත්සව, පොසොන් උත්සවය)
	සාම්ප්‍රදායික කර්මාන්ත (හේන, පැරණි මසුන් ඇල්ලීමේ ක්‍රම, පැරණි කෘෂිකාර්මික වගා ක්‍රම)
	සුව කිරීමේ ක්‍රම සහ දේශීය ඖෂධ
	ජන සංගීතය, බලි, තොවිල්
ක්‍රියාකාරකම්	ප්‍රදේශයේ ළමුන් උදෙසා ඉංග්‍රීසි ඉගැන්වීම
	පක්ෂීන් නැරඹීම, බයිසිකල් පැදීම
	දේශීය ආහාර සැකසීමට ඉගෙන ගැනීම
	පුරාණ කෘෂිකාර්මික ක්‍රම වල නියැලීම
හැකියාවන්	බොහෝ ගැමියන් හට විවිධ පැළැටි, සතුන් පිළිබඳව දැනුම පැවතීම
	පළපුරුදු මඟපෙන්වන්නන්
	ඉංග්‍රීසි කථා කිරීම පිළිබඳව ගැමියන් හට සාමාන්‍යය දැනීමක් පැවතීම
	ආචාර සම්පන්න හා ආගන්තුක සත්කාරයට ලැදි ග්‍රාමීය පරිසරය

මූලාශ්‍රය : රජරට විශ්ව විද්‍යාලය (පර්යේෂණාත්මක නිබන්ධන)

එමෙන් ම මිහින්තලය ප්‍රදේශිය පුරා විසිරි පවතින කුඩා වැව් පද්ධතිය හා මහකනදරා වැවට ආකර්ශනිය බවක් එක් කරයි. සැලසුම් බල ප්‍රදේශය තුළ 35 කට නොවැඩි කුඩා වැව් පද්ධතියක් පිහිටා තිබෙන අතර, පුරාණ කාලයේදි කුඹුරු අස්වැද්දීම සඳහා යොදාගත්තද වර්තමානයේදි බොහෝ වැව් අත්හැර දමා ඇති තත්ත්වයක් දක්නට ලැබේ. මිහින්තලය වැව හා මරදන්කුලම වැව නගර මධ්‍යයේම පවතින එවැනි වැව් දෙකකි. මෙවැනි වැව් ප්‍රතිසංස්කරණය කර සංචාරකයන් හා වන්දනාකරුවන්ගේ විවේක ස්ථාන ලෙස සංවර්ධනය කිරීමේ හැකියාවක් පවති. (සිතියම 31)

ඡායාරූපය 1: මිහින්තලය චෛත්‍ය දර්ශනය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

මෙම ප්‍රදේශය පුරා විසිරි පවතින භාවිතයට නොගන්නා විශාල හිස් ඉඩම් ප්‍රමාණයක් ළඳු කැලෑ වලින් වටවී පවතී. ඒ ආශ්‍රිතව මිහින්තලය කන්ද, මහ කනදරා වැව, වැනි සෞන්දර්යාත්මක හා පුරාවිද්‍යාත්මක අංග දුර සිට නැරඹීමට හැකියාවක් ද පවතී. එවැනි ස්ථාන ආශ්‍රිතව සංචාරකයන් සඳහා පහසුකම් සැපයීමට වැඩි අවස්ථාවක් පවතී. මෙම භාවිතයට නොගන්නා ඉඩම් ප්‍රදේශද පවතින්නේ ප්‍රධාන මාර්ග ආසන්නයේ වීම නිසා මෙම ප්‍රදේශය ද ආසන්නයේ ද ආකර්ශනීය ප්‍රදේශ නිර්මාණයට හැකියාවක් පවතී.

එමෙන්ම ලෝකය පුරා ප්‍රචලිත වන පරිසර සංචරණය සඳහාද මෙහි අවකාශයක් පවතී. දොරමඩලාව වැනි පුරා විද්‍යා ප්‍රදේශ ආශ්‍රිතව පවතින වනාන්තර ප්‍රදේශ මේ සඳහා යොදා ගැනීමේ හැකියාවක් පවතී. එහි වර්ථමානයේදී කඳවුරු ගැසීම සඳහා ස්ථාන පැවතියද ඒවා කැලෑවෙන් විනාශ වී ඉතා ප්‍රාථමික මට්ටමක පවතී.

ඡායාරූපය 2: දොරමඩලාව ප්‍රදේශයේ සංචාරක කුටියක් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ







මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

5.1.4 වැඩිම වේගයකින් වර්ධනය වී ඇති භූමි පරිභෝග රටාව නේවාසික බිම් ප්‍රදේශ වීම

මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තෝරා ගනිමින් සිදුකල, සියළු විශ්ලේෂණ තුලින් ඉස්මතු වී පෙනෙන ප්‍රදේශය විස්තරාත්මක සංවර්ධන සැලැස්මට යොදා ගැනිනි. ප්‍රධාන ලෙසම මිහින්තලය ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව සලකා බැලූ විට 2010 හා 2015 අතර සිදු වී ඇති වෙනස්කම් විශ්ලේශණය කිරීම වැදගත් වේ. ඒ අනුව ප්‍රධාන භූමි පරිභෝගය වන නේවාසික භූමි ප්‍රදේශ, කාෂිකාර්මික භූමි ප්‍රදේශ, ලදු කැලෑ සහ හේන්, ජලජ ප්‍රදේශ ලෙස දැක්විය හැකිය. මෙම භූමි පරිභෝග රටාවන් අතරින් වැඩිම වේගයකින් වර්ධනය වී ඇති භූමි පරිභෝග රටාව නේවාසික බිම් ප්‍රදේශ බව හදුනාගත හැකිය. ඊට සමාන්තර වේගයකින් කෘෂිකාර්මික ප්‍රදේශ වලද වර්ධනයක් හදුනාගත හැකිය. සිවිල් යුද්ධය නිමාවීම, රජයේ පොහොර සහනාධාර වැනි තත්ත්වයන් මෙයට හේතු ලෙස වක්‍රව බලපා ඇත. එමෙන්ම, මෙහි තවදුරටත් හදුනාගත හැකි ප්‍රවණතාවයක් ලෙස ඉඩම් මිලෙහි වෙනස්කම් දැක්විය හැකි අතර, ඉඩම් මිලෙහි හා නේවාසික භූමි පරිහරණය අතර සම්බන්ධතාවයක් ද හදුනාගත හැක.

ප්‍රස්ථාරය 1: 2010 - 2016 මිහින්තලය සැලසුම් ප්‍රදේශයේ ප්‍රධාන භූමි පරිභෝජන රටාවන්



මූලාශ්‍රය :- නාගරික සංවර්ධන අධිකාරිය

නේවාසික භූමි පරිහරණය ඉහළ ගිය ප්‍රදේශ වල ඉඩම් මිල ද ඉහළ ලෙස සටහන් වී ඇත. විශේෂයෙන්ම මහනුවර - යාපනය හා පුත්තලම - ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ග ආසන්නයේ එම ඉඩම් මිල ඉහළ අගයක් ගන්නා අතර, NDVI විශ්ලේෂණය මඟින් ලබාගත් දත්ත තුළින් එම මාර්ගයන් ආසන්නයේ සංවර්ධන කටයුතු සිදු වී ඇති බව අධ්‍යයනය කල හැකිය. විශේෂයෙන් ම මිහින්තලය නගරයේ සිට පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය ඔස්සේ අනුරාධපුරය දෙසට මෙම සංවර්ධනය සිදු වී ඇති බව නිරීක්ෂණය කල හැකිය.



2017 වර්ෂය



2008 වර්ෂය

රූපසටහන 4: වන ව්‍යාප්තිය හා බිම් ආවරණයේ වෙනස 2008 2017

මූලාශ්‍රය: වනවිද්‍යා ඡායාරූප

වගුව 4: ඉඩම් මිල

ප්‍රදේශ	ඉඩම් වටිනාකම (පර්චසයක් රුපියල්)
නගර මධ්‍ය හා අවට ප්‍රදේශ	150 000-200 000
නගර මධ්‍යයේ සිට අනුරාධපුර දෙසට (මාතලේ හංදිය සහ නුවර පාර)	75 000-100 000
නගර මධයයේ සිට රඹෑව දෙසට (ප්‍රධාන මාර්ගයේ සිට කි.මී.01ක් දෙපසට)	25 000 - 50 000
නගර මධ්‍යයේ සිට ත්‍රිකුණාමලය දෙසට (ප්‍රධාන මාර්ගයේ සිට කි.මී.01ක් දෙපසට)	20 000-50 000
ප්‍රධාන මාර්ග ආසන්නයේ හැර අවට ප්‍රදේශ	5 000සිට

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

5.1.5 නේවාසික ප්‍රදේශයකට අවශ්‍ය වන හරිතමය පරිසරයක් පැවතීම

මිහින්තලය සංවර්ධන සැලැස්මට අදාල සම්පූර්ණ සැලසුම් බල ප්‍රදේශය හෙක්ටයාර් 8280.27 ක් වන අතර, එයින් හෙක්ටයාර් 2610.53 ප්‍රදේශයක විසිරි පවතින ස්වභාවික ශාක ආවරණයක් දැකිය හැකිය. එමෙන් ම උෂ්ණ කලාපයක පිහිටා ඇති බැවින් ස්වාභාවික ලෙස උෂ්ණත්වය සමනය වීම සඳහා හරිත ආවරණය උපකාරී වේ. සුළං වේගය හා නාගරික ශබ්ද හා විෂ සහිත දුම වැනි අහිතකර ආපදා වලින් නේවාසික ප්‍රදේශ ආරක්ෂා වීමට ද මෙවැනි ශාකමය පරිසරයක් පැවතීම බෙහෙවින් ප්‍රයෝජනවත් ය. මේ තුළින් අපේක්ෂා කරනුයේ නේවාසික ප්‍රදේශයට සුදුසු පාරිසරික උෂ්ණත්වය පවත්වාගෙන යාම හා නේවාසිකයන්ට අවශ්‍යය මානසික වටපිටාවක් නිර්මාණය කිරීමයි. නාගරික පරිසර තත්ත්වයන්ගෙන් මිදී නාගරික පහසුකම් අත්විඳීමට අවශ්‍යය පරිසරය නිර්මාණය කිරීමට විභවතාවයක් ලෙස මෙය හඳුනා ගන්නා ලදී. (සිතියම 38)

සැලසුම් බල ප්‍රදේශයේ භූමි පරිහරණය

සමස්ත සංවර්ධන බල ප්‍රදේශය	- 8280.27 හෙක්ටයාර
කටු පදුරු හා හිස් බිම්	- 31.23 හෙක්ටයාර
ආයතනයකින් ප්‍රකාශයට පත්නොකල	- 692.095 හෙක්ටයාර
ජලජ ප්‍රදේශ	- 1058.62 හෙක්ටයාර
නේවාසික ප්‍රදේශ	- 1873.08 හෙක්ටයාර
ලදු කැලෑ ප්‍රදේශ	- 2610.53 හෙක්ටයාර

5.1.6 මිහින්තලය ප්‍රදේශය සමස්ථයක් ලෙස තැනිතලා බිම් ප්‍රදේශයකි.

මිහින්තලය ප්‍රදේශය සමස්තයක් ලෙස තැනිතලා බිම් ප්‍රදේශයක් වන අතර, සාමාන්‍යය මුහුදු මට්ටමේ සිට මීටර් 120 ත් 125 ත් අතර පිහිටා ඇත. එමෙන් ම ප්‍රදේශයේ උසම ස්ථානය වන කටුපොත කන්ද මීටර් 360 ක් පමණ උසකින් පිහිටා ඇත. මෙම තත්ත්වය නේවාසික පරිසරයක් සඳහා උචිතම තත්ත්වයක් ලෙස හ.දුනාගෙන ඇත. එමෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්ත පරීක්ෂා කිරීමේ දී නියඟය හැරුණු විට මෙම ප්‍රදේශයේ අනෙකුත් ස්වාභාවික ආපදා කිසිවක් බල නොපාන බව අනාවරණය විය. නේවාසික නගරයක් සඳහා සුදුසු භූමි පරිභෝජනයකට අවශ්‍යය තැනිතලා භූමි ප්‍රදේශ විශාල ලෙස පැතිරී පවතින බැවින්, අනාගතයේ නේවාසික අවශ්‍යතා සඳහා විශාල දායකත්වයක් ලබාගැනිමට මිහින්තලය ප්‍රදේශයේ දී හැකියාව පවතී. (සිතියම 42)

5.2 දූර්වලතා

5.2.1 රජරට විශ්ව විද්‍යාලය ප්‍රදේශයේ සංවර්ධනය සඳහා සක්‍රිය ලෙස දායක නොවීම

රජරට විශ්ව විද්‍යාලය ප්‍රදේශයේ ස්ථාපිත කරලිමේ එක් අරමුණක් වූයේ ග්‍රාමීය පහසුකම් සංවර්ධනය කරලිම හා නාගරික ප්‍රදේශ වලට සංවර්ධනය ඒකරාශි වීම වැලැක්වීමයි. නමුත් වර්තමානයේ මිහින්තලය නගරය සංවර්ධනය වීමෙහිලා රජරට විශ්ව විද්‍යාලයේ දායකත්වය අවම බව හඳුනාගත හැකිය. අනුරාධපුර මිහින්තලය ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති බැවින්, සිසුන්ගෙන් 70%ක් පමණ පිරිස අනුරාධපුර නගරය වෙත පිවිස තම අවශ්‍යතා ඉටුකර ගනු ලබයි. මිහින්තලය නගරය තුළ විවිධත්වයෙන් යුතුව අවශ්‍යතාවයන් ඉටුකර ගැනිමට නොහැකි වීම මෙම තත්ත්වය සඳහා බලපා ඇත. එමෙන් ම සිසුන්ගෙන් බහුතරයකට විශ්ව විද්‍යාලය මගින්ම නේවාසික පහසුකම් සපයනු ලබන නිසා ප්‍රදේශයේ ජනතාවගේ විකල්ප ආදායම් මාර්ග දියුණු වීමට බාධාවක් වී ඇත. කළමනාකරණ විද්‍යා පීඨය, සමාජ විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කෘෂි විද්‍යා පීඨය සහ වෛද්‍ය විද්‍යා පීඨය යන පීඨ මෙම විශ්ව විද්‍යාලයේ විෂය පථයට ඇතුලත් කර තිබේ. මෙයින් මිහින්තලේ ප්‍රදේශය තුළ කළමනාකරණ, සමාජ විද්‍යා සහ ව්‍යවහාරික විද්‍යා යන පීඨ පවත්වාගෙන යනු ලබන අතර, සිසුන් 2000කට වැඩි ප්‍රමාණයක් ඉහත පීඨ වල ඉගෙනුම ලබයි. සෑම වසරකම ශිෂ්‍යය ප්‍රමාණය 10%ක් පමණ වැඩි වන බව පරිපාලන අංශය ප්‍රකාශ කරන අතර, මිහින්තලේ නගර මධ්‍යයේ අක්කර 180 ක පමණ භූමි ප්‍රමාණයක් මෙම විශ්ව විද්‍යාලය සඳහා වෙන් වී තිබේ තවද,

මුල් විනාශ සැලැස්ම අනුව විශ්ව විද්‍යාල භූමියේ ඉදිකිරීම් කටයුතු කරනු ලබයි. අනුරාධපුර - ත්‍රිකුණාමලය මාර්ගය මෙම විශ්ව විද්‍යාල භූමිය මධ්‍යයෙන් ගමන් කරන බැවින්, විශ්ව විද්‍යාලය, මාර්ගයේ දෙපසට බෙදී ගොස් ඇත. එහිදී සමාජ විද්‍යා පීඨය ඇතුලත් කොටස සඳහා අක්කර 100 ට වැඩි බිම් ප්‍රමාණයක් පවතින අතර, අනාගතයේ දී වැඩිවන සිසුන් සඳහා අවශ්‍යය ගොඩනැගිලි හා අනෙකුත් අපරව්‍යුහ පහසුකම් සැපයීම සඳහා මෙම භූමිය ප්‍රමාණවත් වේ. නේවාසිකාගාර සහ ව්‍යාවහාරික විද්‍යා පීඨයත්, පරිපාලන මධ්‍යස්ථානයත්, පිහිටි ප්‍රධාන මාර්ගයෙන් දකුණු කොටසේ භූමිය අනාගත සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බව විශ්ව විද්‍යාල පරිපාලන අංශයේ අදහස වේ.

රූපසටහන 5: රජරට විශ්ව විද්‍යාලයේ භූමි ප්‍රදේශය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

5.2.2. බීමට ගත හැකි මට්ටමේ ජල පහසුකම් සීමිත ප්‍රදේශයකට පමණක් ව්‍යාප්ත වී පැවතීම.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් පිරිසිදු කොට නිකුත් කරන විවිධ ජල ව්‍යාපෘති මගින්, සැලසුම් බල ප්‍රදේශයේ සියළුම ප්‍රදේශ ආවරණය නොවේ. විශේෂයෙන්ම නේවාසික භාවිතයන් සඳහා සුදුසු ප්‍රදේශ පිළිබඳ විශ්ලේෂණයේ දී හඳුනාගත් ප්‍රදේශ හා දැනට ජල සම්පාදනය කෙරෙන ප්‍රදේශ අතර විවිධ වෙනස්කම් ඇත. මේ අනුව එම ප්‍රදේශ හා සසඳන විට සම්පූර්ණ සැලසුම් ප්‍රදේශයෙන් 36% ක පමණ ප්‍රදේශයක් මෙලෙස ආවරණය වුවද මහකනදරාව යාය 01, මහකනදරාව යාය 02, මහකනදරාව යාය 03 වැනි විශාල නේවාසික ප්‍රදේශ සම්පූර්ණ ලෙස ආවරණය වී නොමැත. මිහින්තලය නගර මධ්‍යය ප්‍රදේශය සම්පූර්ණ ලෙසම පානීය ජල පහසුකමින් ආවරණය වුවද, මාතලේ හංදිය ප්‍රදේශයේ හඳුනාගත් නේවාසික කලාපය සඳහා අවශ්‍යය පානීය ජල පහසුකම් තවදුරටත් සංවර්ධනය විය යුතු බවට හඳුනා

ගන්නා ලදි. පානීය ජල ගැටළුව මෙම ප්‍රදේශය තුළ තීව්‍ර වීම හේතුවෙන් සහ වසරේ වැඩි කාලයක් තුළ උෂ්ණාධික තත්ත්වයක් පැවතීම හේතුවෙන් ප්‍රදේශයේ වකුගඩු රෝගීන් සංඛ්‍යාව වර්ධනය වී ඇත. නේවාසික සංවර්ධන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය නොවීමට පානීය ජලයේ ඇති අක්‍රමික පැතිරීම බලපා අකාරය හඳුනා ගන්නා ලදි.

ඉහත සඳහන් කරන ලද ප්‍රදේශයට අමතරව විශ්ලේෂණයේ දී හඳුනාගත් හෙක්ටයාර 1 327 කට ආසන්න නේවාසික කටයුතු සඳහා සුදුසු නව ප්‍රදේශ සඳහා ද ජල පහසුකම් ව්‍යාප්ත වී නොමැත. මරදන්කුලම, උක්කුලංකුලම, කන්නට්ටිය යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ මේ අතරින් ප්‍රධාන ස්ථානයක් ගනී. එමෙන්ම වසර 2030 වන විට 48 000 ක් පමණ වන අපේක්ෂිත ජනගහනයට අවශ්‍යය පානීය ජල පහසුකම් ලබාදීමට පවතින ජල සම්පාදන පද්ධතිය ප්‍රමාණවත් නොමැත. මෙය නේවාසික නගරයක් තුළ නොකඩවා සම්බන්ධ වන ජල සැපයුමකට බාධා සහිත තත්ත්වයකි. (සිතියම 43)

5.2.3 ප්‍රදේශයේ පවතින සෞඛ්‍ය සේවාවන්හි දුර්වලතා

වගුව 5: රජයේ රෝහල් පහසුකම්

රෝහල	වාට්ටු ගණන	ඇඳන් ගණන	බාහිර රෝගින් ප්‍රමාණය	නේවාසික රෝගින් ප්‍රමාණය
මිහින්තලේ	06	80	64327	4191
තම්මැන්නාව	03	20	38728	2797

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, මිහින්තලේ ප්‍රදේශීය ලේකම් කාර්යාලය - 2016

මිහින්තලය සැලසුම් ප්‍රදේශය නේවාසික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේ දී පරමාර්ථය කරා ළඟා වීම සඳහා පවතින සෞඛ්‍යය පහසුකම් ද දුර්වල දායකත්වයක් දක්වයි. මිහින්තලය ප්‍රදේශයේ දැනට රෝහල් 02 ක් පවතින අතර, මිහින්තලය රෝහල ඉන් ප්‍රධාන වේ. එය දිසා රෝහල් යටතේ දෙවන කාණ්ඩයට අයත් වන රෝහලකි. දැනට මිහින්තලය රෝහලේ වාට්ටු 06 ක් ද වෛද්‍යවරුන් පහක් හා හෙදියන් දාහතක් ද සේවය කරයි. පසුගිය වර්ෂය පුරා බාහිර රෝගින් 64 327 ක පමණ ප්‍රමාණයක් ද නේවාසික රෝගින් 4 191 ක් පමණ ප්‍රමාණයක් ද සේවා ලබා ගෙන ඇති බව වාර්ථා වී ඇත. එහෙත් සැලසුම් ප්‍රදේශය තුළ දැනට සිටින ජනගහනය 26 000 සිට 48 000 ක් දක්වා වැඩි වනු ඇතැයි පුරෝකථනය මඟින් තහවුරු කර ඇත. මෙහි වර්තමාන තත්ත්වය හා සසඳන විට 2030 වසරේ දී අපේක්ෂිත නේවාසික ජනගහනය 48 000 ක් පමණ වීමේ දී එයට සේවා සැපයීමට නොහැකි තත්ත්වයක් උදාවනු ඇත. වැඩිවන ජතගහනයට අවශ්‍යය සේවා පහසුකම් සැපයීම සඳහා පවත්නා ඉඩම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අතර, පුරාවිද්‍යා ප්‍රදේශය තුළ පිහිටා ඇති බැවින් අවශ්‍යය පරිදි රෝහලේ ඉදිරි සංවර්ධනයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා නොදීම මත සංවර්ධනය කටයුතු ද කළ නොහැකි වීම දුර්වලතාවයක් ලෙස හඳුනා ගන්නා ලදි.

සිතියම 5: මිහින්තලය රෝහල් පෝෂක ප්‍රදේශය



රෝහල් පෝෂක ප්‍රදේශය
මිහින්තලය සැලසුම් බල ප්‍රදේශය

නාගරික සංවර්ධන අධිකාරිය
2019 ජනවාරි

දකුරු මැද පළාත් කාර්යාලය | මිහින්තලය සංවර්ධන සැලැස්ම 2019 - 2030 | සැකසුම : ජේ එස් එස් මධුරංග

රූපසටහන 6: පුරාවිද්‍යා ප්‍රදේශය තුළ මිහින්තලය රෝහල පිහිටා ඇති අකාරය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

5.2.4 මිහින්තලය ප්‍රදේශය තුළ සාපේක්ෂව වැඩි උෂ්ණත්වයක් වර්ධනය වීම

මිහින්තලය සැලසුම් ප්‍රදේශය ඉතා විශාල හරිතමය පරිසරයක පිහිටිය ද පසුගිය අවුරුදු කිහිපය හා සැසඳීමේ දී එහි සෙල්සියස් අංශක 1.5 ක පමණ සාපේක්ෂ වැඩිවීමක් වාර්තා වී ඇත. විශේෂයෙන් ම 2014 වර්ෂයෙන් පසු සාමාන්‍යය උෂ්ණත්වය ඉතා විශාල ලෙස වැඩිවීමක් හඳුනාගත හැකි අතර, අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව මාර්තු සිට ඔක්තෝම්බර් දක්වා කාලය තුළ මෙම අගය සෙල්සියස් අංශක 02 කින් පමණ ඉහළ ගොස් ඇති බව හඳුනාගත හැකිය. එමෙන් ම අනුරාධපුර නගරයට සමාන දුරකින් පිහිටා ඇති තලාව වැනි නගරයන් හි උෂ්ණත්වය හා සංසන්දනය කිරීමේ දී සෙල්සියස් අංශක 01 ක් පමණ වූ අගයක ඉහළ යෑමක් සැලසුම් බල ප්‍රදේශය තුළ හඳුනාගත හැකිය. (ප්‍රස්ථාරය 06 07)

එමෙන්ම පසුගිය වර්ෂ කිහිපය තුළ සැලසුම් බල ප්‍රදේශයේ වර්ෂාපතනය සැලකිය යුතු ලෙස අවම වී ඇත. එය ද ප්‍රදේශයේ උෂ්ණත්වය ඉහළ යාමට සෘජු ලෙස බලපා ඇත. 2011 වසරේ සිට වර්ෂාපතනය මිලි මීටර් 150 - 200 ත් අතර ප්‍රමාණය දක්වා පහළ ගොස් ඇත.

5.2.5 නේවාසිකයින්ට අවශ්‍යය පහසුකම් හා සේවා සපයන නාගරික ප්‍රදේශයක් නොමැති වීම

නේවාසිකයින්ට අවශ්‍යය පහසුකම් හා සේවා සපයන නගර ප්‍රදේශයක් නොමැති වීම මෙහි දුර්වලතාවයක් ලෙස හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම සැලසුම් ප්‍රදේශය තුළ වාණිජ හා ආයතනික ලෙස සේවා සපයන බිම් ප්‍රමාණය සමස්ත බිම් ප්‍රදේශයෙන් 0.127 ක් පමණ අඩු ප්‍රමාණයක් ගනී. මීට බලපාන ප්‍රධානතම සාධකයක් ලෙස පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත අක්කර 590 කට ආසන්න පුරා විද්‍යා බිම් ප්‍රදේශයක් නගර මධ්‍යයේ පිහිටා තිබීම දැක්විය හැකිය. මෙම තත්ත්වය තුළ මිහින්තලය ප්‍රදේශයේ ජනතාවට අවශ්‍යය වාණිජ හා ආයතනික සේවා ව්‍යාප්ත වීමේදි ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වී ඇත. එමෙන් ම මිහින්තලය රජරට විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා අවශ්‍යය වාණිජ සේවා නොමැති වීමට මෙම සාධකය ප්‍රධාන ලෙස බලපා ඇති අතර, සිසුන් අනුරාධපුර නගරය කරා ඇදී ඒමට එය එක් හේතු සාධකයක් වී ඇත. මිහින්තලය නගරය තුල ඒදිනෙදා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා ලබාගැනිමට පුද්ගලයන් 2 000 2 500 අතර පිරිසක් සංක්‍රමණය වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශිය සභාව, පොලිසිය, තැපැල් ස්ථානය, රජරට විශ්ව විද්‍යාලය, විදුලි බල මණ්ඩලය, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, සෞඛ්‍යය කටයුතු හා අධ්‍යාපනික කටයුතු සඳහා ද පුද්ගලික අංශයේ බැංකු කටයුතු වැනි සේවාවන් ලබාගැනිම සඳහා ද ප්‍රවාහන සේවාවන්, ආහාර ද්‍රව්‍ය සපයා ගැනිම, ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා ගැනිම වැනි අංශ සඳහා ද මෙම පිරිස නගරය කරා සංක්‍රමණය වේ.

රූපසටහන 7: පුරා විද්‍යා ප්‍රදේශය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

5.2.6 මාර්ග පද්ධතියේ දුර්වල සම්බන්ධතාවයන්

වර්තමානය වන විට පවතින නේවාසික ප්‍රදේශය හෙක්ටයාර 3 111 ක් වන අතර, එම ප්‍රදේශය තුළ පවතින සම්පූර්ණ මාර්ගයන් හි දිග ප්‍රමාණය කි.මී.339 කි. ආසන්නතම නගරයක් ලෙස තඹුත්තේගම ප්‍රදේශය තුළ මහා මාර්ග වල දිග කි.මී.610 ක් වන අතර පවතින වෙනස්කම් මත, අධි නාගරික කලාපයේ පිහිටි හොඳම නේවාසික ප්‍රදේශය වීමට බාධාවක් ලෙස හඳුනා ගැනිනි. තවද, මිහින්තලය ප්‍රදේශය තුළ පවතින කි.මී.339 ක් වූ මාර්ග ජාලය තුළ අඩි පාරවල් විශාල සංඛ්‍යාවක් ද හඳුනාගත් අතර, අභ්‍යන්තර මාර්ග ජාලයෙහි පවතින දුර්වල අවකාශිය සම්බන්ධතාවය ද විශ්ලේෂණය මඟින් නිරීක්ෂණය කිරීමට හැකි විය. එමෙන් ම පවතින මාර්ග ජාලයේ අන්තර් සම්බන්ධතාවය දුරස් වීමට හේතු සාධක මෙහි දී හඳුනා ගත් අතර අන්තර් සම්බන්ධතාවය බිඳීම නිසා නේවාසික ප්‍රදේශ තව දුරටත් ව්‍යාප්ත කිරීම අපහසු වීම ද හඳුනාගත් දුර්වලතාවයකි. එමෙන් ම පවතින දුම්රිය මාර්ගය මේ වන විට එදිනෙදා කටයුතු සඳහා යොදා නොගන්නා බැවින්, එය නේවාසික නගර ව්‍යාප්තියට භාවිතා කිරීමට අපහසු තත්ත්වයක පවතී. සැලසුම් ප්‍රදේශයේ මාර්ග සම්බන්ධතා අවම ප්‍රදේශ ලෙස බෝගහයාය, කන්නට්ටිය, මරදන්කුලම, උක්කුලංකුලම යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ දැක්විය හැකිය. එමෙන්ම දැනට පවතින නේවාසික ප්‍රදේශ හා සැසඳීමේදී වැඩිම මාර්ග සම්බන්ධතා බිඳී යාම් සහිත ප්‍රදේශ ලෙස කන්නට්ටිය, මහකනදරාව, යාය 01, මහකනදරාව යාය 02, රුවන්ගම, කුරුන්දන්කුලම, කුංචිකුලම යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ හඳුනාගත් අතර, එම ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල හඳුනාගත් ප්‍රදේශයන් හි නේවාසික කටයුතු ව්‍යාප්ත කිරීමට දුර්වලතාවයක් ලෙස එම තත්ත්වය දැක්විය හැකිය. (සිතියම 46)

සිතියම 6: අවකාශීය සම්බන්ධතාවය



මූලාශ්‍රය :නාගරික සංවර්ධන අධිකාරිය

5.2.7 දැනට පවතින නේවාසික ප්‍රදේශ එකිනෙක ඉතා දූරින් පිහිටීම නිසා යටිතල පහසුකම් සැපයීම දුෂ්කර වීම.

සැලසුම් ප්‍රදේශය තුළ දැනට හඳුනාගත් නේවාසික ප්‍රදේශ අතර, කුරුන්දන්කුලම, කුංචිකුලම, හේනවත්ත, නුවරවැව ග්‍රාම නිලධාරී කොට්ඨාශ හා විශ්ලේෂණය මගින් නේවාසික සංවර්ධනයන් සඳහා හඳුනාගත් ප්‍රදේශ අතර, පවතින සෘජු මාර්ග සම්බන්ධතාවය ඉතා දුර්වල මට්ටමක පවතී. විශේෂයෙන්ම විශ්ලේෂණය තුළින් ඉස්මතු වූ උක්කුලංකුලම, මරදන්කුලම යන ප්‍රදේශ දැනට පවතින නේවාසික ප්‍රදේශ හා සෘජු ලෙස සම්බන්ධ වීමට හැකි වුවද විශාල ළඳු කැලෑ ප්‍රදේශ සහ කුඹුරු බිම් වලින් වට වී ඇති නිසා සෘජු සම්බන්ධතාවය ගිලිහි ගොස් ඇත. එබැවින් මෙම නේවාසික ප්‍රදේශ වලට ගමන් කිරිමේදි ප්‍රධාන මාර්ගය භාවිතා කිරීමට සිදු වේ. ඒ අනුව, එක් ප්‍රදේශයක සිට තවත් ප්‍රදේශයකට මෙම ප්‍රධාන මාර්ග ඔස්සේ ජලය, පොදු ප්‍රවාහන සේවා වැනි යටිතල පහසුකම් සැපයීමේ දී ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වීම දුර්වලතාවයක් ලෙස හඳුනා ගෙන ඇත. දැනට පවතින අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඔස්සේ අශෝකපුර සිට ඉතා ආසන්න ප්‍රදේශ වල පිහිටි කුංචිකුලම, හේනවත්ත කුරුන්දන්කුලම වැනි නේවාසික ප්‍රදේශ වලට සම්බන්ධ විය නොහැකි අතර, ඒ සඳහා ප්‍රධාන මාර්ගයම භාවිතා කල යුතුය. එමෙන් ම අනුරාධපුර - මිහින්තලය දුම්රිය මාර්ගය අතර, අශෝකපුර ප්‍රදේශයේ දුම්රිය නැවතුම්පළක් ස්ථානගත වී ඇති බැවින්, මෙම දුම්රිය මාර්ගය අනාගතයේ දී භාවිතයට ගැනිම සඳහා දැනට පවතින නේවාසික ප්‍රදේශ ඒකාබද්ධ කරමින් මාර්ග ජාලයක් ස්ථාපිත වීම සිදු විය යුතුය. දැනට එවැනි තත්ත්වයක් සැලසුම් ප්‍රදේශය තුළ නොමැති බැවින්, එය නේවාසික ප්‍රදේශයේ සංවර්ධනයට බාධාවක් ලෙස හඳුනා ගැනිනි. ප්‍රධාන මාර්ග ජාලයෙන් නේවාසික ප්‍රදේශ සම්බන්ධ වීමට අමතරව අභ්‍යන්තර මාර්ග ජාලයකින් සම්බන්ධ නොවීම නිසා මෙම නේවාසික ප්‍රදේශ වෙත ගමන් කිරිමට අමතර කි.මී.7 - 10 ත් අතර ප්‍රමාණයක් ප්‍රධාන මාර්ග හරහා ගමන් කල යුතුය. මෙය අභ්‍යන්තර පොදු ප්‍රවාහන සේවා දියුණු නොවීමට බාධාවක් ලෙස හඳුනාගත් අතර, පොදු ප්‍රවාහන සේවා සැපයිමේදි බස්රථ ගමන් මාර්ග නිශ්චිත කර ගැනිම ද එම නිසා එම ගමන් මාර්ග පවත්වාගෙන යාමට තරම් ආදායම් ලබාගත නොහැකි වීම ද හඳුනාගෙන ඇත. (සිතියම 32)

5.3 අවස්ථාවන්

5.3.1 2050 වර්ෂය සඳහා සකස් කරන ලද ජාතික භෞතික සැලස්මට අනුව අනුරාධපුර මහා නාගරික ප්‍රදේශයක් වීම.

යෝජිත 2050 භෞතික සැලැස්මට අනුව අනුරාධපුර මහා නගරයක් ලෙස හඳුනාගෙන තිබේ. මෙම තත්ත්වය තුළ මිහින්තලය ප්‍රදේශය ඊට ආසන්නව පිහිටා ඇති ප්‍රදේශයක් වීම නිසා ද වර්තමාන තත්ත්වයන් තුළ වුවද මිහින්තලය සැලසුම් ප්‍රදේශය ආර්ථික හා ගමනාගමනය ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වන්නේ අනුරාධපුර නගරයට වීම නිසා ද ප්‍රදේශයේ පිහිටි අනෙකුත් නාගරික ප්‍රදේශ වලට සාපේක්ෂව අනුරාධපුර නගරයට කි.මී.14 ක් වැනි අඩු දුරකින් පිහිටා ඇති බැවින් ද භෞතික සැලැස්මට අනුව අනුරාධපුර අධි නාගරික කලාපය උප නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පවතී. (ඇමුණුම 04)

5.3.2 මහ නගර සහා බල ප්‍රදේශයේ භූමි පරිහරණය අනුව එහි පවතින එකිනෙක සංයුක්ත වූ නේවාසික අවකාශය.

මිහින්තලය ප්‍රදේශය නේවාසික කටයුතු සඳහා ඇති හොඳම ප්‍රදේශය බවට පත් කිරීම යන පරමාර්ථයට අදාලව ඇති අවස්ථාවක් ලෙස අනුරාධපුර මහ නගර සහා බල ප්‍රදේශයේ පවතින තත්ත්වයන් හඳුනා ගත හැකිය. ඒ අනුව, මහ නගර සහා බල ප්‍රදේශයේ භූමි පරිහරණය අනුව එහි පවතින සංයුක්ත වූ නේවාසික අවකාශය තවදුරටත් සංයුක්ත වෙමින් පවතින බව හඳුනාගෙන ඇති අතර, වර්තමානය වන විට අනුරාධපුර නගරයේ හෙක්ටයාරයක් තුළ මිනිසුන් 25 ක් පමණ නේවාසික පහසුකම් සලසා ගනී. මිහින්තලය සැලසුම් ප්‍රදේශයේ දී මෙම තත්ත්වය හෙක්ටයාරයකට පුද්ගලයන් 3 ක් ලෙස හඳුනාගත හැකිය. ඒ අනුව, නේවාසික කටයුතු සඳහා විශාල අවස්ථාවක් පවතී.

5.3.3 අනුරාධපුර මහ නගර සහා බල ප්‍රදේශයේ දැනට ජීවත් වන ජනගහනය ක්‍රමයෙන් අඩු වීම.

අනුරාධපුර මහ නගර සහා බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනගහනය ක්‍රමයෙන් අවම වෙමින් පැවතීම, මිහින්තලය සැලසුම් ප්‍රදේශයට අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. අනුරාධපුර මහ නගර සහා බල ප්‍රදේශය ලෙස නාගරිකරණය වීමත් සමඟ එහි නාගරික ජනගහනය පිටත ප්‍රදේශ කරා ඇදී යාමක් හඳුනාගන්නා ලදි. එය මිහින්තලය ප්‍රදේශය නේවාසික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට පවතින අවස්ථාවකි. වසර 2001 දි 56 632 ක ජනගහනයක් අනුරාධපුර මහ නගර සහා බල ප්‍රදේශයෙන් වාර්තා වූ අතර, එය 2011 වසර වන විට 52 007 ක් වී ඇත. ශීඝ්‍ර නාගරිකරණයත් සමඟ නේවාසික ජනගහනය නාගරික ප්‍රදේශයෙන් ඉවත් වීම මත අනුරාධපුර නගර සීමාව තුළ, නේවාසික ජනගහනය වර්ධනය වීමේ ශීඝ්‍රතාවය -0.00848 ක් ලෙස ගණනය කිරීම තුළින් ඉහත කරුණු පැහැදිළි වේ.

5.4 තර්ජන

5.4.1 විජයපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නේවාසික ප්‍රදේශයක් ලෙස ක්‍රමයෙන් සංවර්ධනය වීම.

විජයපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ මහ නගර සභාවට ආසන්නම ග්‍රාම නිලධාරී කොට්ඨාශ වලට මහ නගර සභා සීමාවෙන් ඉවතට පැමිණෙන ජනතාවගේ පදිංචි වීම මිහින්තලය සංවර්ධන සැලැස්මේ දැක්මට අදාලව පවතින තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇත. ඉහත පරිදි නේවාසිකයන්ගේ පදිංචි වීම හේතුවෙන් විජයපුර ප්‍රාදේශීය සභාවට අයත් නගර සභා සීමාව ආසන්නයේම පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ජනගහනය ඉහළ යාම හා භූමි වටිනාකම් ඉහළ යාම ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. විශේෂයෙන්ම 2001 වර්ෂයේ දී පර්චසයක් රුපියල් 29 500 ත් රුපියල් 46 500 ත් අතර අගයක් ගත්ත ද ජනගහනය වැඩිවීමත් සමග එම ප්‍රාදේශීය සභාවේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ඉඩම් මිල 2016 වර්ෂය වන විට පර්චසයක් රුපියල් 181 000 ත් රුපියල් 296 000 ත් අතර, දක්වා ඉහළ ගොස් ඇති බවට නිරීක්ෂණය කල හැකි විය. වර්තමානය වන විට මිහින්තලය සැලසුම් බල ප්‍රදේශයේ උපරිම ඉඩම් මිල සීමාව ලෙස සටහන් වනුයේ පර්චසයක් රුපියල් 200 000 සීමාව වේ. මේ අනුව මහ නගර සභා බල ප්‍රදේශයෙන් පිටතට ඇදි යන ජනයා හට පහසුවෙන් ඉඩම් ලබාගැනීමේ හැකියාව විජයපුර ප්‍රදේශයේ පැවතීම තර්ජනයක් ලෙස හඳුනා ගෙන ඇත. (සිතියම 36 37)

5.4.2 සංචාරකයින් ප්‍රදේශය නැරඹීම සඳහා පමණක් මිහින්තලයට පැමිණීම

අනුරාධපුර නගරය ජාතික තලයේ වැදගත් සංචාරක මධ්‍යස්ථානයක් වන බැවින්, අනුරාධපුරයට පැමිණෙන සංචාරකයින් නවාතැන් හා අනෙකුත් සේවා පහසුකම් එම නගරය තුළින්ම ලබා ගන්නා අතර, ඔවුන් නැරඹීම සඳහා පමණක් මිහින්තලයට පැමිණීම හේතුවෙන්, ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු වීමට හා එයින් නේවාසිකයන්ට ලැබෙන වක්‍ර ආදායම අවම මට්ටමකට පත් වීම ප්‍රධාන තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇත. (ප්‍රස්ථාරය 04 05)

6. සැලැස්ම

6.1 සංකල්පිත සැලැස්ම

මිහින්තලය නගරය සංවර්ධනය කිරීමේ දී සංකල්පිත සැලැස්මට අනුව, ප්‍රධාන වශයෙන්ම නේවාසික සංවර්ධනයන් හා සංචාරක කටයුතු සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගෙන ඇත. ඒ අනුව සංවර්ධන සැලැස්මේ දැක්ම වන සංස්කෘතික උල්පතේ නේවාසික උද්‍යානය යන්න ඔප් නැංවෙන පරිදි සංකල්පිත සැලැස්ම සකසා ඇත. එහිදි මාර්ග, ජලය, විදුලිය ආදි යටිතල පහසුකම් ද නාගරික අලංකරණ වැනි සුවපහසු නාගරික සේවාවන් ද මෙම සැලසුම් ප්‍රදේශය තුළ ව්‍යාප්ත කිරීම සඳහා මූලිකව හඳුනාගෙන ඇත.





සිතියම 7: සංකල්පිත සැලැස්ම 2030

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

මිහින්තලය සැලසුම් බල ප්‍රදේශයේ මාතලේ හංදිය එනම්, පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය හා ගල්කුලම - මාතලේ හංදිය දක්වා පවතින මාර්ගය හමුවන ස්ථානය කේන්ද්‍ර කර ගනිමින්, මිශ්‍ර සංවර්ධන ප්‍රදේශයක් ව්‍යාප්ත කිරීමට හඳුනාගෙන ඇත. අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශයට ආසන්නතම ප්‍රදේශය වන බැවින්, එම ආසන්නම ප්‍රදේශයේ සංවර්ධනයට සමාන සංවර්ධනයක් ලඟා කර ගැනීම මෙමගින් අරමුණු වේ. එමෙන්ම සැලසුම් බල ප්‍රදේශයේ ඉහළ සංවර්ධන පිඩනයක් සහිත ප්‍රදේශයක් ලෙස මෙය හඳුනාගෙන ඇති බැවින්, මිශ්‍ර සංවර්ධන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍යය පහසුකම් සලසා දීම මෙහිදී අරමුණු වේ.

මිහින්තලය නගර මධ්‍යය ප්‍රදේශය නාගරික ලක්ෂණ සහිතව ස්වාභාවික පරිසරයද ආරක්ෂා වන පරිදි සංවර්ධනය කිරීම මෙම සංකල්පිත සැලැස්මෙන් හඳුනාගෙන ඇත. එහිදි මිහින්තලය දුම්රිය ස්ථානය හා පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය ආසන්නයෙන් මහනුවර - යාපනය මාර්ගයට සමාන්තරව විකල්ප මාර්ගයක් සංවර්ධනය කිරීම හඳුනාගෙන ඇත. මෙහි පදනම වන්නේ මහනුවර - යාපනය මාර්ගය ඔස්සේ රථ වාහන ගමනාගමනය ඉහළ යාමට ඇති විභවතාවය අනාගතයේදී වර්ධනය විය හැකි බැවින්, දැනට පුරා විද්‍යා ප්‍රදේශය හරහා ගමන් කරන මහනුවර - යාපනය මාර්ගය තවදුරටත් පුළුල් කිරීමට නොහැකි බැවිනි. එමෙන්ම, නාගරික ප්‍රදේශය තුළ සෞඛ්‍යය, පරිපාලන ආදි සේවා සපයන ආයතන සමඟ පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය ඔස්සේ අඹතලාගම ප්‍රදේශය දක්වා නාගරික ප්‍රදේශය ව්‍යාප්ත වීමට පහසුකම් සපයනු ලැබේ. තවද, එම ප්‍රදේශය තුළ සංචාරක සේවා සැපයීම මෙන් ම උසස් අධ්‍යාපනය ප්‍රමුඛ කොටගත් සේවා සැපයීම සඳහා අවශ්‍යය පහසුකම් සපයනු ලැබේ. මෙම නාගරික ප්‍රදේශය තුළ ස්වාභාවික පරිසරය ආරක්ෂා වන පරිදි වාණිජ, අධ්‍යාපන වැනි පහසුකම් ස්ථාපනය කිරීමට අවස්ථාව ලබාදෙනු ලැබේ.

ඒ අනුව, ග්‍රාම නිලධාරී කොට්ඨාශ 15 ක් තුළ අදාල සංකල්පිත සැලැස්ම මහනුවර - යාපනය, පුත්තලම - ත්‍රිකුණාමලය යන මාර්ග වලින් සංවෘත වූ ප්‍රදේශයක ව්‍යාප්ත වේ. මෙහිදි ප්‍රධාන වශයෙන්ම මාතලේ හංදිය, මිහින්තලය නගරය, මහකනදරාව ජනපදය යන ප්‍රදේශ ඉහළ නේවාසික සංවර්ධනයක් කරා ගෙන යාමට අපේක්ෂා කරනු ලබන අතර, මෙම නේවාසික ප්‍රදේශ තුළ ව්‍යාප්ත වූ කුඹුරු පද්ධති, ස්වභාවික වනාන්තර පද්ධති, වැව් හා ඇළ මාර්ග පද්ධති වලින් සමන්විත වී ඇත. මෙම පද්ධති අතර පවතින නේවාසික ප්‍රදේශ ඉහළ මට්ටමේ ප්‍රාදේශීය මාර්ග ජාලයක් මගින් සම්බන්ධ කරවීම සංකල්පිත සැලැස්මේ දී අදහස් කෙරේ. නගර මධ්‍යයේ පිහිටි දුම්රිය ස්ථානය ආශ්‍රිතව ගොඩනැගෙන නව නගර මධ්‍යස්ථානයක් මෙම සැලැස්ම මගින් හඳුනාගත හැකි ය. විශ්ලේෂණයන්ගෙන් අවබෝධ කරගත් පරිදි මිහින්තලය නගර මධ්‍යය තවදුරටත් වර්ධනය වීම සඳහා වාණිජ කටයුතු සඳහා අවශ්‍ය ඉඩම්, සංවේදි පුරා විද්‍යා ප්‍රදේශය තුළ සොයා ගැනීමට අපහසු බැවින්, මෙම නව මධ්‍යස්ථානය හඳුනාගන්නා ලදි. මෙම නව නගර මධ්‍ය ප්‍රදේශය ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ වන යෝජිත නව විකල්ප මාර්ග අතර සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. නගර මධ්‍යය ප්‍රදේශයේ ඉඩම් මේ වන විට සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන ඇති අතර, ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යෝජිත නගර මධ්‍යය ප්‍රදේශය යොදා ගැනීමට අපේක්ෂා කරයි. එහිදි උසස් අධ්‍යාපන, සංචාරක, ආගමික කටයුතු හා පරිපාලනමය අංශ ඇතුළත් වන ලෙස නගර මධ්‍යය සංවර්ධනය කිරීමට අපෙක්ෂා කරයි. නව සංවර්ධන ප්‍රදේශ දෙකක් යෝජිත විකල්ප මාර්ගය මගින්

සම්බන්ධ වන අතර, එම සංවර්ධන ප්‍රදේශ දෙක පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයෙන් ඉහල ප්‍රදේශය හා පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයෙන් පහළ ප්‍රදේශය ලෙස සංවර්ධනය වේ. ඉහළ ප්‍රදේශය තුළ වාණිජ කටයුතු, උසස් අධ්‍යාපන සේවා සහ විනෝදාත්මක කටයුතු සඳහා සංවර්ධනයට ඉඩ ලබාදීමට අපේක්ෂිතය. එමෙන්ම පහළ ප්‍රදේශය දුම්රිය මංසන්ධිය සිට දකුණු දෙසට රජයේ ආයතන, වන්දනාකරුවන් සඳහා පහසුකම් පුරා විද්‍යා කටයුතු සඳහා පහසුවෙන් ලඟා විය හැකි ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට අදහස් කෙරේ.

රූපසටහන 8: නගර මධ්‍යය සංකල්පය.



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

රූපසටහන 9: මිහින්තලය ප්‍රදේශයේ වසර 2030 දී අපේක්ෂිත දර්ශනය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

6.2 යෝජිත ඉඩම් පරිහරණ උපාය මාර්ග

යෝජිත නගර ව්‍යුහ සැලැස්මේ අපේක්ෂිත සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි ප්‍රදේශයේ පවතින ඉඩම් යෝජිත කාර්යයන් සඳහා වෙන් කරමින් කළමනාකරණය කිරීම මෙම සැලැස්මේ මූලික අරමුණයි. පවතින ඉඩම් භාවිතයේ ඇති දුර්වලතා එනම් එකිනෙකට නොගැලපෙන භාවිතයන්, සඳහා නුසුදුසු ලෙස ඉඩම් භාවිතා කිරීම වැනි දුර්වලතා අවම කර යෝජිත අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ඉඩම් වෙන් කිරීම තුළින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම අපේක්ෂා කෙරේ.



සිතියම 8: භූමි පරිභෝජනය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

මිහින්තලය සංවර්ධන සැලැස්ම මඟින් හඳුනාගත් ඉඩම් කොටස් මිහින්තලය නගර සංවර්ධන සැලැස්මේ භාවිතයන් හි සංවර්ධනය සඳහා වෙන් කර ඇත. විස්තර කිරීමේ පහසුව සඳහා ප්‍රධාන වශයෙන්ම එම කලාප කොටස් 03 කට වෙන් කර ගන්නා ලදි.

1. මාතලේ හන්දිය සංවර්ධන ප්‍රදේශය
2. මිහින්තලේ නගර මධ්‍ය සංවර්ධන ප්‍රදේශය
3. මහකනදරාව සංවර්ධන ප්‍රදේශය

ප්‍රධාන වශයෙන් ඉහත ප්‍රදේශ ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් නේවාසික සංවර්ධන කටයුතු ව්‍යාප්ත කරවීමට බලාපොරොත්තු වේ.මෙම ප්‍රදේශ වලින් පරිබාහිරව ස්වභාවික පරිසර පද්ධති පැතිරී ඇති ප්‍රදේශ ද මෙම ඉඩම් සංවර්ධන සැලැස්ම මඟින් හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම වනාන්තර ප්‍රදේශ හා පුරාවිද්‍යා සංරක්ෂිත ප්‍රදේශ කුඹුරු හා වැව් පද්ධති මෙම යෝජිත ඉඩම් පරිහරණ සැලැස්මේ අංග ලෙස හඳුනාගෙන ඇත.

1. මාතලේ හන්දිය සංවර්ධන ප්‍රදේශය

මාතලේ හන්දිය සංවර්ධන ප්‍රදේශයේ මහ නගර සභා බල ප්‍රදේශයට ආසන්නයේ පිහිටා ඇති බැවින් මහ නගර සභා ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වල ඉහල බලපෑමක් මෙම ප්‍රදේශයේ ඉඩම් පරිහරණයට බලපා ඇත. එම නිසා අනාගතයේ මෙම ප්‍රදේශය තුළ මිශ්‍ර සංවර්ධනයන් සිදු කිරීම අරමුණු වේ. එහිදි මෙම ප්‍රදේශය තුළ නේවාසික භාවිතාවන් මෙන්ම ස්වාභාවික වැව් පද්ධතිය ද ආරක්ෂා වන පරිදි සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි. විශේෂයෙන්ම මෙම ප්‍රදේශ අනුරාධපුර ලෝක උරුම නගරයට ප්‍රවේශ වන ස්ථානයක පිහිටි බැවින් සැලසුම් සහගත ඉඩම් පරිහරණයකට යොමු වීම හඳුනාගෙන ඇත.

රූපසටහන 10: මාතලේ හංදිය සංවර්ධන ප්‍රදේශයේ හරස්කඩක්



2. මිහින්තලය නගර මධ්‍යය ප්‍රදේශය

මිහින්තලය නගර මධ්‍යය ප්‍රධාන වශයෙන්ම සැලසුම් ප්‍රදේශයේ පරිපාලන මධ්‍යස්ථානය හා වාණිජ මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියා කරනු ලබයි. මෙහි අනාගත ඉඩම් පරිහරණය හඳුනාගැනීමේ දී ඉස්මතු වූ ලක්ෂණය වුයේ නගර මධ්‍යයේ පවතින විශාල පුරා විද්‍යා රක්ෂිතයයි. මෙම පුරා විද්‍යා රක්ෂිතය නගරයේ පැවැත්ම සඳහා අවශ්‍යතාවය වන බැවින් එය සංරක්ෂණය වන පරිදි අනාගත ඉඩම් භාවිතයන් සිදු කල යුතු බව පැහැදිලි විය. ඒ අනුව මිහින්තලය දුම්රිය ස්ථානය හා අඹතලාගම මංසන්ධිය ආශ්‍රිතව අනාගතයේ ඉහල වාණිජ හා සේවා පහසුකම් සහිත ඉඩම් සංවර්ධනයන් සිදු කිරීමට බලාපොරොත්තු වේ. එහිදී එම ප්‍රදේශය රජරට විශ්ව විද්‍යාලය ආශ්‍රිතව ගොඩනැංවෙන අතර, මිහින්තලය පුරා විද්‍යා රක්ෂිතය හා ප්‍රදේශයේ සංචාරක නැරඹුම් ස්ථාන සඳහා පහසුකම් ව්‍යාප්ත කරලීම තුළින් එම ඉඩම් සංවර්ධනය සිදු කිරීමට බලාපොරොත්තු වේ. එමෙන්ම දැනට මිහින්තලය මංසන්ධිය ආශ්‍රිතව අඩු පැතිරීමකින් යුක්තව ඉඩම් සංවර්ධනනය කිරීමට බලාපොරොත්තු වන අතර, එහිදී මිහින්තලය වැව හා පුරා විද්‍යා රක්ෂිතය ආශ්‍රිතව ස්වාභාවික පරිසර පද්ධති ආරක්ෂා වන පරිදි ඉඩම් සංවර්ධනය කිරීම අරමුණු කර ඇත.

රූපසටහන 11: මිහින්තලය නගර ප්‍රදේශයේ හරස්කඩක්



3. මහකනදරාව සංවර්ධන ප්‍රදේශය

නගර ප්‍රදේශයෙන් බාහිරව පිහිටි මෙම ප්‍රදේශයේ ඉඩම් සංවර්ධනය ප්‍රධාන වශයෙන්ම නේවාසික කටයුතු සඳහා සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. එහිදී දැනට පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින්, සැලසුම් ප්‍රදේශයේ පවතින ප්‍රධාන නේවාසික කලාපයන් ලෙස ස්වාභාවික වැව් පද්ධති හා කුඹුරු පද්ධති සංරක්ෂණය වන අයුරින් සංවර්ධනය කිරීම හඳුනාගෙන ඇත

රූපසටහන 12: මහකනදරාව සංවර්ධන ප්‍රදේශයේ හරස්කඩක්



6.3 භෞතික හා සාමාජීයීය අපරව්‍යුහ සංවර්ධන උපාය මාර්ග

6.3.1 යෝජිත සේවා සැපයුම් සැලසුම

යෝජිත සේවා සැපයුම් සැලසුම යටතේ, මිහින්තලය නගර සංවර්ධන සැලැස්මේ හඳුනාගත් දැක්ම වන "සංස්කෘතික උල්පතේ නේවාසික උද්‍යානය" යන සංකල්පය ළඟා කර ගැනීම සඳහා උපකාරී වන ලෙස මෙම සේවා සැපයුම් උපක්‍රම සකස් කර ඇත. මෙහිදී සැලසුම් ප්‍රදේශය තුළ අධ්‍යාපන හා සෞඛ්‍යය යන සේවා සැපයීම මෙන්ම වාණිජ හා පරිපාලන සේවා සැපයීම් සම්බන්ධව උපක්‍රම සැකසීම අපේක්ෂා කෙරේ. වර්තමානය වන විට සැලසුම් බල ප්‍රදේශය තුල මෙම ක්ෂේත්‍ර සම්බන්ධව ගැටලුකාරී තත්ත්වයක් නොපැවතුන ද, වසර 2030 වන විට සෞඛ්‍යය ක්ෂේත්‍රය හා වාණිජ සේවා සැපයීමේදි ගැටලුකාරී තත්ත්වයන් උද්ගත වන බව විශ්ලේෂණය මඟින් අනාවරණය කරගත හැකිය.

6.3.1.1 සෞඛ්‍යය ක්ෂේත්‍රය

සෞඛ්‍යය ක්ෂේත්‍රය යටතේ දැනට මිහින්තලය සංවර්ධන බල ප්‍රදේශය තුළ මිහින්තලය හා තම්මැන්නාව ලෙස රෝහල් 02 ක් පිහිටා ඇති අතර, මෙම රෝහල් මගින් 24 600 කට අධික පිරිසකට පහසුකම් ලබාදේ. පුරෝකථනයන්ට අනුව, එම ප්‍රමාණය 48 000 ක් දක්වා ඉහළ යන අතර, මිහින්තලය රෝහල සංවර්ධනය වීම අත්‍යවශ්‍යය අංගයක් ලෙස හඳුනාගෙන ඇත. මිහින්තලය රෝහල පුරා විද්‍යා සංවේදි කලාපයේ ස්ථාන ගත වී ඇති බැවින්, ඉදිරි සංවර්ධන කටයුතු සඳහා ඉඩ ලබා නොදෙන අතර, ඒ සඳහා සුදුසු ප්‍රදේශයක් අඹතලාගම මංසන්ධිය ආසන්නයෙන් හඳුනාගෙන ඇත. එම ප්‍රදේශය ත්‍රිකුණාමලය මාර්ගය ආසන්නයේ පිහිටීම මත සහ රජරට විශ්වවිද්‍යාලය හා සම්බන්ධව සංවර්ධනය වන වාණිජ ප්‍රදේශයේ සෘජු බලපෑම මත ද රජයේ ආයතනික ප්‍රදේශය ද අඹතලාගම හා දූම්රිය මංසන්ධිය අතර ප්‍රදේශයේ සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය විශාල දායකත්වයක් ලබා ගත හැකිය. මේ යටතේ හඳුනාගත් ප්‍රධාන ව්‍යාපෘතිය වනුයේ මිහින්තලය රෝහල අඹතලාගම මංසන්ධියට රැගෙන යාමය මෙම සම්බන්ධව යෝජනා ක්‍රියාත්මක කිරීමේදි එම විෂය සම්බන්ධව ක්‍රියාත්මක වන්නා වූ සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රමුඛ අදාල ආයතන එම සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු වේ. (ආයතනික සැලැස්ම පරිහරණය කරන්න).



සිතියම 9: සෞඛ්‍ය සේවා උපාය මාර්ග

6.3.1.2 අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය

1. පාසැල් අධ්‍යාපනය පිළිබඳ යෝජනා

මිහින්තලය සැලසුම් ප්‍රදේශය තුල වසර 2030 වන විට අධ්‍යාපනික සේවා සැපයීම සඳහා පුරෝකථනය කරන ලද ශිෂ්‍ය ජනගහනයට අවශ්‍ය භෞතික සම්පත් සංවර්ධනය කිරීම සැලැස්ම මගින් හඳුනා ගන්නා ලදී. එහිදි මිහින්තලය මහා විද්‍යාලය, පතිරාජ තෙන්නකෝන් ප්‍රාථමික විද්‍යාලය, මුස්ලිම් විද්‍යාලය, කම්මලක්කුලම විද්‍යාලය, කුරුන්දන්කුලම විද්‍යාලය යන විද්‍යාල වල, අදාල පොදු ගැටළු වන ගොඩනැගිලි ගැටළු, ක්‍රීඩා පිටි වල පවතින ගැටළු මෙම සැලැස්ම මගින් හඳුනාගත් අතර, එම ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ආදල ආයතන මගින් සිදු කළ යුතුය (ආයතනික සැලැස්ම පරිහරණය කරන්න).





සිතියම 10: පාසැල් පෝෂක ප්‍රදේශය

2. උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ යෝජනා

මිහින්තලය නගර සංවර්ධන සැලැස්ම මඟින්, රජරට විශ්ව විද්‍යාලය හා ඒ වටා අනෙකුත් අධ්‍යාපන මධ්‍යස්ථාන සම්බන්ධ කරගනිමින් අධ්‍යාපන කේන්ද්‍රයක් සංවර්ධනය කිරීම සඳහාත් ඒ තුළින් උසස් අධ්‍යාපන ආයතන හා පර්යේෂණ කටයුතු සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමටත් අපේක්ෂා කරනු ලබන අතර, උසස් අධ්‍යාපන කටයුතු නංවාලීම සඳහා රජරට විශ්ව විද්‍යාලය තුළ පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදි.

1 විශ්ව විද්‍යාල සිසුන් සඳහා නේවාසික පහසුකම් සංවර්ධනය කිරීම

2 විශ්ව විද්‍යාලය තුළ අවශ්‍යය ප්‍රමාණයට සරිලන පරිදි දේශන ශාලා ඉදි කිරීම

3 විශ්ව විද්‍යාලයට ප්‍රවේශ වන ප්‍රධාන දොරටුව සහ මාර්ග වීධිමත් සැලැස්මකට අනුව සංවර්ධනය කිරීම

4 ගෘහස්ථ ක්‍රීඩාගාර ඉදිකිරීම

5 පීඨ සඳහා අවශ්‍යය වන ගොඩනැගිලි පහසුකම් සැපයීම



සිතියම 11: රජරට විශ්ව විද්‍යාලය සංවර්ධන ප්‍රදේශය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

6.3.2 යෝජිත ප්‍රවාහන සැලසුම

කාර්යක්ෂම සැලසුම්ගත මාර්ග පද්ධතියක් හා අත්‍යවශ්‍යය අපරව්‍යුහ පහසුකම් තිබීම. නගරයක් භෞතික වශයෙන් සංවර්ධනය කරා ගෙන යාම සඳහා අවශ්‍ය වැදගත්ම සාධකය වේ. එබැවින්, මහනුවර සහ යාපනය යන ප්‍රධාන නගර 02 ක සම්බන්ධ කරන මහනුවර - යාපනය ප්‍රධාන මාර්ගය සහ පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය දෙපසට පමණක් සීමා වී ඇති රේඛීය සංවර්ධන ප්‍රවණතාවයන් නගරයේ සෙසු ප්‍රදේශ කරා විහිදුවා යැවීම සඳහා නගරයේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම මෙම සැලැස්මේ මූලික පරමාර්ථය වේ. හදුනාගත් දැක්ම හා කලාපියකරණ සැලැස්ම අනුව මිහින්තලය සංවර්ධන සැලසුම් ප්‍රදේශය මාතලේ හංදිය, මිහින්තලය නගර ප්‍රදේශය හා මහකනදරාව ජනපද ප්‍රදේශය ලෙස හදුනාගත් කලාපයන් තුළ සංවර්ධනය කෙරේ. මෙහි දී දැනට එම ප්‍රදේශ අතර, පවතින මාර්ග වල අන්තර් සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම එක් අවශ්‍යතාවයක් ලෙස හදුනාගෙන ඇත. වසර 2030 වන විට සැලසුම් ප්‍රදේශය තුළ නේවාසික ජනගහනය 48 000 ක් දක්වා ද එදිනෙදා නගරයේ සැරිසරන ජනගහනය 4 500 ක් පමණ දක්වාද ඉහළ යන බව පුරෝකථනය කර ඇත. ඒ අනුව නාගරික ප්‍රදේශය තුළ මෙන්ම නේවාසික ප්‍රදේශ තුළද මාර්ග සම්බන්ධතාවය ඉහළ නැංවීම අත්‍යවශ්‍යය සාධකයක් ලෙස හදුනාගන්නා ලදි. විශේෂයෙන්ම පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයට දකුණින් පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල මාර්ග සම්බන්ධතාවය මිහින්තලය නගරයට අභිමුඛ වන පරිදි සංවර්ධනය විය යුතු බව හදුනාගන්නා ලදී.

වර්තමානයේ දී පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයේ මිහින්තලය සිට අනුරාධපුර දක්වා මාර්ග කොටසේ දිනකට රථවාහන 5500 කට ආසන්න ප්‍රමාණයක් ගමන් කරනු ලබයි. එය වසර 2030 වන විට 11 000 - 12 000 ත් අතර, ප්‍රමාණයක් දක්වා ඉහල යනු ඇති බවට පුරෝකථනය කර ඇත. එහිදි මාර්ගය දෙපස භූමි අලංකරණය කිරීම, විදී ලාම්පු සවි කිරීම, ඇතුළු මාර්ග පරිහරණය කරන්නන්ගේ සේවා අවශ්‍යතාවයන්ට සරිලන පරිදි මාර්ගයේ ධාරිතාව ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

විශේෂයෙන්ම පොසොන් පොහොය සමයේ මිහින්තලය ප්‍රදේශය තුළ ඇති වන තදබදය අවම කිරීමට මෙන්ම නගර මධ්‍යයේ පිහිටා ඇති පුරා විද්‍යා භූමි ප්‍රදේශය සංරක්ෂණය කිරීමේ උපක්‍රමයක් ලෙස මහනුවර - යාපනය මාර්ගය සඳහා විකල්ප මාර්ගයක් සකසනු ලැබේ. මෙම විකල්ප මාර්ගය දුම්රිය ස්ථානය ඉදිරිපසින් ගමන් කරනු ලබන අතර, පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය හා මෙම විකල්ප මාර්ගය ඡේදනය වන ස්ථානය නව සේවා ස්ථානයක් ලෙස සංවර්ධනය කරනු ලැබේ.

නේවාසික ප්‍රදේශ අතර, සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම ද මාර්ග සංවර්ධන සැලැස්මේ එක් උපක්‍රමයකි. විශේෂයෙන්ම ප්‍රධාන මාර්ග වලින් දුරස්ථව පිහිටි නේවාසික ප්‍රදේශ වල මාර්ග වැඩිදියුණු කිරීම, මාර්ග දෙපස සූර්යය විදුලි ආලෝකය සැපයීම, බස්නැවතුම් ස්ථාන ඉදිකිරීම වැනි ව්‍යාපෘති මෙහි දී හදුනාගෙන ඇත. එමෙන්ම පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයට සමාන්තරව නේවාසික ප්‍රදේශ යා කරමින් ඇති මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ද මෙහි දි හදුනාගෙන ඇත. නේවාසික ප්‍රදේශ අතර, මාර්ග ජාලයේ බිඳී යාම්

61 ක් පමණ සැලසුම් ප්‍රදේශය තුළ දැනට හඳුනාගෙන ඇති අතර එම මාර්ග එකිනෙකට සම්බන්ධ කරවීම තුළින් ප්‍රදේශයේ පොදු ප්‍රවාහන පද්ධතිය නේවාසික ප්‍රදේශ තුළ ව්‍යාප්ත කරවීම ද මෙමඟින් අපේක්ෂා කෙරේ.

1 නේවාසික ප්‍රදේශ අතර සුමට සම්බන්ධතාවයක් වර්ධනය කිරීම.

2 මහනුවර - යාපනය ප්‍රධාන මාර්ගය සඳහා විකල්ප මාර්ගයක් සංවර්ධනය කිරීම.

දැනට මහනුවර - යාපනය මාර්ගය පුරා විද්‍යා ප්‍රදේශය හරහා ගමන් කරන බැවින්, කටුසෑය වැනි පුරා විද්‍යා ස්මාරක ඉතා අවදානම් තත්ත්වයකට පත්ව ඇත. එමෙන් ම, වසර 2030 වන විට ශ්‍රී ලංකාවේ උතුරු හා දකුණු ප්‍රදේශ වල සිදුවන සංවර්ධනය නිසා, වාහන ගමනාගමනය ශීඝ්‍ර ලෙස ඉහළ යනු ඇති බවට රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණ මත අනුමාන කල හැකි අතර, එහිදි මහනුවර - යාපනය මාර්ගය තවදුරටත් පුළුල් කරලීමට අවශ්‍ය අවකාශය නොලැබී යයි. ඒ සඳහා පුරා විද්‍යා ප්‍රදේශය මඟ හැර විකල්ප මාර්ගයකට යොමු වීම අත්‍යවශ්‍යය සාධකයකි.





සියයම 12: යෝජිත මාර්ග පද්ධතිය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

උතුරු මැද පළාත් කාර්යාලය — මිහින්තලය සංවර්ධන සැලැස්ම 2019 - 2030 — සැකසුම්: ඒ ඒ එස් මුධුංග

6.3.3 යෝජිත ජල සැපයුම් සැලසුම

මිහින්තලය සැලසුම් බල ප්‍රදේශය නිරන්තර නියඟයෙන් පීඩා විඳින අතර, ප්‍රදේශයේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන්නේ මහකනදරාව වැවයි. එමෙන් ම ප්‍රදේශය පුරා කුඩා වැව් 35 ක් පමණ දැකිය හැකි අතර, මෙම වැව් මගින් කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය බෙදා හැරීම සිදු වේ. නාගරික ප්‍රදේශය සඳහා තුරුවිල ජලාශය හා විවිධ ප්‍රජාමූල ජල ව්‍යාපෘති මඟින් නාගරික ප්‍රදේශය තුළ ජල අවශ්‍යතාවය සම්පූර්ණ කරන නමුත්, වකුගඩු රෝගය ද ප්‍රදේශය පුරා ව්‍යාප්ත වී ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, සම්පූර්ණ සැලසුම් බල ප්‍රදේශය සඳහාම ප්‍රධාන ජල මූලාශ්‍රයක් මඟින් ජල සැපයුම ලබා දීම සඳහා සැලසුම් කිරීම අත්‍යවශ්‍ය බව පැහැදිළි වේ.

වසර 2030 වන විට සැලසුම් ප්‍රදේශය තුළ අපේක්ෂිත ජනගහනය 48 000 ක් ද පමණ වන අතර, සැරිසර ජනගහනය සහ මංමාවත් අවශ්‍යතා සහ පූජා නගර ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා ද ඇතුළු ව සැලසුම් බල ප්‍රදේශයේ අවම දෛනික ජල අවශ්‍යතාවය ඝන මීටර් 6 700 ක් පමණ වනු ඇතැයි ගණනය කර ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ව්‍යාපෘති මඟින් එම අවශ්‍යය ජල සැපයුම මිහින්තලය සැලසුම් බල ප්‍රදේශයට සැපයීමට හැකි වන බවට පුරෝකථනය කර ඇත. මේ සඳහා ජල මූලාශ්‍රය ලෙස නාච්චාදූව වැව යොදාගනු ලබන අතර, මොරගහකන්ද ව්‍යාපෘතියේ ජලය උතුරු ඇල මඟින් මහකනදරා වැවට ලබාදීමට නියමිත බැවින්, කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සැපුරාලිය හැකි වනු ඇති බවට ද හඳුනාගෙන ඇත.

යෝජිත ජල සැපයුම් සැලසුම ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛතා ප්‍රදේශ ලෙස මහකනදරාව යාය 1 , මහකනදරාව යාය 2, මහකනදරාව යාය 3 ප්‍රදේශ ද බෝගහයාය, මරදන්කුලම, දොරමඩලාව වැනි ප්‍රදේශ සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.

එමෙන්ම මිහින්තලය ජල සැපයුම් සැලසුම ක්‍රියාත්මක කිරීමේදී රජරට විශ්ව විද්‍යාලය, විශේෂ ප්‍රවේශයක් ලෙස සලකා ඊට අවශ්‍ය ජල සැපයුම ලබාදිය යුතුය. මෙහිදී වර්ෂය පුරා අඛණ්ඩ ජල සැපයුමක් රජරට විශ්ව විද්‍යාලය හා අවට නේවාසිකාගාර සඳහා ලබාදීමට විශේෂ ජල සැපයුම් ව්‍යාපෘතියක් අදාල සේවාව සපයන ආයතන මඟින් ක්‍රියාත්මක කළ යුතුය.



සිතියම 13: ජල සැපයුම් ප්‍රමුඛතා ප්‍රදේශ

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

6.3.4 යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම.

යෝජිත සැලසුම

අනාගත කසල කළමනාකරණ අවශ්‍යතාවය වෙනුවෙන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම සඳහා මිහින්තලය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොච්චිකුලම් හි වන සංරක්ෂන දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 01 ක පමණ භූමියක ව්‍යාපෘති සැලසුමක් සකස් කර ඇත

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන්

මිහින්තලය ප්‍රාදේශීය සභා සිමාවේ දැනට පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදය තුළ ඝන අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීමට හෝ පරිසර හිතකාමී ලෙස ඝන අපද්‍රව්‍ය බැහැරලිමට අදාල පියවර ගෙන නොමැත. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ වගකීම පූර්ණ වශයෙන් ම සතු මිහින්තලය ප්‍රාදේශීය සභාවට එය ආදායම් මාර්ගයක් කර ගැනීම සඳහාදව දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් සමස්ත බැහර කිරීම අවම කිරීම සඳහාද ප්‍රාදේශීය සභාව සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව සමග එක්ව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට අදාලව ගත හැකි සැලසුම් සහගත ක්‍රමෝපායන් පහත දැක්වේ.

ක්‍රමෝපාය 01 - ඝන අපද්‍රව්‍ය ජනනය අවම කිරීම

ගෘහස්ථ, වෙළඳ, කාර්මික, ක්ෂේත්‍රයන්හි ඝන අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම සඳහා විධි ක්‍රම හඳුන්වා දීම.

i. පොදු ස්ථාන හා පාසැල් තුළ දැනුවත් කිරීමේ හා අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කර ඒ හරහා මහජනයාට කසල කළමනාකරණය පිළිබඳ පවතින 10R වැනි සංකල්පය හඳුන්වා දි ඒ තුළින් ඝන අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම.

ක්‍රමෝපාය 02 - ජනනය වූ කසල ජනනය වන ස්ථානයේදීම වෙන් කිරීම

උදා: ගෘහස්ථ, ආයතනික, වෙළඳ, කාර්මික ලෙස සහ කසල වල ස්වභාවය අනුව වර්ගීකරණය කර වෙන් වෙන්ව හඳුනාගත හැකි බඳුන් තැබීම. එනම්,

(අ) කාබනික - කොළ පාට
(ආ) කඩදාසි - නිල් පාට
(ඇ) ප්ලාස්ටික් - තැඹිලි පාට
(ඈ) ලෝහ - දුඹුරු පාට
(ඉ) වීදුරු - රතු පාට

පළාත් පාලන අයාතනය මගින් නිවාස, වෙළඳ ආයතනය සඳහා කසල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකිරීම.
- අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් නිරතුරුව සංවිධානය කිරීම සහ එමගින් වෙන් නොකරන කසල එකතු නොකිරීමේ ක්‍රමවේදය ළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ඒ අනුව ක්‍රියාත්මක කිරීම.

ක්‍රමෝපාය 03 - කෙටි කාලීන ජෛව හායනය වන සියලුම ඝන අපද්‍රව්‍ය කාබනික පොහොර (කොම්පෝස්ට්) බවට පත් කිරීම ප්‍රවර්ධනය කිරීම. ජනතාව ඒ සඳහා යොමු කිරීම සහ කාබනික පොහොර සඳහා ලාබදායී වෙළඳ පොළ වල් හඳුන්වා දීම.

i නිවාස හා ආයතන වල ජනනය වන ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය ඒවා ජනනය වන ස්ථානයේදීම කාබනික පොහොර බවට පත් කිරීම.

උදා:- කොම්පෝස්ට් බඳුන්, වල ක්‍රමය, පීවෙ කොටු ආදි ක්‍රම හඳුන්වාදීම.

ii. විශාල ප්‍රමාණයෙන් ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය උත්පාදනය වන ස්ථාන

උදා:- හෝටල්, රෝහල් ආදි ස්ථාන සහ කොම්පෝස්ට් කිරීම සිදු නොකරන නිවාස ආදිය සඳහා පළාත් පාලන ආයතන මගින් පාලනය වන ස්ථානයක සරල තාක්ෂණික ක්‍රම භාවිතයෙන් කොම්පෝස්ට් නිපද වීම.

iii. සෑම නිවසක්ම කොම්පෝස්ට් බඳුනක් භාවිතා කිරීම හෝ පහසු තාක්ෂණයක් භාවිතය මගින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා දිරි ගැන්වීම සහ එමගින් ගෘහස්ථ කාබනික එළවළු, පළතුරු වගාව වැඩි කිරීම සහ කාබනික එලවළු වෙළඳපොල දිරිමත් කිරීම.

ක්‍රමෝපාය 04 - රෝහල් සහ රජයේ ආයතන තුළ පීව වායු නිෂ්පාදනයේ ස්ථාපනය කිරීම.

i. ජෛව හායනය වන ආහාරමය අපද්‍රව්‍ය, කෘෂි කාළුමික අපද්‍රව්‍ය, පීව වායු නිෂ්පාදනවය කිරීම සඳහා යොදාගත හැකි අතර, නිෂ්පාදනය වන පීව වායුව ආහාර පිසිම, ආලෝකකරණය වැනි දේ සඳහා යොදා ගැනීම.

ක්‍රමෝපාය 05 - ජෛව හායනය වන ආහාරමය ද්‍රව්‍ය උෆරු කොටු වලට ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම

ක්‍රමෝපාය 06 - ජෛව හානයන නොවන (ප්‍රතිචක්‍රිකරණය කළ හැකි) සන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම

i. සෑම මට්ටමකම ජනතාව තුළ භාණ්ඩ නැවත භාවිතය වැනි සංකල්ප ප්‍රවර්ධනය සඳහා ආකල්පමය වෙනසක් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම (පාසැල් සහ ආයතනික මට්ටමින්)

ii. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සන අපද්‍රව්‍ය (වීදුරු, කඩදාසි, ලෝහ) මිලිදි ගනු ලබන ස්ථාන පිහිටුවීම, ප්‍රචලිත කිරීම සහ දිරි ගැන්වීම, වෙළඳපොල සහ ව්‍යවසායකයින් වර්ධනය කිරීම.

iii. පළාත් පාලන ආයතන මගින් ප්‍රතිචක්‍රිකරණය කළ හැකි සන අපද්‍රව්‍ය මිළදි ගනු ලබන ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම, ඔවුන් සමග නිරතුරු සම්බන්ධතා පවත්වා ගැනීම සහ ඒ පිළිබඳ තොරතුරු ජනතාව වෙත ලබාදීම.

iv. එකතු වන කසල අතර ඇති පොල්කටු, යකඩ, ප්ලාස්ටික්, විදුලි උපකරණ වැනි දේ සඳහා කසල පොළ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

ක්‍රමෝපාය 07 - නාගරික සන අපද්‍රව්‍ය වෙත රෝහල් මගින් නිකුත් කරන සායනික සන අපද්‍රව්‍ය එකතු

ක්‍රමෝපාය 07 - නාගරික සන අපද්‍රව්‍ය වෙත රෝහල් මගින් නිකුත් කරන සායනික සන අපද්‍රව්‍ය එකතු වීම වැලැක්වීම සඳහා ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කිරීම.

i. සායනික සන අපද්‍රව්‍ය වෙන් කිරීම අනිවාර්ය කිරීම

ii. සායනික සන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීමට පෙර ඒවා අසාධනය නොවන ද්‍රව්‍ය බවට පත් කිරීම අනිවාර්ය කිරීම.

iii. සායනික සන අපද්‍රව්‍ය සෞඛ්‍යාරක්සිතව බැහැර කිරීම සඳහා රෝහල් තුලම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ක්‍රමෝපාය 08 - ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම.

i. දොරින් දොර එකතු කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

ii. ඝන අපද්‍රව්‍ය එකතු කරන දින සහ එම දින වල එකතු කරනු ලබන ඝන අපද්‍රව්‍ය වර්ග (ප්ලාස්ටික් පොල්කටු, වීදුරු ආදි ලෙස) පිළිබඳව කාලසටහන් නිවෙස් සඳහා ලබා දීම (පළාත් පාලන ආයතනය මගින්)

iii. ඝන අපද්‍රව්‍ය එකතු කරනු ලබන වාහනය පැමිණීමේදි "සීනුවක් නාද කිරීම".

iv. පළාත් පාලන ආයතන වලට කොම්පෝස්ට් අංගන සඳහා අවශ්‍ය උපකරණ සහ පහසුකම් ලබාදීම.

v. ඝන අපද්‍රව්‍ය වර්ග සඳහා එකතු කරන වාහනයේ වෙන් කළ කොටස් තැබීම.

vi. බර වාහන ලගා විය නොහැකි ස්ථාන වල අත් කරත්ත මගින් ඝන අපද්‍රව්‍ය එකතු කිරීම.

ක්‍රමෝපාය 09 - සනීපාරක්ෂක බිම්

i. ජෛවීය ක්‍රියාවලියට සහ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට භාවිතා කළ නොහැකි ජීර්ණය නොවන අක්‍රිය සහ අනෙකුත් කසල බිම් පිරවීම සඳහා යොදාගැනීම සුදුසු වන අතර, තනි පළාත් ආයතනයක් මගින් සනීපාරක්ෂක බිම් පිරවුමක් ස්ථාපනය කිරීම මූල්‍යමය වශයෙන් ප්‍රායෝගික නොවන අතර, පළාත් පාලන ආයතන කිපයක් එකතු වී එය සිදු කිරීම ප්‍රායෝගික වේ.

ක්‍රමෝපාය 10 - විද්‍යුත් ඝන අපද්‍රව්‍ය (E-Waste) කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටු වීම

i. ඉහතලන පරිසණක, යතුරු පුවරු, රූපවාහිනි, ජංගම දුරකථන, වැනි උපාංග නාගරික ඝන අපද්‍රව්‍ය සමග බැහැර නොකල යුතු අතර, එම අපද්‍රව්‍ය වෙන්කොට එක්රැස් කර ඒවා මිලදි ගැනීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම.

ක්‍රමෝපාය 11 - පසු විපරම් කමිටුවක් පිහිටුවීම

i. අදාල ආයතන වල නිලධාරි මණ්ඩලයික්න සමන්විත පසු විපරම් කමිටුවකන් පිහිටුවීම මගින් පසු විපරම් කටයුතු සිදු කිරීම.

ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති

1. කාබනික පොහොර නිෂ්පාදන අංගනයක් ස්ථාපනය කිරීම.
2. ඝන අපද්‍රව්‍ය එකතු කර වෙන් කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.
3. ප්ලාස්ටික් ප්‍රති චක්‍රිකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම.

6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ග

සැලසුම් බල ප්‍රදේශය තුළ ආර්ථික සංවර්ධන උපාය මාර්ග යෝජනා කිරීමේදී දැනට පවතින කෘෂිකාර්මික ආර්ථික රටාව මෙන්ම සංචාරක ක්ෂේත්‍රය පදනම් කරගත් ආර්ථික කටයුතු ප්‍රධාන ස්ථානයක් ගනී. වර්තමානය වන විට කෘෂිකාර්මික ආර්ථික රටාව හා සම්බන්ධව ඇති ප්‍රධාන ගැටළුව ලෙස ජල සම්පාදනය හඳුනාගෙන ඇත. එහිදී වැව් පද්ධතිය ආශ්‍රිතව ජල සම්පාදනය සඳහා ජල හිඟයක් ප්‍රදේශය තුළ හඳුනාගත හැකි වන අතර, ඒ සඳහා පිළියම් ලෙස යෝජිත මොරගහකන්ද ව්‍යාපෘතිය මගින් මහකනදරාව වැව සඳහා ජලය ලබාදීම හඳුනාගෙන ඇත. (ඇමුණුම 09) මෙමගින් වී වගාව ආශ්‍රිත කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීම අදාල ආයතන මගින් හඳුනාගෙන ඇත. ආර්ථික සංවර්ධන උපක්‍රම සැකසීමේදී ප්‍රධාන වශයෙන්ම හඳුනාගත් පරමාර්ථ වලට අනුකූල ලෙස ද ඉහත හඳුනාගත් තත්ත්වයන් අන්තර්ගත කරමින් ද එම උපක්‍රම සකසා ඇත. ඒ අනුව,

6.4.1. රජරට විශ්ව විද්‍යාලය ඉලක්ක කොට ගනිමින් වාණිජ සංවර්ධනයන් සිදුකිරීම

මිහින්තලය නාගරික ප්‍රදේශයේ දැනට පවතින සිල්ලර වෙළඳාම්, ආහාර ද්‍රව්‍ය වෙළඳාම් සක්‍රිය ලෙස පවත්වාගෙන යාමට අවශ්‍යය දායකත්වය පොසොන් උත්සව සමයේ පමණක් ලැබෙන අතර, වසරේ අනෙකුත් කාලයන් හි නගරය තුළ ඇති ආර්ථිකයේ අක්‍රිය ස්වාභාවය අවම කිරීම සඳහා විශ්ව විද්‍යාල සිසුන් හට අවශ්‍යය වාණිජ සේවා සපයමින් ආර්ථිකයට දායකත්වයක් ලබා ගැනීම මෙමගින් බලාපොරොත්තු වේ. පොත් අලෙවිසැල්, පාසල් උපකරණ, ලිපි ද්‍රව්‍යය අලෙවිසැල්, ආහාර ද්‍රව්‍යය අලෙවිසැල් සහිත වාණිජ ප්‍රදේශයක් දුම්රිය මංසන්ධිය ආසන්නයේ සංවර්ධනය කිරීම මෙමගින් බලාපොරොත්තු වේ. මෙහිදී රාජ්‍යය හා අනෙකුත් පොදු සේවා මෙන්ම, රෙදි පිළි, ගොඩනැගිලි ද්‍රව්‍ය වැනි අනෙකුත් දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍යය වන පරිදි වාණිජ කටයුතු සඳහා අපර ව්‍යුහ පහසුකම් සහිත ගොඩනැගිල්ලකින් යුක්ත බිම් කොටස් ප්‍රදේශයක් නගර සංවර්ධන සැලැස්මෙන් වෙන් කරනු ලැබේ.

සිතියම 14: ආර්ථික සංවර්ධන උපාය මාර්ග



ආර්ථික සංවර්ධන උපාය මාර්ග
මිහින්තලය සැලසුම් ප්‍රදේශය

නාගරික සංවර්ධන අධිකාරිය
2019 ජනවාරි

උතුරු මැද පළාත් කාර්යාලය | මිහින්තලය සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : ජේ ඒ එස් මදුරංග

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

6.4.1.2 සංචාරක සේවාවන් වැඩිදියුණු කිරීම.

ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන හා යෝජිත සංචාරක ස්ථාන ආශ්‍රිතව පහසුකම් සංවර්ධනය කිරීම මෙමගින් අපේක්ෂා කරන අතර, ශ්‍රී ලංකා සංචාර මණ්ඩලයේ වාර්තා පරිදි, පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය කේන්ද්‍ර කරගත් සංචාරක ගමන් මාර්ගයක් පවතින බැවින්, එම මාර්ගයේ පිහිටි සංචාරක ආකර්ශන ස්ථාන වැඩිදියුණු කරලීම මෙමගින් අදහස් කෙරේ.

පා පැදි මංතීරු සකස් කිරීම තුළින් සංචාරක ආකර්ශනය වර්ධනය කිරීම සඳහා පළමු අදියර යටතේ දුම්රිය මංසන්ධිය සිට මිහින්තලය දක්වා පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයේ පා පැදි මංතීරුව හදුනාගෙන ඇති අතර මිහින්තලය මංසන්ධියේ සිට මාතලේ හන්දිය දක්වා එම පා පැදි මංතීරු ආසන්නව දේශීය ආහාර අළෙවි සැල්, දේශීය ඖෂධ අලෙවි සැල් සංවර්ධනය කිරීම අපේක්ෂා කරයි. එමඟින්, ප්‍රදේශයේ ජනයාගේ ආර්ථිකය දියුණු කරලීමටත්, දේශීය සංස්කෘතික ලක්ෂණ ආරක්ෂා කිරීමත් අරමුණු කරනු ලබයි.

සංචාරකයින් සඳහා මාර්ගෝපදේශ පහසුකම් සැපයීම මෙන්ම ඓතිහාසික කරුණු පිළිබඳ අධ්‍යයනය කරන්නන් උදෙසා අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කිරීම, තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම තුළින් අපේක්ෂා කරයි. මෙහිදී අවශ්‍යතාවයට උචිත පරිදි පුස්තකාල පහසුකම්ද අන්තර්ජාල පහසුකම්ද සැපයීමට බලාපොරොත්තු වේ. විවේක ස්ථාන, වෙළඳසැල් සහ අනෙකුත් පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සුදුසු පියවර ගැනීම මෙමගින් අපේක්ෂා කෙරේ. මෙහිදී පහත සඳහන් ව්‍යාපෘති හදුනාගෙන ඇත.

1. බහුකාර්යය ගොඩනැගිල්ලක් ස්ථාපනය කිරීම - (පොත් අලෙවිසැල්, පාසල් උපකරණ, ලිපි ද්‍රව්‍ය අලෙවිසැල් , ආහාර අලෙවිසැල් ස්ථාන දේශීය ආහාර අළෙවි සැල්, දේශීය ඖෂධ අලෙවි සැල් ඇතුළු පැළඳුම්, ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි සැල්, සංචාරක තොරතුරු මධ්‍යස්ථානය, මහජන සේවා ස්ථාන)

2.පා පැදි මංතීරු නිර්මාණය



සිතියම 15: යෝජිත පාපැදි මංකිරුව

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

6.5 තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග.

6.5.1 යෝජිත පාරිසරික සංරක්ෂණ සැලැස්ම.

මිහින්තලය නගරයේ පවතින පුරා විද්‍යාත්මක වටිනාකම හා අනාගත ජනගහනය සඳහා සුදුසු පාරිසරික තත්ත්වයන් නිර්මාණය කිරීමේ අරමුණ මත මිහින්තලය නගරය සඳහා පාරිසරික සංරක්ෂණ සැලැස්ම සකස් කර ඇති අතර වන සංරක්ෂණ ප්‍රදේශ ලෙස හෙක්ටයාර් 4328 ක ප්‍රදේශයක් හඳුනාගෙන ඇත. නේවාසික ප්‍රදේශයන්හි ස්වාභාවික පරිසරය සංරක්ෂණය කිරීම අවශ්‍යය බැවින් හා විශ්ලේෂණය තුළින් හඳුනාගත් ගැටළුවක් වන උෂ්ණත්වය ඉහළ යාම පාලනය කිරීම සඳහා මෙම ස්වාභාවික රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය කරනු ලැබේ.

6.5.1.1 ස්වභාවික රක්ෂිත ප්‍රදේශ

මිහින්තලය සංවර්ධන සැලැස්මේ සංරක්ෂිත ප්‍රදේශ ප්‍රධාන කාණ්ඩ 03 ක් යටතේ හඳුනාගෙන ඇත.

1 පුරා විද්‍යා ප්‍රදේශ
2 වන සංරක්ෂිත ප්‍රදේශ
3 ජල පෝෂක ප්‍රදේශ

මිහින්තලය නගර මධ්‍යය ප්‍රදේශයේ අක්කර 594 ක ප්‍රදේශයක් හා දොරමඩලාව ප්‍රදේශයද ගැසට් මඟින් ප්‍රකාශිත පුරා විද්‍යා ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති අතර වසම්මලේ හා මහකනදරාව ප්‍රදේශයන්හිද ඓතිහාසික ස්ථාන ව්‍යාප්තව පවති.

මිහින්තලය නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගත් සංවේදි පරිසර පද්ධති.

1. මහකනදරාව වැව් රක්ෂිතය
2. දොරමඩලාව පුරා විද්‍යා රක්ෂිතය
3. මිහින්තලය පුරා විද්‍යා රක්ෂිතය



සිතියම 16: පාරිසරික සංරක්ෂණ ප්‍රදේශ

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

ඉහත සඳහන් ප්‍රධාන සංවේදී පරිසර කලාප සංවර්ධන ඝනත්වයක් නොමැති ලෙස සංවර්ධනය කරනු ලැබේ. එබැවින්, කලාපිකරණයේ දී එම ප්‍රදේශ අඩු ඝනත්ව ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. මීට අමතරව නේවාසික ප්‍රදේශ අතර පිහිටි ඝන කැළෑ ප්‍රදේශ හා කුඹුරු ප්‍රදේශ ද සංරක්ෂණය කිරීම මෙම කලාපිකරණය මගින් හඳුනාගෙන ඇති අතර, ස්වභාවික පාරිසරික අංග වන සත්ත්ව සහ ශාක සංරක්ෂණය සඳහා ව්‍යාපෘතියක් ලෙස වියළි කලාපිය හරිත උද්‍යානයක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. එමෙන්ම, නාගරික පරිසරය තුළ අධික උෂ්ණත්වය අවම කිරීම සඳහා අඹතලාගම සිට මහකනදරාව වැව දක්වා පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය දෙපස රුක්රෝපණ ව්‍යාපෘතියක් ද මහනුවර - යාපනය මාර්ගයේ නගර මධ්‍යයේ සිට මීටර් 300 බැගින් උතුරු හා දකුණු දෙසට රුක්රෝපණය ව්‍යාපෘතියක් ද හඳුනාගෙන ඇත.

6.5.1.2 කුඹුරු බිම් / තෙත්බිම්

මිහින්තලය නාගරික බල ප්‍රදේශයේ තෙත්බිම් පහත අකාරයට වර්ගීකරණය කර දැක්විය හැකිය.

i. මිරිදිය ජලාශ හා ජලමාර්ග, වගුරු බිම් හා හැල ඉඩම්
ii. අත්හරින ලද කුඹුරු බිම් (පුරන් වූ කුඹුරු)
iii. කුඹුරු බිම් / දෙනිය / ඕවිට / මඩිත්ත / අස් ලියද්ද
iv. කුඹුරු නොවන තෙත්බිම් කෘෂිකාර්මික ප්‍රදේශ
v. ජලාශ හා ජල මාර්ග

මිහින්තලය නාගරික බල ප්‍රදේශයෙහි තෙත් බිම් කලාපීකරණය පහත කරුණු මත පදනම් වේ.

i. පවතින ස්වාභාවය.
ii. ගං වතුර රඳවා ගැනීමේ අවශ්‍යතාවය.
iii. ආර්ථික අවශ්‍යතා සඳහා යොදා ගැනීමේ හැකියාව (වී වගාව, ධීවර කටයුතු සහ අනෙකුත් බෝග සඳහා)
iv. මිහින්තලය නාගරික බල ප්‍රදේශය තුල සිටින ප්‍රදේශවාසීන්ගේ යහපත් වූ (ධනාත්මක) අවශ්‍යතාවය.
v. තෙත් බිම්හි පරිසර විද්‍යාත්මක වටිනාකම.
vi. ගැටළු අවම කර ගැනීමේ ක්‍රමෝපාය.

ඉහත කරුණු අනුව, මිහින්තලය නාගරික බල ප්‍රදේශයෙහි තෙත් බිම් පහත අකාරයට කලාප 02 කට වෙන් කල හැක.

1. තෙත්බිම් ස්වාභාවික සංරක්ෂිත කලාපය
2. විශේෂ කුඹුරු වගා කලාපය

1. තෙත්බිම් ස්වාභාවික සංරක්ෂිත කලාපය

කැපී පෙනෙන ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

2. විශේෂ කුඹුරු වගා කලාපය

පවතින කුඹුරු වගා හා පුරන් වූ කුඹුරු බිම් මෙම කලාපයට අයත් වේ.

සිතියම 17: යෝජිත තෙත් බිම් සැලැස්ම



6.5.1.2.1 කුඹුරු බිම් / තෙත්බිම් සංරක්ෂණ මාර්ගෝපදේශ

01. පැහැදිළිව හඳුනාගත හැකි භූ දර්ශන / සංස්කෘතික / පුරාවිද්‍යාත්මක / ජෛව විවිධත්වය ඉහල අගයක් ඇත ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

02. තෙත් බිම් වල අනුමත කාර්යයන් වලදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා වෙනත් සුදුසු ළඟම ස්ථානයක ස්ථනගත කල යුතුයි.

03. සංවර්ධනකරුවන්/ සංවර්ධකයන් විසින් සැලසුම් සකස් කිරීම, නිර්මාණ සහ අධීක්ෂණ කටයුතු සඳහා අදාළ සෑම ක්ෂේත්‍රයකම නිපුණතාවක් ඇති අදාල ආයතන වල වෘත්තීය සුදුසුකම්ලත් වෘත්තීය වේදීන්ගේ සේවය ලබා ගත යුතුය.

04. මසුන් සහ අනෙකුත් ජලජ ජීවීන් අභිජනනය වන සියළු ප්‍රදේශ විශේෂයෙන් ආරක්ෂා කල යුතුය.

05. මෙම තෙත් බිම් කලාප තුළ කසළ බැහැර කිරීම සඳහා අවසර නොදිය යුතුය. (ගෘහස්ත, ආයතනික, කාර්මික, වෙළඳ, විද්‍යුත්, සහ සායනික අපද්‍රව්‍ය)

06. අප ජලය බැහැර කරන අවස්ථා වලද මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියට යටත්ව පිරිපහදු කල ජලය පමණක් මුදා හැරිය යුතුය.

07. තෙත් බිම්හි ධීවර කටයුතු මිනිස් ශ්‍රමයෙන් භාවිතා නරන ඔරු, බෝට්ටු මඟින් පමණක් සිදු කල යුතුය.

6.5.2 භූ දර්ශන කළමනාකරණ සැලැස්ම

1. ප්‍රදේශ අලංකරණය

මිහින්තලය සැලසුම් ප්‍රදේශය තුළ භූමි භාවිතයන්හි වැඩි ප්‍රතිශතයක් හිමි වී පවතින්නේ වනාන්තර, ළදූ කැලෑ හා නේවාසික භාවිතයන් වේ. ඒ අනුව, නගර මධ්‍යය ප්‍රදේශයේ රජරට විශ්ව විද්‍යාලය, පුරා විද්‍යා ප්‍රදේශය හා මහකනදරාව වැව පදනම් කරගත් භූ දර්ශන සැලැස්මක් සංවර්ධනය කෙරේ. ඒ අනුව,

1. රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය වැව සම්බන්ධ කරමින් පෙත් මග සංවර්ධනය කිරීම.
2. මිහින්තලය පුරා විද්‍යා ප්‍රදේශයේ භූ දර්ශන කලමනාකරණය කිරීම.
3. පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයේ මහකනදරාව වැව පාදක කරගනිමින් මිහින්තලය චෛත්‍ය නැරඹීමට ස්ථානයක් සංවර්ධනය කිරීම.
4. මුව උද්‍යානයේ භූ දර්ශන කර අලංකරණය කිරීමේ වැඩසටහන



සිතියම 18: භූ දර්ශණ ප්‍රදේශ

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

2. නගර මධ්‍ය ප්‍රදේශයේ මාර්ග අලංකරණය

නාගරික පරිසරයක පවතින කලබලකාරී ස්වභාවයෙන් සහ අපිරිසිදු හා ප්‍රියමනාප නොවන පරිසරයෙන් ඈත් වෙමින්, නගරයේ සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවටත්, නගරයේ ජීවත්වන ජනතාවටත් අවශ්‍යය නාගරික පහසුකම් සැපයීම සහ සැලසුම්ගත පිරිසිදු ආරක්ෂාකාරී නාගරික පරිසරයක් ගොඩනැගීම සඳහා වූ නගර අලංකරණ ව්‍යාපෘති ද මෙම සැලැස්මට ඇතුලත් කර ඇත.

පදික වේදිකා හා වටරවුම් සංවර්ධනය
මාර්ග දෙපස භූමි අලංකරණය
වීථි ආලෝක කරණය
මායිම් වැටවල් ඉදිකිරීම
වෙළඳ දැන්වීම් හා බැනර් ප්‍රදර්ශනය
වීථි ආසන ඉදිකිරීම

මිහින්තලය නගරයේ අනන්‍යතාවය ආරක්ෂා වන අයුරින් වටරවුම් හා පදික වේදිකා නිර්මාණය කළ යුතුය. මේ සඳහා කොන්ක්‍රීට් වෙනුවට හැකිතාක් කළුගල් උපයෝගි කරගෙන නිර්මාණාත්මක ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණවලට හා ප්‍රදේශයේ අනන්‍යතාවයට ගැළපෙන ශාක, මාර්ග දෙපස රුක් තීරුවක් ලෙස රෝපණය කිරීමත්, මෙම රුක් තීරය නගර මධ්‍ය ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන මාර්ග දෙපස රෝපණය කිරීමටත්, සැලසුම් කර ඇත. මාර්ග දෙපස මාර්ග භාවිතා කරන්නන්ගේ සුව පහසුව සඳහා වීථි ආසන ස්ථානගත කළ යුතු අතර, එහිදී කළු ගලින් කරන ලද වීථි ආසන ආදිය යොදා ගැනීම තුළින් නගරයේ ඇති පෞරාණිකත්වය ආරක්ෂා කර ගැනීම අපේක්ෂා කෙරේ. එමෙන්ම පොසොන් සමයේ අධික ජනගහනයක් පැමිණීම හේතුවෙන් පුරාවිද්‍යාත්මක වටිනාකම් සහ මෙම නගරයේ නළ ජල පහසුකම්, විදුලිය හා නවීන සන්නිවේදන පහසුකම් අනාගත අවශ්‍යතාවයන්ට සරිලන පරිදි සංවර්ධනය කිරීම ද මෙම සැලැස්මේ තවත් අරමුණක් වේ.

රූපසටහන 13: මාර්ග සංවර්ධන හරස්කඩ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය



සිතියම 19: නගර මධ්‍යය අලංකරණ උපක්‍රම

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

6.5.3 යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර 1.4 ක් අවම වශයෙන් පොදු එළිමහන් විවෘත භූමි ලෙස සංවර්ධන සැලැස්ම සැකසිමේදී වෙන් කළ යුතුය. මිහින්තලය නාගරික බල ප්‍රදේශයේ 2018 වසරට ජනගහනය 24600 ක් ලෙස සංගණන වාර්තාවේ දක්වා ඇත. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2030 වන විට 48000 ක් බවට පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට පොදු එළිමහන් විවෘත භූමි ලෙස ඉඩම් හෙක්ටයාර 54.8 අවම වශයෙන් වෙන් කළ යුතුය.

6.5.3.1 මිහින්තලය නාගරික බල ප්‍රදේශයේ වර්තමානයේ පවතින පොදු එළිමහන් විවෘත භූමි

සෘජු හා වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. සෘජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගි විය හැකි ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍යය එනම්, ක්‍රීඩා කිරීම, පිහිණීම, දිවීම, ඇවිදීම නිදසුන් ලෙස දැක්විය හැකිය.

මිහින්තලය නාගරික බල ප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයන් සපුරා ගත හැකි ස්ථාන කිහිපයක් පවතින අතර, එම ස්ථාන පිළිබඳව විස්තර වගු අංක 06 සහ 08 යටතේ සඳහන් කර ඇත.

වගුව 6: පවතින පොදු එළිමහන් හා විවෘත භූමි ප්‍රමාණය

අනු අංකය	වර්ගය	ප්‍රමාණය (හෙක්ටයාර්)
01	කුඩා උද්‍යාන (Mini Park)	4.9
02	අසල උද්‍යාන (Local Park)	4.2
	මුළු එකතුව	9.1

වගු අංක 06 හි සහ වගු අංක 08 සඳහන් තොරතුරු වලට අනුව මිහින්තලය නාගරික ප්‍රදේශය තුළ දැනට හෙක්ටයාර 9.1 ක් විවෘත භූමි ලෙස ඇත. පුරෝකථන ජනගහනය මත 2030 සඳහා යෝජිත පොදු එළිමහන් විවෘත භූමි ලෙස හෙක්ටයාර 54.8 ක් අවශ්‍ය වේ. අංක 06 වගුවට අනුව වර්තමාන ජනගහනයට ප්‍රමානවත් පොදු එළිමහන් ප්‍රදේශ මිහින්තලය නාගරික බල ප්‍රදේශයේ පිහිටා ඇත.

මිහින්තලය නාගරික බල ප්‍රදේශ සිමාව තුළ පවතින වැව් රක්ෂිත සහ නාගරික බල ප්‍රදේශය තුළ පවතින සංවර්ධනය වූ සහ සංවර්ධනය වෙමින් පවතින අවකාශයන්ට අනුව යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම වගු අංක 07 වගු අංක 09 වගු අංක 10 හි සඳහන් වේ.

වගුව 7: යෝජිත පොදු එළිමහන් හා විවෘත භූමි ප්‍රමාණය

අනු අංකය	වර්ගය	ප්‍රමාණය (හෙක්ටයාර)
01	යෝජිත කුඩා උද්‍යාන (Proposed Mini Park)	1.0
02	යෝජිත අසල උද්‍යාන (Proposed Local Park)	1.1
03	යෝජිත රේඛීය උද්‍යාන (Proposed Linear Park)	245.0
	මුළු එකතුව	247.1

6.5.3.2 උපාය මාර්ග

6.5.3.2.1 මිහින්තලය නාගරික බල ප්‍රදේශ සීමාව තුළ පවතින වැව් භූ දර්ශනය කිරීම හා ප්‍රතිසංවර්ධනය කිරීම

මේ තුළින් වැව් රක්ෂිතය ආරක්ෂා කිරීම, ප්‍රදේශයේ හරිතාවරණය වැඩිකිරීම සහ විවේක සහ විනෝද කටයුතු සඳහා පොදු විවෘත භූමියන් සේ භාවිතා කිරීම අරමුණු කෙරේ. ප්‍රධාන වශයෙන් වක්‍ර විනෝද කටයුතු සඳහා යාදා ගැනීම සුදුසු වනු ඇත.

වැව් ආශ්‍රිත ස්වභාවික පරිසරය සමග සමගාමීව ගමන් කළ හැකි විනෝද ස්ථාන ඇති කිරීම, විනෝද පහසුකම් සඳහා වෙන්වූ ස්ථාන හා කඳවුරු ගැසීම පහසුකම් ඇතුළු ව්‍යායම භූමි, මංතිරු වැනි දේ අනුමත කල හැක. තවද, නගරයේ අනෙකුත් යෝජිත උද්‍යාන ඇතිුමි භාග පොදු ජනතාවගේ විවේක පහසුකම් ලබාගැනීම සඳහා භූ දර්ශන සංකල්පයන්ට අනුව සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කෙරේ.

මෙම යෝජිත අංග ලෙස නැරඹුම් ස්ථාන, පදික මංතිරු හරිත තීරය විවේක හා විනෝද කටයුතු සඳහා ආසන සහිත වන විවෘත ප්‍රදේශ සහ රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය කිරීම දැක්විය හැක.

6.5.3.2.2 මිහින්තලය නාගරික බල ප්‍රදේශය තුළ පිහිටි ක්‍රීඩා පිටි ප්‍රතිසංවර්ධනය කිරීම

මෙහිදී සෘජු විනෝද කටයුතු මෙන්ම වක්‍ර විනෝද කටයුතු සඳහාද දැනට පවත්නා ක්‍රීඩා පිටි පහසුකම් සහිතව ප්‍රතිංවර්ධනය කිරීම අරමුණු වේ.පවතින ක්‍රීඩාංගන වල පහසුකම් වැඩිදියුණු කිරීම හා ඒවා නඩත්තු කිරීමේ ක්‍රියාපිළිවෙත් සැකසිම නිවැරැදි දිශානතියෙන් යුත් නව ක්‍රීඩාගාර, ගෘහස්ථ ක්‍රීඩාගාර සහ යටිතල පහසුකම් ගොඩනැංවීම සුදුසු බව යෝජනා කෙරේ.

6.5.3.2.3 සමාජයිය විනෝද කටයුතු පහසුකම් වැඩිදියුණු කිරීම

දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි සංචාර අවශ්‍යතා වලට ගැලපෙන ප්‍රමිතියෙන් යුතු ක්‍රීඩා සමාජ, සංචාරක හෝටල්, නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා ස්ථාපිත විය යුතු බවට මෙම සැලැස්ම මගින් යෝජනා කරනු ලැබේ.

6.5.3.2.4 සංචාරක හා වන්දනා පහසුකම් වැඩිදියුණු කිරීම

මිහින්තලය ආගමික සහ පුරා විද්‍යා බල ප්‍රදේශයෙහි දේශීය සහ විදේශීය සංචාරක කර්මාන්තයේ දියුණුවට හේතු වන්නාවූ පොදු රථවාහන පහසුකම්, සැලසුම්ගතව සංවර්ධනය කිරීම සහ නවාතැන් බඩු බාහිරාදිය, ආහාරපාන වාහන සහ උපකරණ වැනි පහසුකම් ලබාගැනීමේ ස්ථාන සුලභ කල යුතුය.

උසස් ප්‍රමිතියෙන් යුතු සෞඛ්‍ය මධ්‍යස්ථාන, ආයුර්වේද මධ්‍යස්ථාන සහිත නිවාඩු නිකේතන ස්ථාපිත කර සංවර්ධනය කිරීමටද යෝජනා කෙරේ.

දේශීය සංචාරකයින්ට හා වන්දනාකරුවන්ට නොමිලේ හෝ පහසු මිලට නවාතැන් පහසුකම් සපයන විශ්‍රාම ශාලා වැනි දෑ ආගමික ස්ථානයන්හි ඇති කිරීම, දේශීය විදේශීය සංචාරකයින්ට පාරිසරික අධ්‍යයනයන් සහ පුරා විද්‍යා අධ්‍යයන්ට පැමිණෙන ගවේශකයන්හට අවශ්‍ය සහ ප්‍රයෝජනවත් ආකර්ශණීය ස්ථාන සංවර්ධනය, ඔවුන්ගේ දීර්ඝ කාලීන රැඳීම් වලට හේතු වන බව බැවින්, ඒවාට අදාල අනෙකුත් සෘජු හා වක්‍ර පහසුකම් විශේෂයෙන් සංචාරක බංගලා හෝටල් වැනි දෑ හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම මෙන්ම විශේෂයෙන්ම මිහින්තලය ප්‍රධාන වැව් ආශ්‍රිතව මේ සඳහා අවශ්‍ය පහසුකම් සහිතව වැඩිදියුණු කිරීමටද යෝජනා කෙරේ.

6.5.3.2.5 රුක් තීරු

ප්‍රධාන මාර්ග දෙපස ඇති ඉඩ පරිමාණයන්ට ගැලපෙන ශාක විශේෂ රුක් රෝපනයට හඳුනාගෙන මේ සඳහා යොදාගත හැක. නගරය කලාප කර එක් එක් කලාපයට අනන්‍යතාවය ලැබෙන සේ විවිධ ශාක වර්ග තෝරා ජෛව විවිධත්වය කැපි පෙනෙන පරිදි රුක්රෝපණය කිරීම නගර අලංකරණයට හේතු වේ. රුක්රෝපණය සඳහා සුදුසු ශාක වර්ග පහත පරිදි දැක්විය හැකිය. එසේම රුක් රෝපනය කල හැකි මාර්ගයන් පහත පරිදි වේ.

මාර්ග සංවර්ධන කටයුතු වලදි නගර සංවර්ධන සංකල්ප අනුව විධිමත් භූ දර්ශන සැලසුම් තෝරාගෙන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය.

රුක්රෝපනය කල හැකි මාර්ගයන්

01. නුවර - යාපනය මාර්ගය
02 පුත්තලම, අනුරාධපුර - ත්‍රිකුණාමල මාර්ගය

රුක්රෝපණය සඳහා සුදුසු ශාක වර්ග

විශාල ශාක

01 සියඹලා	Temarindus indicus
02 ගල් සියඹලා	Dialium avoideum
03 කටු ඉඹුල්	Bombax ceiba
04 මූණ මල්	Mimosups elengi
05 වල් ඇහැළ	Pterocarpus indicus
06 සියඹලා	Temarindus indicus
07 වා	Cassia siamea
08 තෙලඹු	Sterculia foetida
09 හල්මිල්ල	Berrya cordifilia

මධ්‍ය ප්‍රමාණයේ ශාක

01 කොහොඹ	Azadirachra indica
02 ඇහැළ	Cassina glauca
03 මාර	Albizia lebbeck
04 ගස් කෑල	Butea mosperma
05 මඟුල් කරඳ	Pongania pinnata
06 රතු වා	Cassia roxburghii
07 බක් මී	Nauclea orientalis
08 ඇත් දෙමට	Gmelina arborea
09 නෙරලු	Cassine glauca

10 එරබදු	Erythrina variegta

කුඩා ප්‍රමාණයේ ශාක

01 මයිල	Bauhinia tomentosa
02 අහු	Morinda tinctoria
03 කිනිහිරියා	Cochlospermum religiosum
04 ලෝලු	Cordia dichroma
05 බෙලි	Aegle marmelos
06 මයිල	Bauhinia racemosa
07 කොබෝලීල	Baohinia variegata
08 අශෝක	Saraca indica
09 බෙලිපට්ටා	Hibiscus tiliceus
10 නෙල්ලි	Phyllanthus acidus

6.5.3.3 අරමුණු

නාගරික පරිසරය තුල උෂ්ණත්වය අඩු කිරිමට ශාක මගින් සපයන හරිත ආවරණ සහ විවෘත භූමි ප්‍රදේශ ඉවහල් වේ.

i. ගොඩනැගිලි පරිසර හිතකාමී ලෙස ඉදිකිරීම් සඳහා නීල හරිත ශ්‍රී ලංකා රාජ්‍ය හරිත ගොඩනැගිලි සංකල්පය (රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ගොඩනැගිලි සඳහා) ක්‍රියාත්මක කිරීම.

ii. ගස් සහ වෘක්ෂලතා සිටවීම මගින් නගරයේ සහ අවට ප්‍රදේශ වල හරිත ආවරණය වැඩි කිරීම.

iii. හරිත පියලි (Green Roof) ක්‍රමය හඳුනවා දීම.

iv. හරිත පියලි තුල ජල විහිදුම්ක්‍රම ක්‍රියාත්මක කිරීම.

v. ගොඩනැගිලි සඳහා ලා පැහැති වර්ණ හඳුන්වා දීම.

vi. රථවාහන ගාල් කරන ස්ථාන සඳහා හරිත නැවතුම් පලවල් (Green Parking lots) හඳුන්වා දීම (ගස් ආවරණය සහිත)

vii. බිම් ඇතිරුම් (paving) භාවිතය අවම කල යුතු අතර අවශ්‍යම අවසථාවලදි පමණක් ලා වර්ණ යොදාගැනීම.

viii. ජලය පොලොවට උරාගත හැකි බිම් ඇතිරුම් (paving) වර්ග යොදාගැනීම.

ix. විවෘත භූමි, උද්‍යානය සඳහා වැඩි ඉඩ ප්‍රමාණයක් වෙන් කිරීම.

x. පරිසරය සංවේදි ප්‍රදේශ සංරක්ෂණය කිරීම මගින් හෝ අනුමත භාවිතයන් යොදා ගනිමින් තිරසාර ලෙස සංවර්ධනය කිරීම.

6.5.3.4 ක්‍රමවේදය (Strategies)

1) සියළුම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ගොඩනැගිලි " නීල හරිත ශ්‍රී ලංකා " ජාතික ගොඩනැගිල හරිතකරණ ක්‍රම වේදය අනුව සිදු කිරීම.

2) සියළුම කාර්යාලය සහ නිවාස ඉදිකිරීමේදි වහල මත පියසි ඉදිකිරීම සහ හරිත පියසි තුල ජල විහිදුම් ක්‍රම (Water sprinkler) භාවිතයට යොමු කිරීම.

3) ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදි ලා වර්ණ පිළිබඳව දැනුවත් කිරීම.

4) යෝජිත සියළුම වාහන නැවතුම්පලවල් සඳහා හරිත නැවතුම් සංකල්පය හඳුන්වාදීම සහ පවතින වාහන නැවතුම්පලවල හරිත නැවතුම්පලවල් ලෙස ගස් ආරණය සහ බිම් ඇතුරුම් සහිතව ප්‍රතිසංවර්ධනය කිරීම.

5) බිම් ඇතුරුම් ක්‍රමය ජලය පොළොවට උරාගන්නා ක්‍රම වේදයන්ට පමණක් සීමා කිරීම (Interlocking) සහ එයද ලා වර්ණයන්ට පමණක් සීමා කිරීම.

6) පවතින ක්‍රීඩාභූමි , උද්‍යාන සහ විවෘත භූමි නඩත්තු කිරීම සහ යෝජිත විවෘත භූමි හරිත සංකල්පයන් මුලික කොට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

7) සිරස් භූ දර්ශන කටයුතු (Vertical Garden) සඳහා උනන්දු කරවීම.

8) මං මාවත් දෙපස , රථ ගාල් සඳහා තිරසාර නාගරික ජලාපවහන (Sustainable Urban Drainage) ක්‍රමවේදය හඳුන්වාදීම.

6.5.3.5 මිහින්තලය නාගරික බල ප්‍රදේශය පවතින පොදු එළිමහන් අවකාශීය සැලැස්ම

වගුව 8: හඳුනාගත් පවතින එළිමහන් ස්ථාන

අනු අංකය	වර්ගය	ප්‍රමාණය (හෙක්ටයාර)	වර්තමාන භාවිතය	ග්‍රාම නිලධාරි කොට්ඨාශය
	කුඩා උද්‍යාන (Mini Park)			
01	EPP_1	0.5	කුඩා උද්‍යාන	මහකනදරාව - යාය 03
02	EPP_2	0.6	කුඩා උද්‍යාන	මහකනදරාව - යාය 02
03	EPP_3	0.2	කුඩා උද්‍යාන	මිහින්තලය
04	EMP_1	0.9	කුඩා උද්‍යාන	මිහින්තලය
05	EMP_2	0.7	කුඩා උද්‍යාන	කුරුන්දන්කුලම
06	EMP_3	0.3	කුඩා උද්‍යාන	නුවරවැව
07	EMP_4	0.8	කුඩා උද්‍යාන	හේනවත්ත
08	EMP_5	0.9	කුඩා උද්‍යාන	කන්නට්ටිය
	එකතුව	**4.9**		
	අසල උද්‍යාන (Local Park)			
09	EMP_1	1.1	ක්‍රීඩාපිටි	බෝගහයාය
10	EMP_2	1.8	ක්‍රීඩාපිටි	මිහින්තලය
11	EMP_3	1.3	ක්‍රීඩාපිටි	රුවන්ගම
	එකතුව	**4.2**		
	මුළු එකතුව	**9.1**		

6.5.3.6 මිහින්තලය නාගරික බල ප්‍රදේශය සඳහා යොජිත පොදු එළිමහන් අවකාශීය සැලැස්ම

වගුව 9: හඳුනාගත් යෝජිත එළිමහන් ස්ථාන

අනු අංකය	වර්ගය	ප්‍රමාණය (හෙක්ටයාර)	වර්තමාන භාවිතය	ග්‍රාම නිලධාරි කොට්ඨාශය
	යෝජිත ඉතා කුඩා උද්‍යානය (Proposed Pocket Park)			
01	PMP_1	0.1	කුඩා උද්‍යානය	මරදන්කුලම
02	PMP_2	0.2	කුඩා උද්‍යානය	රුවන්ගම
	එකතුව			
	යෝජිත අසල උද්‍යාන (Proposed Local Park)			
03	PLP_1	0.1	අසල උද්‍යානය	මහකනදරාව යාය 03
	එකතුව			
	යෝජිත රේඛීය උද්‍යාන (Proposed Linear Parks (PLiP)			
04	$PLiP_1$	0.6	රේඛීය උද්‍යානය	මිහින්තලය (මිහින්තලය ජලාශය)
05	$PLiP_2$	0.2	රේඛීය උද්‍යානය	නාමල් වැව (නාමල්වැව ජලාශය)
06	$PLiP_3$	0.2	රේඛීය උද්‍යානය	නාමල්වැව (ඉහලමඩුව වැව)
07	$PLiP_4$ කුඩා වැව් රක්ෂිත මීටර් 20	31.0	රේඛීය උද්‍යානය	උද්‍යාන
08	$PLiP_4$	70.0	රේඛීය උද්‍යානය	

	මධ්‍යම ප්‍රමාණයේ වැව් රක්ෂිත මීටර් 20			
12	PLiP 4 (විශාල පරිමාණයේ වැව් රක්ෂිත මීටර් 100 - මහකනදරාව)	143.0	රේඛීය උද්‍යානය	
	එකතුව	**245.0**		
	මුළු එකතුව	**247.1**		

6.5.3.7 පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම අනුමත භාවිතයන්

වගුව 10: යෝජිත එළිමහන් ස්ථාන සඳහා හඳුනාගත් භාවිතයන්

අංකය	උද්‍යාන වර්ගය	ප්‍රමාණය	අනුමත භාවිතයන්
01	කුඩා උද්‍යානය	හෙක්ටයාර 0.2-1.0 අතර (අක්කර 0.5-25)	• ළමුන් සඳහා වෙන් වූ ක්‍රීඩා පිටියක් • කුඩා ක්‍රීඩා පිටි • රේඛීය වන උද්‍යානය • විවේක උද්‍යානය
02	අසල උද්‍යානය	හෙක්ටයාර 10-30 අඩු (අක්කර 2.5-7.5)	• පාපන්දු ක්‍රීඩාංගනයක් සමඟ ළමා උද්‍යානය • විවේක ගත හැකි අවධිමත් ස්ථාන • කුඩා වන උද්‍යානය • පුහුණු ධාවන පත
03	රේඛීය උද්‍යානය	පවතින ඔය /ඇල/ වැව රක්ෂිත අනුව රේඛීය උද්‍යාන කෙරේ.	• ඇවිදීමට • ව්‍යායාම කිරීමට බයිසිකල් පැදීමට • ස්වාභාවික මංතීරු

සිතියම 20: පොදු එළිමහන් විවෘත භූමි හා විනෝදාස්වාද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

6.6 සංස්කෘතික හා උරුමයන් කළමනාකරණය කිරීමේ උපාය මාර්ග

ථේරවාදී බුදුදහම ශ්‍රී ලංකාද්වීපය තුළ ප්‍රචාරණයෙහිලා උපස්ථම්භක වූ ප්‍රථම නගරය ලෙස සැලකෙන්නේ මිහින්තලයයි. එය ශ්‍රී ලාංකේය බෞද්ධ ශිෂ්ටාචාරයේ සමාරම්භය සනිටුහන් කරන ඓතිහාසික ස්ථානය ද වේ. ශෛලමය ආරාම සංකීර්ණ, භාවනා කුටි, විහාර ගෙවල්, ශෛලමය ජල තටාක දේශීය වෛද්‍ය ක්‍රම සහිත කුටි පුරා විද්‍යා ප්‍රදේශය පුරා විසිර පැවතීම මෙම ස්ථානයේ ඇති පුරා විද්‍යාත්මක විශේෂත්වයයි. වර්ෂ 1000 කට අධික කාලයක් එනම්, ආසන්න වශයෙන් බු.ව. 1 සිට බු.ව. 1002 සියවස දක්වා ශ්‍රී ලංකාවේ රාජධානිය වූ අනුරාධපුර නගරයේ සිට කිලෝ මීටර් 13.0 ක පමණ දුරින් පිහිටීම ද මිහින්තලය, ඓතිහාසික නගරයේ පුරාවිද්‍යාත්මක වටිනාකම තවදුරටත් වර්ධනය වීමට හේතු සාධකයකි. සංස්කෘතික හා උරුමයන් කළමනාකරණය කිරීමේ උපක්‍රම ලෙස මිහින්තලය සැලසුම් බල ප්‍රදේශය තුළ මෙම සංස්කෘතික උරුමයන් පහත පරිදි සංවර්ධන සැලසුමට ඇතුළත් කරගනිමින් සංවර්ධනය සඳහා යොදවා ගත හැකිය.

1. ආර්ථික සංවර්ධනය සඳහා වක්‍රාකාරව යොමු කර ගැනීම.
2. පුරා විද්‍යාත්මක අංග සංරක්ෂණය කිරීම.
3. භූ දර්ශන අලංකරණය කිරීම.
4. බැතිමතුන්ට අවශ්‍ය පහසුකම් සැලසීම.

එහිදී ප්‍රධාන වශයෙන්ම සංස්කෘතික උල්පතේ නේවාසික උද්‍යානය යන දැක්ම අනුව මෙම උරුමයන් හා සංස්කෘතික ලක්ෂණ කළමනාකරණය කිරීමේ උපක්‍රම හඳුනාගෙන ඇත. එමෙන්ම වසර 2030 වන විට සැලසුම් ප්‍රදේශය තුළ වාණිජ හා සංචාරක භූමි භාවිතයන් 1.5 % ක් දක්වා ඉහළ දැමීමේ පරමාර්ථය මත පදනම්ව මිහින්තලය නගරයේ පුරාවිද්‍යාත්මක වටිනාකම සුරැකෙන ලෙස එය ප්‍රවර්ධනය කරන වැඩපිළිවෙලක් සැකසිම කළයුතු ය. එහිදී මිහින්තලය අනන්‍යතාවය ලොවට විදහාපාන පුළුල් සංචාරක හා සංවර්ධන ව්‍යාපෘතියක් ලෙසද හැඳින්වීම යෝග්‍ය වන අතර මිහින්තලයට පැමිණෙන දේශීය, විදේශිය බැතිමතුන් හා සංචාරකයින්ට අවශ්‍ය තොරතුරු හා පර්යේෂණ පහසුකම් සැපයිම මෙමගින් අරමුණු කෙරේ. ඒ යටතේ පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන ඇත.

1. මාර්ගෝපදේශ සපයන ප්‍රදර්ශන පුවරු සවි කිරීම.

සම්මත ආකෘතියකට හා සැලැස්මකට අනුව සකසන ලද නාම පුවරු මහනුවර - යාපනය මාර්ගය හා පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ග හමුවන මංසන්ධියේ, පියගැටපෙළෙ හි ආරම්භක ස්ථානය වන කඳුපාමුල ප්‍රදේශය හා මහනුවර - යාපනය මාර්ගයෙන් මැද මළුව වෙත වාහන වලින් පිවිසෙන ස්ථානය යන ස්ථාන වල සවි කිරීම සුදුසු බව හඳුනාග්නා ලදි. එසේම පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයෙන් පූජාභූමි ප්‍රදේශයට පිවිසෙන මාර්ග බෙදුම් ස්ථානයේ ඓතිහාසික විස්තර සහිත පුවරුවක අවශ්‍යතාවයද ඇත.

01. පූජාභූමි ප්‍රදේශයට ඇතුල්වන ස්ථානයේ වාහල්කඩක් ඉදිකිරීම.
02. විදුලි පහන් ඉදිකිරීම හා මාර්ග දෙපස අලංකරණය.

2. පුරා විද්‍යා ප්‍රදේශය තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

සංචාරක මධ්‍යස්ථානයක් ලෙස මිහින්තලය ප්‍රවර්ධනය කරන්නේ නම් ඒ සඳහා සංචාරකයින්ට අවශ්‍ය යටිතල පහසුකම්ද සම්පාදනය කළ යුතුය. විශේෂයෙන්ම බැතිමතුන්ට ආගමික වතාවන් සඳහා අවශ්‍ය පහසුකම්, ගිමන්හල් සහ අනෙකුත් මූළික අවශ්‍යතා සම්පාදනය මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ යටතේ පහත සඳහන් පහසුකම් සැපයිය යුතුය.

01. විවේකස්ථාන
02 වාහන නැවතුම් ස්ථාන

3. බුදුදහම අධ්‍යයනය කළ හැකි බෞද්ධ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

මිහින්තලය ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථානයක් වුවද එයට ගැළපෙන ආකාරයේ පර්යේෂණ මධ්‍යස්ථානයක් මෙතෙක් ස්ථාපිත වී නොමැත. එවැනි පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, ථේරවාදී බුදුදහම පිළිබඳ පර්යේෂණය කරන්නන්ට, භාවනා යෝගින්ට මෙන්ම, ප්‍රායෝගික පර්යේෂකයින් සඳහා මහඟු පිටුවහලක් වන අතර, එය මිහින්තලයේ ඓතිහාසික වටිනාකම විද්‍යාමාන කරන්නකි. මෙම බෞද්ධ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා කළුදිය පොකුණ ආශ්‍රිතව ස්වභාවික වනාන්තර ප්‍රදේශය හඳුනාගෙන ඇති අතර, එහිදී සම්පත් දායකයින් සඳහා අවශ්‍ය වන පහසුකම්ද සම්පාදනය කෙරේ. මේ සඳහා අවශ්‍ය සැලසුම් කටයුතු බුද්ධශාසන අමාත්‍යාංශය හා විශ්ව විද්‍යාලය ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන අතර, මිහින්තලය ප්‍රදේශයෙන් සුදුසු භූමියක් සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගනිමින් පහත ක්ෂේත්‍රය අවරණය වන පරිදි ව්‍යාපෘතියක් යෝජනා කර ඇත.

01. අන්තර්ජාල පහසුකම් සහිත පුරාවිද්‍යා පර්යේෂණ අංශයන්, ප්‍රකාශන හා පුස්තකාල කටයුතු පිළිබඳ

02. භාවනා කටයුතු සඳහා (පරිසර අලංකරණය සහිත අපරව්‍යුහ පහසුකම් සම්පූර්ණ කරන ලද නිදහස් ප්‍රදේශයක් ලබා දීම)

සිතියම 21: පුරා විද්‍යා ප්‍රදේශ සංවර්ධනය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

6.7 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

6.7.1 ව්‍යාපෘති ප්‍රමුඛතාවය

මිහින්තලය නගර සංවර්ධන සැලැස්ම වසර 2030 දක්වා ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගත් ව්‍යාපෘති අනුපිළිවෙල පහත පරිදි දැක්විය හැකිය.

1. පා පැදි මංතීරු නිර්මාණය
2. අඹතලාගම බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම
3. රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය වැව සම්බන්ධ කරමින් පෙත් මග සංවර්ධනය කිරීම්
4. ශාක රෝපනය කිරීම, වට රවුම් නිර්මාණය, ආසන නිර්මාණය
5. ඇවිදීමේ මංතීරුවක් නිර්මාණය කිරීම.
6. පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයේ මහකනදරාව වැව පාදක කරගනිමින් මිහින්තලය චෛත්‍ය නැරඹීමට ස්ථානය සංවර්ධනය කිරීම.
7. මිහින්තලය රෝහල අඹතලාගම මංසන්ධියට රැගෙන යාම (ආයතනික සැලැස්ම පරිහරණය කරන්න)
8. බෞද්ධ මධ්‍යස්ථානයක් පිහිටු වීම.
9. ඝන අපද්‍රව්‍ය කලමනාකරණ ව්‍යාපෘතිය
10. අභ්‍යන්තර මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
11. අනුස්මරනීය වියලි කලාපීය උද්භිත උද්‍යානය
12. මිහින්තලය වැව ආශ්‍රිත පරිසරය හා භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘතිය
13. ස්වස්ථතාව (වෛද්‍යකර්මවල ක්‍රමික විකාශය) පිළිබඳ ජන කෞතුකාගාරය.
14. යෝජිත ජල සැපයුම් සැලසුම ක්‍රියාත්මක කිරීම (ආයතනික සැලැස්ම පරිහරණය කරන්න)
15. මාර්ග සංවර්ධනය (ආයතනික සැලැස්ම පරිහරණය කරන්න)
    i. ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ වන නේවාසික මාර්ග ප්‍රතිසංවර්ධනය කිරීම.
    ii. මහනුවර - යාපනය ප්‍රධාන මාර්ගය සඳහා විකල්ප මාර්ගයක් සංවර්ධනය කිරීම්
16. රජරට විශ්ව විද්‍යාලය තුළ සංවර්ධන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම (ආයතනික සැලැස්ම පරිහරණය කරන්න)

17. වාහන නැවතුම් ස්ථාන නිර්මාණය

18. රැක්රෝපණ ව්‍යාපෘතිය

19. වියළි කලාපිය හරිත උද්‍යානය

20. මිහින්තලය පුරා විද්‍යා ප්‍රදේශයේ භූ දර්ශන කලමනාකරණය කිරීම.

21. පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයේ මහකනදරාව වැව පාදක කරගනිමින් මිහින්තලය චෛත්‍ය නැරඹීමට

22. මුව උද්‍යානයේ භූ දර්ශන කර අලංකරණය කිරීමේ වැඩසටහන

23. මාර්ග අලංකරණය

i පදික වේදිකා හා වටරවුම් සංවර්ධනය

ii. මාර්ග දෙපස භූමි අලංකරණය

iii. වීථි ආලෝක කරණය

iv. මායිම් වැටවල් ඉදිකිරීම

v. දැන්වීම් හා බැනර් ප්‍රදර්ශනය

vi. වීථි ආසන ඉදිකිරීම

24. විද්‍යාලවලට අදාල පොදු ගැටළු වන ගොඩනැගිලි ගැටළු, ක්‍රීඩා පිටි වල පවතින ගැටළු (ආයතනික සැලැස්ම පරිහරණය කරන්න)

25. බෞද්ධ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම. (ආයතනික සැලැස්ම පරිහරණය කරන්න)



6.7.2 උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති

1. පාපැදි මංතීරුවක් නිර්මාණය කිරීම

ව්‍යාපෘතියේ නම	පාපැදි මංතීරුවක් නිර්මාණය කිරීම
ව්‍යාපෘති යෝජනාව	සංචාරක සේවාවන් වැඩිදියුණු කිරීම

ව්‍යාපෘති පිහිටි ස්ථානය

පිහිටි ස්ථානය	පළාත	උතුරු මැද	දිස්ත්‍රික්කය	අනුරාධපුර
	ප්‍රාදේශී ලේකම් කොට්ඨාශය	මිහින්තලය	පලාත් පාලන ආයතනය	මිහින්තලය ප්‍රාදේශීය සභාව
මායිම්	උතුර	නැගෙනහිර	දකුණ	බටහිර
	A 12	A 9		
ප්‍රවේශය	යාපනය - මහනුවර ප්‍රධාන මාර්ගය, පුත්තලම - ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගය			
ස්ථානීය සැලැස්ම				
යාබඳ ඉඩම භාවිතය	රජයේ ආයතන, නේවාසික ප්‍රදේශ, පෞද්ගලික ඉඩම්			

ව්‍යාපෘතියේ අවශ්‍යතාවය

ව්‍යාපෘති වර්ගය	නව	√	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම	ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂණය	වාණිජ	භූමි අලංකරණ හා විනෝද ක්‍රියා	උරුමය	නිවාස	නැවත පදිංචි කිරීම	අපරව්‍යුහ පහසුකම්
			√				
ව්‍යාපෘති අංශය	පාරිසරික	√	ආර්ථිකය	√		සාමාජීය	

ව්‍යාපෘතියේ අරමුණ	සංචාරක ආකර්ෂණය වැඩිදියුණු කිරීම ආර්ථික සංවර්ධන අවස්ථා ඇති කිරීම
ව්‍යාපෘතියේ පදනම	මිහින්තලය නගරය සඳහා වර්තමානය වන විට සංචාරකයන් පැමිණෙන්ගේ අනුරාධපුර නගරයට පැමිණීමෙන් පසුවය. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ එසේ පැමිණෙන සංචාරකයන් හට විනෝදාස්වාදසය ප්‍රමුඛ අත්දැකීමක් සමග සංචාරයට අවස්ථාවක් ලබාදීම.

දේපල පිළිබඳ විස්තරය

වර්තමාන ඉඩම් අයිතිය	පුද්ගලික	√		රජයේ	√	වෙනත්		
අවහිරතා වලින් නිදහස් බව	ඔව්	√	නැත		නැත නම් විස්තරය	රජයේ හා පෞද්ගලික ඉඩම් පවතී.		
අයිතිය පිළිබඳ විස්තරය	පොදු අවකාශ තුළ සංවර්ධනය කිරීමට නියමිතය.							
මිනින්දෝරු සැළැස්ම පිළිබඳ විස්තරය	මිනින්දෝරු සැළැස්මේ අංකය	මිනින්දෝරු තැනගේ නම		දිනය	ඉඩම් ප්‍රමාණය			
					අක්:	රූඩ්:	පර්.	

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘති කාලය	කෙටි කාලින (1 අවුරුදු)	√	මධ්‍ය කාලින (1-3 අවුරුදු)		දීර්ඝ කාලීන (3 අවුරුදු)		සම්පූර්ණ ඇස්තමේන්තු ගත වියදම	
මුදල් යෙදවීමේ ක්‍රමය	භාණ්ඩාගාර ප්‍රතිපාදන							

ව්‍යාපෘති පිළිබඳ විස්තරය (සිතියම් සමඟ)	දුම්රිය මංසන්ධියේ සිට මිහින්තලය පුරා විද්‍යා ප්‍රදේශය දක්වා A12 මාර්ගයට සමාන්තරව මෙම නව පාපැදි මංතීරුව නිර්මාණය කිරීමට යෝජනා කෙරේ. 					
කලාපය	සක්‍රිය කලාපය	කලාපීකරන රෙගුලාසි වලට අනුකූලව	ඔව්	√	නැත	

වර්තමාන තත්ත්වය

නිවාස රාජ්‍ය ආයතන මහා මාර්ග ආශ්‍රිත සුළු පරිමාණ වාණිජ භාවිතයන්



යෝජිත ව්‍යාපෘතින්

1 පාපැදි මංතිරුව

2. අඹතලාගම බහුකාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරීම

ව්‍යාපෘතියේ නම	අඹතලාගම බහුකාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරීම
ව්‍යාපෘති යෝජනාව	වාණිජ ප්‍රදේශයන් සංවර්ධනය කිරීම

ව්‍යාපෘති පිහිටි ස්ථානය

පිහිටි ස්ථානය	**පළාත**	උතුරු මැද	**දිස්ත්‍රික්කය**	අනුරාධපුර
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මිහින්තලය	**පලාත් පාලන ආයතනය**	මිහින්තලය
මායිම්	**උතුර**	**නැගෙනහිර**	**දකුණ**	**බටහිර**
	ළඟු කැළෑ	ළඟු කැළෑ	A 12	ළඟු කැළෑ
ප්‍රවේශය	A 12 ප්‍රධාන මාර්ගය හා A9 ප්‍රධාන මාර්ගය ඔස්සේ			
ස්ථානීය සැලැස්ම	 			
යාබද ඉඩම භාවිතය	ළඟු කැළෑ ප්‍රදේශ හා නේවාසික ඉඩම් හා රජයේ ඉඩම්			

ව්‍යාපෘතියේ අවශ්‍යතාවය

ව්‍යාපෘති වර්ගය	නව	√	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂණය	වාණිජ	භූමි අලංකරණ හා විනෝද ක්‍රියා		උරුමය	නිවාස	නැවත පදිංචි කිරීම	අපරව්‍යුහ පහසුකම්
		√						√
ව්‍යාපෘති අංශය	පාරිසරික		ආර්ථිකය		√		සාමාජීය	

ව්‍යාපෘතියේ අරමුණ	මිහින්තලය නාගරික ප්‍රදේශයේ පවතින ඉඩම් සංවර්ධනය කිරීම, රජයේ ආයතන, විශ්ව විද්‍යාල ප්‍රදේශය ඒකාබද්ධ කරමින් නව වාණිජ ප්‍රදේශයක් ගොඩනැංවීම
ව්‍යාපෘතියේ පදනම	මිහින්තලය නගරය ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වනුයේ එක් කාලසිමාවක් තුළ වන නිසා එම තත්ත්වය මගහරවා ගනිමින්, විශ්ව විද්‍යාල සිසුන් හා සේවා පහසුකම් ලබාගැනීම සඳහා පැමිණෙන පිරිස් ඉලක්ක කරමින් නව වාණිජ මධ්‍යස්ථානයක් ඉදිකිරීම.

දේපල පිළිබඳ විස්තරය

වර්තමාන ඉඩම් අයිතිය	පුද්ගලික			රජයේ	√	වෙනත්	
අවහිරතා වලින් නිදහස් බව	ඔව්	√	නැත		නැත නම් විස්තරය	රජයේ හා පෞද්ගලික ඉඩම් පවතී.	
අයිතිය පිළිබඳ විස්තරය	ප්‍රාදේශීය ලේකම්වරයා සතු ඉඩම් හා යාබදව දුම්රිය ස්ථානය පිහිටා ඇත.						

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘති කාලය	කෙටි කාලින (1 අවුරුදු)		මධ්‍ය කාලින (1-3 අවුරුදු)	√	දීර්ඝ කාලීන (3 අවුරුදු)		සම්පූර්ණ ඇස්තමේන්තු ගත වියදම	
මුදල් යෙදවීමේ ක්‍රමය	භාණ්ඩාගාර ප්‍රතිපාදන							

ව්‍යාපෘති පිළිබඳ විස්තරය (සිතියම් සමඟ)	අඹතලාගම ප්‍රදේශය නව වාණිජ මධ්‍යස්ථානයක් හා රජරට විශ්ව විද්‍යාලය ඒකාබද්ධ ලෙස සංවර්ධනය කිරීම මෙමගින් බලාපොරොත්තු වේ.  					
කලාපය	සක්‍රිය කලාපය	කලාපීකරන රෙගුලාසි වලට අනුකූලව	ඔව්	√	නැත	

වර්තමාන තත්ත්වය



යෝජිත ව්‍යාපෘතින්

1 තොරතුරු මධ්‍යස්ථානය

2 ආහාර අළෙවි ස්ථාන (දේශීය)

3 පොත් / පාසැල් උපකරණ / අධ්‍යාපන උපකරණ අළෙවි ස්ථාන

4 ඇඳුම් සාප්පු

5 ඉලෙක්ට්‍රෝනික උපකරණ ස්ථාන

3. රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය වැව, පුරා විද්‍යා ප්‍රදේශය හූ දර්ශන කළමනාකරණය

ව්‍යාපෘතියේ නම	රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය වැව, පුරා විද්‍යා ප්‍රදේශය හූ දර්ශන කළමනාකරණය
ව්‍යාපෘති යෝජනාව	නාගරික අලංකරණය තුළින් නාගරික වැසියන් හට සේවා සැපයීම

ව්‍යාපෘති පිහිටි ස්ථානය

පිහිටි ස්ථානය	පළාත	උතුරු මැද	දිස්ත්‍රික්කය	අනුරාධපුර
	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මිහින්තලය	පලාත් පාලන ආයතනය	මිහින්තලය ප්‍රාදේශීය සභාව
මායිම්	උතුර	නැගෙනහිර	දකුණ	බටහිර
	රජරට විශ්ව විද්‍යාලය	A9 මාර්ගය	A12 මාර්ගය/ වාණිජ	රජරට විශ්ව විද්‍යාලය
ප්‍රවේශය	යාපනය - මහනුවර මාර්ගය හා පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය			
ස්ථානීය සැලැස්ම				
යාබඳ ඉඩම භාවිතය	වැව වටා විශ්ව විද්‍යාල භූමිය පිහිටා ඇති අතර, නගරයේ වාණිජ ඉඩම් දකුණු දෙසින් ඇත.			

ව්‍යාපෘතියේ අවශ්‍යතාවය

ව්‍යාපෘති වර්ගය	නව	√	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂණය	වාණිජ	භූමි අලංකරණ හා විනෝද ක්‍රියා		උරුමය	නිවාස	නැවත පදිංචි කිරීම	අපරව්‍යුහ පහසුකම්
			√					
ව්‍යාපෘති අංශය	පාරිසරික	√	ආර්ථිකය		√		සාමාජීය	

ව්‍යාපෘතියේ අරමුණ	මිහින්තලය වැව හා රජරට විශ්ව විද්‍යාලය මෙන්ම, පුරා විද්‍යා ප්‍රදේශය එකිනෙක ආසන්නයේ පිහිටා ඇති අතර, මෙම ප්‍රදේශ අතර, භූමි අලංකරණය හා පෙත්මග සංවර්ධනය කිරීම තුළින් එම ප්‍රදේශ අතර, පදික ගමනාගමනය සංවර්ධනය කිරීමත්, ඇවිදීම සඳහා සුදුසු නගර ප්‍රදේශයක් ගොඩ නැගීමටත් අරමුණ වේ.
ව්‍යාපෘතියේ පදනම	විශේෂයෙන්ම පොසොන් පොහොය සමයේ ඇතිවන තදබදකාරී තත්ත්වය මෙන්ම, රජරට විශ්ව විද්‍යාලය නගරයේ ආර්ථිකයට දායක කර ගැ නීම සඳහා මෙම පෙත්මඟ සංවර්ධනය කරනු ලැබේ. එය මිහින්තලය වැව ආශ්‍රිත පහසුකම් දියුණු කිරීමේ ව්‍යාපෘතිය හා සමගාමීව සංවර්ධනය කෙරේ.

දේපල පිළිබඳ විස්තරය

වර්තමාන ඉඩම් අයිතිය	පුද්ගලික			රජයේ	පුරා විද්‍යා/අධ්‍යාපන	වෙනත්	
අවහිරතා වලින් නිදහස් බව	ඔව්	√	නැත		නැත නම් විස්තරය	රජයේ හා පෞද්ගලික ඉඩම් පවතී.	
අයිතිය පිළිබඳ විස්තරය	රජයේ ඉඩම් වන අතර, පොදු පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පමණක් මෙම ව්‍යාපෘතිය යොදා ගැනේ.						

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘති කාලය	කෙටි කාලින (1 අවුරුදු)	√	මධ්‍ය කාලින (1-3 අවුරුදු)		දීර්ඝ කාලීන (3අවුරුදු)		සම්පූර්ණ ඇස්තමේන්තු ගත වියදම	
මුදල් යෙදවීමේ ක්‍රමය	භාණ්ඩාගාර ප්‍රතිපාදන							

ව්‍යාපෘති පිළිබඳ විස්තරය (සිතියම් සමඟ)	 					
කලාපය	සක්‍රිය කලාපය	කලාපීකරන රෙගුලාසි වලට අනුකූලව	ඔව්	√	නැත	

ඉතිහාසය

